ශ්‍රී ලඞ්කාධීශ්වර පස්වැනි කාශ්‍යප මහරජාණන්

විසින් විරචිත

# ධම්පියා අටුවා ගැටපදය.

ශාස්ත්‍රාචාර්ය්‍ය

## ඩී. බී. ජයතිලක මහතාණන්

විසින්

සංශෝධිතයි.

ලඞ්කාභිනව විශ්‍රැත යන්ත්‍රාලයෙහි මුද්‍රිතයි.

1932

# DHAMPIYA ATUVA GATAPADAYA.

A

GLOSSARIAL COMMENTARY

ON

THE DHAMMAPADATTHA KATHA

BY

**Kasyapa V, King of Ceylon,**

**(918-928 A. C.)**

---

REVISED AND EDITED

BY

**D. B. Jayatilaka M. A.,**

---

LANKABHINAVA VISRUTA PRESS.

---

1932.

# ප්‍රස්තාවනා.

---

අට්ඨකථාචාර්ය්‍ය බුද්ධඝොෂ මහා ස්ථවිරපාදයන් විසින් ධම්මපද පාළියට කරනලද ධම්මපදට්ඨකථා නම් අර්ථවර්ණනාවෙහි ඇතැම් පදයන් විස්තරකිරීම් වශයෙන් ලියනලද ධම්පියා අටුවා ගැටපදය මෙකල පවත්නා සිංහල ගද්‍යග්‍රන්ථ අතුරෙන් ඉතා පැරණි පොතවේ. මේ අටුවා සන්නය මීට අවුරුදු දහසකට ප්‍රථම-එනම් ක්‍රිස්තු වර්ෂ 918 වන්නෙහි- ලඞ්කාරාජ්‍යශ්‍රීප්‍රාප්තව දශවර්ෂයක් රාජ්‍යානුශාසනා කළ පස්වැනි කාශ්‍යප මහ රජතුමන් විසින් කරනලද්දකි. ඒ බැව් ග්‍රන්ථාවසානයෙහි පැනෙන "දෙබිසෙවැජා අභාසලමෙවන් කසුබ් මහරජහු දහම්පියා අටුවා වට කළ සන්නය" යන පාඨයෙන් ප්‍රකාශිතයි.

මේ කාශ්‍යප මහරජාණෝ ශෞර්ය්‍යවීර්ය්‍ය වික්‍රමාන්විත රජ පෙළපතකට අයත් අනූනවූ බලපරාක්‍රමයෙන් හා විශිෂ්ටවූ ප්‍රඥාසම්පත්තියෙන් විරාජමානවූ නරෝත්තමයෙකි. මේ රජහුගේ පියාණෝ මුගසින් සෙන් හෙවත් ද්විතීය සෙන මහ රජ්ජුරුවෝයි. මවුතොමෝ සඞ්ඝා නම් අගබිසොවයි. මුගසින් සෙන් මහ රජාණන්ගේ මහපියවූ සලමෙවන් සෙන් හෙවත් පළමුවැනි සේන නම් රජතුමා දැහැමින් සෙමෙන් රාජ්‍යය කරන කල්හි පඬිරජෙක් විශාල බලසෙනඟක් කැටිව ලක්දිවට ගොඩබැස යුද්ධාරම්භ කෙළේය. පරසතුරන්ගෙන් ස්වදෙශය මුදවාගැනීමට ශක්තිසම්පන්න සිංහල සේනාවක් සිටිය නමුත් සිංහල ඇමැතිවරුන් අතර පැවැති භෙදවිරොධතායෙන් පඬිසෙනඟට ජය ලැබී ක්‍රමයෙන් අනුරාධපුරය ඇතුළුවූ මුළු රජරටම ඔවුන්ට අත්පත්විය. සේන රජ මලයදෙශයට පලාගියේය. ඔහුගේ මල්වූ මහින්ද නම් යුවරජ පඬිසෙනඟ හා කරනලද බිහිසුණු සටනකදී ස්වකීය සෙවාභටයන් බිඳී පලායන බැව් දැක "නීච සතුරාට අසුවීමට වඩා මියයාම යහපතැ"යි කියා ඇතුපිට උන්වනම කඩුවෙන් හිස කපාගෙන මළේය. රජහුගේ අනික් මල්වූ කස්සප නම් ආදිපාද කුමාරයාද මේ යුද්ධයේදී මරුමුවට පත්විය. සතුරු සේනාවෝ ථූපාරාමය ආදි විහාර දාගැබ් හා මාළිගාද බිඳ හෙළමින් එහි තුබූ සියලුම මාහැඟි වස්තූන් පැහැරගෙන මුළු රටම නිසරුකොළෝය.

මෙසේ රජරට සතුරන්ට අසුව් කලක් පැවැති පසු දෙරජුන් අතර මිත්‍ර සන්ධානයක් ඇතිවූයෙන් පඬිරජ අනුරාධපුරය සිංහල දූතයන්ට පාවා දී ස්වකීය සේනාවන් සමඟ සියදෙස බලා නික්මුණේය. සේන රජතෙමේ නැවතත් රාජ්‍යය ලබාගෙන පොළොන්නරුවෙහි වෙසෙමින් ස්වකීය සහොදරවූ යමකී කාශ්‍යප නම් ආදිපාද කුමාරයන්ගේ ජ්‍යෙෂ්ඨ පුත්‍රවූ මූහසින් සෙන් නම් සූරවීර කුමාරයාට මහාදිපාද තනතුරු දී රොහණ ජනපදයෙහි කිතුඅග්බෝ ආදිපාදයන්ගේ දූ වූ සඞ්ඝා නම් කුමරිය රජන නන්හි තබා අභිෂේකකොට ඕහට පාවා දුන්නේය. සේන රජතුමා විසිඅවුරුද්දක් රාජ්‍යය කොට අපවත්වූ කල්හි මූහසින් සෙන් නම් යුවරජ සිංහාසනාරූඪව සඞ්ඝා නම් රාජිනිය අගමෙහෙසුන්කොට අභිෂේක කැරවූයේය. මෙසේ මේ බිසොව දෙවරක් අභිෂේක ලත් හෙයින් ඇයගේ පුත්‍රවූ ධම්පියා අටුවා ගැටපද කතෘවූ කසුබ් රජතුමා 'දෙබිසෙවැජා'යි කියනු ලදී මහාවංශයෙහි 'වසාභිසෙකා සඤ්ජාතො' යනුවෙන්ද එයම දක්වනලදී.

සේන මහරජතුමා මහත්වූ බලපරාක්‍රමයෙන් රාජ්‍යය කරන්නේ මුළු රටම සෙමෙහි තබා රාජ්‍යශ්‍රීයට පත්වූ නවවන වස විශාලවූ බල සෙනඟක් යවා මධුරාපුරය ඇතුළුවූ පඬිරට අත්පත් කොට ගෙන සලමෙවන් සේන රජහුගේ කාලයේදී ලක්දිවින් පැහැරගෙන ගොස් තුබූ රන් පිළිම මුතු මැණික් ආදී සියලුම වස්තුරාශිය ආපසු ගෙන්වාගෙන සටන්බිමදී මරු මුවට පත් පඬිරජු වෙනුවට නමන්ට අවනතවූ කුමරුවකු රජකමට පත්කැරවූයේය. ලංකාවට පරසතුරන් ඊම වළක්වනු සඳහා ආරක්ෂාසංවිධානය සලස්වා වැව් අමුණු බඳවා මුළු රටම සමෘද්ධිමත් කොට ලෝවාමහපාය මිහුනු ණු වෙහෙර ආදී විහාරාරාම ප්‍රකෘතිමත්කරවීමෙන්ද අමුතු පිරිවෙන් පිහිටුවීමෙන්ද නිකායත්‍රය පිළිබඳ ශොධනයක් ඇතිකරවීමෙන්ද මහත්වූ ශාසනාභිවෘද්ධියක්ද සම්පාදනය කෙළේය. මෙසේ ලංකාවේ ගෞරවයත් ශ්‍රීසමෘද්ධියත් උච්චස්ථානයෙහි පිහිටුවූ මේ මහරජාණන් පන්තිස් වර්ෂයක් රාජ්‍යශ්‍රීය විළඳ අපවත්වූ පසු ඔවුනගේ මල්වූ උදයය කාශ්‍යපය යන රජවරු දෙදෙන ක්‍රමයෙන් එකොළොස් අවුරුද්දක් හා දසසත් අවුරුද්දක් ලංකාව පරිපාලනය කළහ. ඒ සතර වැනි කාශ්‍යප රජහුගේ ඇවෑමෙන් මේ ධම්පියා අටුවා ගැටපදය කළ අබා සලමෙවන් කසුබ් හෙවත් පස්වැනි කාශ්‍යප මහරජතුමා රාජ්‍යශ්‍රීයට පැමිණියේය. මේ රජතුමාගේ විශාරදවූ

ආගමඥතායත් අසහාය පාණ්ඩිත්‍යශ්‍රිය හා ප්‍රඥා මහිමයත් ශ්‍රද්ධා ශීල ත්‍යාගාදී ධර්මිෂ්ඨ ගුණ සමූහයත් මහාවංශයෙහි 52 වැනි පරිච්ඡේදයෙහි මෙසේ වර්ණනාකරන ලදී:-

"සද්ධො ආගතමග්ගොව සාභිඤ්ඤෙවිය පඤ්ඤවා
වත්තා සො'මරමන්තීව චාගවා ධනදෙවිය.

බහුස්සුතො ධම්මකථී සබ්බසිප්පවිසාරදො
යුත්තායුත්තවිචාරාය නිපුණො ඤායකොවිදො.

අචලො ඉන්දඛීලොව සිරතා සුගතසාසනෙ
පරප්පවාදිවාතෙහි සබ්බෙහිපි අකම්පියො.

මායාසාඨෙය්‍යමානාදී පාපානංච අගොචරො
ගුණානං ආකරො සබ්බරතනානංව සාගරො.

× × ×

රජ්ජං දසහි ධම්මෙහි චතුසඞ්ගහවත්ථුහි
කාරෙන්තො පරිපාලෙසි ලොකං නෙත්තංව අත්තනො"

[ඒ රජතෙම මාර්ගගතයක්හු- හෙවත් සෝවාන් පුද්ගලයක්හු- මෙන් ශ්‍රද්ධාසම්පන්න වූයේය. අභිඥාලාභියකු මෙන් ප්‍රඥාවත්විය. හෙතෙම බෘහස්පතිහු මෙන් වක්තෘය, කුවේරයා මෙන් ත්‍යාග ශීලිය. බොහෝ ඇසූ පිරූ තැන් ඇත්තේය, ධර්මකථිකය, සියලු ශිල්පයෙහි විශාරදය, නීතියෙහි දක්ෂවූයේ යුක්තායුක්ත විමසීමෙහි නිපුණය, ඉන්ද්‍රඛීලයක් මෙන් නිශ්චල (ශ්‍රද්ධාවෙන්) බුදුසස්නෙහි පිහිටියේ සියලු පරවාදීන්ගේ (වචන නැමැති) වාතයෙන් අකම්ප්‍ය වූයේය... මායා කුහක මානාදී පාපයන්ට ගොචර නොවූයේ සියලු රතනයන්ට සාගරයමෙන් (සියලු) ගුණයන්ට උත්පත්තිස්ථාන වූයේය. දශරාජ ධර්මයෙන් හා චතුස්සංග්‍රහ වස්තුයෙන් රාජ්‍යය කෙරෙමින් ලොකයා ස්වකීය නෙත්‍රය මෙන් පරිපාලනය කෙළේය.]

මෙසේ වර්ණිතවූ විශිෂ්ට ගුණධර්මයෙන් හා උදාරවූ ප්‍රභූශක්තියෙන් විරාජමානවූ කාශ්‍යප මහරජතුමාණන් විසින් ලොකශාසනාභිවෘද්ධිය සඳහා කරනලද විවිධ සත්ක්‍රියාවෝ ඒ රජතුමාට සවනවස අභයගිරි විහාරභූමියෙහි පිහිටුවනලද ශිලා ලිපියෙහි විස්තරවශයෙන් දක්වනලදහ. ඒ *ශිලාලිපියෙහි මූල කොටස මෙසේයි:-

---

* සිංහලදේශීය ශිලාලිපි (Epigraphia Zeylanica) නම් පුස්තකයෙන් උපුටාගන්නා ලදී.

“මඟුල් සිහසුන් රක් නල් තල අරය් වජන් බෙරසිනය් නෙන් රුපු වරණන් ඇඩි මඳ සිඳු සී පැරැක්මෙන් වැජැඹෙ අනන් අපිරිසෙය් සොබි නිමල ගුණ වතුරෙන් ජියල් සනහය් සසුන් අරිදූ ලක්දිව් පොළොව් මෙහෙසන පරපුරෙන් හිමි ඔපුරැම් [1]බුදදස් සිරි සඟබොය් අබහය් මහරජ්හට් ජා සඟබඩය් අප බිසෙව් රජ්නැණියන් කුස්හි හෙවැ දුනු සැණැහි මේ සුබ රජ් බිසෙව් සිරි පැමැණැ යස තෙජ් හිරි සනද්නෙන් ලොව පහය් සිය වික්මෙන් සතුරන් මැඩැ පළ නිමල කිත් වතුරෙන් ලොවන් පතුළ් දෙබිසෙවැ ජා සලමෙව්වන් අබහය් මහරජ්හුනාර් මිජසිවිවි සඟ්සෙන් අරම් කසුබරජ් මහවෙහෙර් කරය් අපි පත් සියන් වසවය් සුලබ් සතර් පසයෙන් පුජය් සසුන් කොත් හුවය් ඇත්නකර මඟුල් මිහිවයැ දකුණ් දෙර් අසන්හි රජ්වෙද්හල් කරය් රොව් බිය සමය් පොදෙනවුලු පුලුඔවුලුයෙන් කෙත් කම් සුලබ් කොට් සිරි ලක් ලොනුර්වය් සාබිය නිවය් රට් සොයය් සැත් බිය හෙර නන් ජැසින් නන්සෙසි බුද් බනද් කරය් සියල් ඉසිරයෙන් පුජය් දෑ සැණෙන් බුද්රුවන් අරියය් ධමු රුවන් නවරිසයෙකින් පුජනෙම් ගහ යන අදහස් පුරය් අභි ධම් දෙසුන් කසුන් පත් අරවය් මහ පුජැ කොට් සසුන් සිට් වම් යන සිත් දෙල්නෙන් ඇජර පය හමුයෙහි එ මෙ ධම් දෙසුන් වියත්හන් නල සිය බස්නෙන් බුද් ගුණ වැනූ රිවි අන්වයෙන් බට් සැහැකුල කොත් ඔකා රජ්කුලට් තලාවික් අප පුරුමුවො තුමන් සත්ලැගු සවන හවුරුදුයෙහි අබහය් ගිරි වෙහෙර කපාරාමුලට් සලමෙව්වන් පවු කරය් සඟුන් වසවය් සතර පස සුලබ්කොට් මෙමෙ නකය් අබදි අවසට් මෙ සිරිත් නැබැවූහු”

කාශ්‍යප රජතුමා ධර්මකර්මයකින් දුශ්ශීල මහණුන් පහකරවා ශික්ෂාකාමී නවක භික්ෂූන් විහාරාරාමවල වැස්වූ බවත් මිරිසවැටි විහාරමලුයෙහි තංවනලද විසිතුරු මණ්ඩපයෙක්හි රැස්වූ මහා සඞ්ඝයාවහන්සේ හා නාගරවාසීන් මධ්‍යයෙහි “බුඩ ලීලායෙන්” අභිධර්මපිටකයෙන් ධර්මදෙශනා කළ බවත් ධර්මසංගණී ප්‍රකරණය රන්පත ලියවා ධම්සඟුණු නම් අභිනව කරවනලද මහපායෙහි තබවා අවුරුදු පතා මහා පූජෝත්සවයක් පැවැත්වූ බවත් මහාවංශ කථායෙහි ප්‍රකාශිතයි.

ලංකාවාසීන්ගේ දෙලෝවැඩ අනූනවම මෙලෙස සලස්වමින් දස අවුරුද්දක් රාජ්‍යය පරිපාලනය කළ මේ මහරජාණන්ගේ ආදර්ශමත් ජීවනචරිතය බැබළවූ උත්කෘෂ්ට ගුණ සමූහය හා

---

1 මුගසින්සෙන් මහරජතුමා මේ විරුද නාමයෙන් සිලාලිපිවල නිර්දිෂ්ටයි

ප්‍රඥාසම්පත්තිය මහාවංශකාරක ආචාර්‍ය්‍යවරයන් විසින් මෙසේ හකුළුවා දක්වනලදී:-

> "ලඞ්කාරජ්ජෙපි ඨත්‍වා කථිත තිපිටකො සබ්බවිජ්ජාපදීපො
> වත්තා වාදී කවීසො සතිධිතිවිසදො දෙසකො භාවකොච
> පඤ්ඤාසද්ධා දයාවා පරහිත නිරතො ලොකවෙදී වදඤ්ඤූ
> රාජින්දො කස්සපො'යං විය විමල ගුණො හොතු ලොකොපි
> සබ්බො"

[මේ කාශ්‍යප මහරජතෙමේ ලඞ්කාරාජ්‍යයෙහි පිහිටාත් හදාළ ත්‍රිපිටක පර්‍ය්‍යාප්ති ඇත්තේ සියලු විද්‍යාවන්ට ප්‍රදීපයක් බඳුවිය. (ඒ රජතෙමේ) වක්තෘ හෙවත් කීමෙහි බිණීමෙහි දක්‍ෂ විය, වාදී හෙවත් පරවාද මර්දනයෙහි ව්‍යක්ත විය, කවීන්ට නායකද වී. ස්මෘති ධෘති සම්පත්තීන් ආඪ්‍යවූයේ අන්‍යයන්ට ධර්මය ප්‍රකාශ කොට කියන්නේත් තෙමේ පිළිපදින්නේත් විය. ප්‍රඥාවෙන්ද ශ්‍රද්ධාවෙන්ද දයාගුණයෙන්ද යුක්තවූයේ පරවැඩෙහි නිරතවිය. ලොකයාගේ ස්වභාවය දන්නේ මසුරු මල පියා දන්දීමෙහි ඇලුණේද වී. (මෙසේ හෙයින්) සියලු ලෝවැසිතෙමේත් මේ රජහු මෙන් නිර්මල ගුණයෙන් යුක්තවේවා.]

කාශ්‍යප මහරජතුමා අභිධර්මපිටකයට අර්ථව්‍යාඛ්‍යානයක් කළ බවත් බුද්ධස්තෝත්‍ර ග්‍රන්ථයක් රචනාකළ බවත් ඉහතින් දක්වනලද ශිලාලිපි පාඨයෙන් හැඟේ. ශිලාලෙඛනයක සඳහන් කොට තැබියයුතු තරම් සම්භාවනීයවූ මේ පොත් අවිනෂ්ටව පැවතුණා නම් මේ මහරජාණන්ගේ පාණ්ඩිත්‍ය කීර්තිය වඩාත් බැබළවීමට හා සිංහල භාෂාවේ සංවර්ධනය පිළිබඳ පශ්චිම ජනතාවගේ දැනගැන්ම විශාල කිරීමටත් ඉවහල්වනු නිසැකයි. එබැවින් මේ ග්‍රන්ථයත් පුරාණකාලයෙහි ලක්දිව ශොභාමත්කළ අන්‍ය බොහෝ පඬිවරයන්ගේ කෘතීන්මෙන් අනවශෙෂයෙන්ම අභාවප්‍රාප්තවීම අතිශයින්ම ඛෙදජනක වුවත් මේ මහ රජතුමන්ගේම කෘතියක්වූ ධම්පියා අටුවා ගැටපදය දහසක් අවුරුදු මුළුල්ලෙහි පරශත්‍රැ උපද්‍රවාදියට ගොදුරු නොව මේතාක් පැවතීම අනල්ප සන්තුෂ්ටියට කරුණකි.

කාශ්‍යප මහරජාණන්ගේ විශාලවූ ශාස්ත්‍රාගමඥතාය ප්‍රතිබිම්බිතව පවත්නා දර්පණතලයක් බඳුවූ මේ ග්‍රන්ථයෙහි ධම්මපදඨකථාහි ඇතැම් පදයන්ගේ අර්ථවර්ණනා මුඛයෙන් බුද්ධධර්මයෙහි ගම්භීරස්ථාන පිළිබඳ බොහෝ කරුණු විස්තර විභාග සහිතව දක්වනලද්දේය. පෙළෙහි ආ නොඑක් ශබ්දයන්ගේ නිර්වචන

විග්‍රහ ආදිය හා ව්‍යාකරණ ලක්‍ෂණයෝද යථාස්ථානයෙහි නිර්දිෂ්ටයහ. මේ ගැටපදය ලියූ කාලයෙහි පැවැති ධම්පියා අටුවා පොත්වල දක්නට ලැබුණු පාඨාන්තර දක්වා එයින් නොපිළිගත යුතුයයි සැලකූ පාඨ කරුණු සහිතව නිරූපණය කිරීමෙන් පෙළ පොත පිළිබඳ සංශෝධනයක්ද කරනලද්දේය.

මේ ආදී වසයෙන් ආධුනිකයන්ගේ දැනගැන්මත් විද්වජ්ජනයන්ගේ විනෝදයත් අනූනව සැලසෙන පරිද්දෙන් සම්පාදිතවූ මේ ග්‍රන්ථයෙහි භාෂාව ගැන විශෙෂයෙන් සැලකියයුතුව තිබේ. අවුරුදු දහසකට ප්‍රථම සිංහල භාෂාව පැවැති තත්වයත් එහි සංවර්ධනයත් අවබොධ කරගැන්මට මේ පොතින් ලබාගතහැකි ප්‍රයෝජනය අතිවිශාලයි. මේ ගැටපදය කියවනවිට පළමුවෙන්ම වැටහෙන කරුණක් නම් සංස්කෘත තත්සම ශබ්දයන්ගේ විරලත්වයත් පාළි තත්සම වචනයන්ගේ බහුල ප්‍රයොගයත්ය. මෙය සිංහල භාෂාවේ සංවර්ධනය පිළිබඳ ඉතිහාසයෙහි ලා සැලකියයුතු ලක්‍ෂණයකි. සිංහල ජාතියෙහි මුල් පියවරු වන විජය රජහු කැටිව ලාටදෙශයෙන් ආ පිරිස කථාකළ භාෂාව කුමක්දැයි නිශ්චය කරගැන්මට උපකාරීවන තත්කාලීන කිසිම ලිපියක් සොයාගත නොහැකිවූවත් එය මාගධ භාෂාවට ආසන්නවූ ප්‍රාකෘතයක් බව කරුණු සලකා බලනවිට වැටහෙයි. විජය රජු පටන් අවුරුදු දෙසියගණනක් ගියකල දෙවානං පියතිස්ස මහ රජාණන් දවස මිහිඳු මාහිමියන් විසින් ලක්දිව බුදුසසුන පිහිටුවන ලදී. එකල පාළි භාෂායෙන් තුබූ අටුවා ආදිය ධම්මදූත මහ තෙරුන් වහන්සේලා සිංහලට පෙරළූහයෝයි. එතැන් පටන් බුද්ධධර්මය පිළිබඳ පාළිවචන නිරායාසයෙන්ම සිංහල භාෂාවට ඇතුළත්වූ බව සිතාගතහැකියි. ශාසන ප්‍රතිෂ්ඨාපනයට සමීප කාලයෙහි පිහිටුවකලද ශිලාලිපිවල වචන ඊට ප්‍රභවවූ මාගධ ශබ්දයන්ට අතිශයින්ම සමානවූවත් කල් යත් යත් කථා ව්‍යවහාරයෙහි පවත්නා භාෂා පිළිබඳ සාමාන්‍ය ධර්මතාවට අනුව උච්චාරණ භෙදයෙන් ක්‍රමයෙන් වෙනස්ව අවුත් ශතවර්ෂ ගණනක් ගිය පසු මුල් ශබ්දයන්ට බොහෝසෙයින්ම විසදෘශ භාවයට පත්වූයේය. සිංහල භාෂාව පිළිබඳව දක්නා ලැබෙන මේ යථාක්‍රම විපර්‍යාසය මෙහි පහත දක්වනු ලබන * ශිලාලිපි පාඨවලින් පහසුවෙන් ප්‍රත්‍යක්‍ෂකරගත හැකිවේයයි සිතමු:-

---

† සිංහලදෙශීය ශිලාලිපි (Epigraphia Zeylanica) නම් පොත් කලාපවලින් උපුටාගන්නා ලදී.

### (1) වෙස්සගිරි

(ක්‍රිස්තුවර්ෂාරම්භයට ප්‍රථම 2 වැනි ශතසංවත්සරය.)

.. තලදර නගහ පුත් දෙවහ ලෙණෙ අගත අනගත චතුදිස සගස.

### (2) රිටිගල

(ක්‍රි: ව: පූ: 1 වැනි ශ: සංවත්සරය)

මහමත බඹදත පුත පුරුමක බතිතෙ පුරුමක අසගුතෙ පුරුමක මිතෙ පුරුමක තිසෙ එතෙහි කරිතෙ අරිට මහගම.

### (3) මෝලාහිටියවෙලේගල.

(ක්‍රි: ව: 1 වැනි ශතසංවත්සරය.)

දෙවන පියතිස මහරජහ මරුමණක කුඩකණ රජහ ජෙට පුතෙ රජ අබයෙ අතරගගහි ගණ . . නකග අඩි පිලිපවත විහරහි බිකුසගය සොවණ කොතුරුනි නියතෙ.

### (4) විහාරේගල.

(ක්‍රි: ව: 2 වැනි ශතසංවත්සරය.)

වහබ රජහ පුතෙ තිසරජෙ තිසරජහ පුතෙ ගමිණි අබරජෙ සබ රජහ දිනක උපල දෙණික වවි පොහතකරහි ජිණ පොඩ වය බිකුසගහමය පඩිදිනෙ. . . .

### (5) තෝණිගල.

(ක්‍රි: ව: 4 වැනි ශතසංවත්සරය.)

පුවිය මහසෙන මහරජහ පුත සරිමෙකවණ අබ මහරජහ වන ලෙගිතක තිණවතක වසහි නකරහි උතර පසහි කලුහුමනක නියමතනහි සිය අවිය කිණියෙහි නිකත කඩුබලගමකෙහි වස නක අමෙති පහෙජ සිවයහ පුත දෙවයහ යහිසපවය තව වෙහෙරකෙහි දිත අරියවස වටවි දෙ ගකඩ දස අමණක වි ඉව ස අමණක උදි ඉව බසලි දස අමණ ඉව. . . . . .

### (6) ලබුඇටබැඳිගල.

(ක්‍රි: ව: 5 වැනි ශතසංවත්සරය.)

සිඹම්- නකරහි පජිත පසහි මහ තබක නියම තනහි දෙව යරිය මහ විහරහි අමෙති සගයහ පුත සිරිනකසි උවනිකෙව කොටු අරියවස වටමය එක සතක කහවණ දිනි . . . .

### (7) ගැරඩිගල.

(ක්‍රි: ව: 8 වැනි ශතසංවත්සරය )

දඹදිව් දුනු සිරිසංබො මපුර්මුකා තුන්වන්හෙ මිහිද් මහ පාණන් . . . ගොම්බියෙන් පහණ් හින්ද්වා දුන් හිරියත් කුම්බුර්

ඉසා බුද් පිහිමලුන් මිහාබොදෙණියෙන් පහණ් හින්ද්වා දුන් දෙපයක් කුම්බුර්ඉසා . . . මහමලුන් මිහින්තරියෙන් පහණ් හින්ද්වා දුන් කුම්බුර්දෙපයක් ඉසා මෙලෙණ(සෙනසනැ)බැන්ද දෙව. සිසිම් දනපතින් සිගා මෙලෙණට් බහාලූ කුම්බුරට් අවුල් කළ කෙනෙක් බුදෙනා බත් නොලැබෙත් පරදත්මයෙ බලු කවුඩු වෙත්වසි . . . . .

## (8) කළුදිය පොකුණ.

### (ක්‍රි: ව: 9 වැනි ශතසංවත්සරය)

සිරිසඟ්බොයි මපුර්මුකා දෙලොස්වන්නෙ පොසොනැ පුර විසෙනි දවස් දළනාම් දකිණිගිරි වෙහෙරැ මහසඟ්නට් ලඟා බතට් නෙවිසි කළඳක් රන් දී දවස් පතා මහ බුන්ද්නෙන් දෙයඩ්මනාක් සාලෙ බත් ඉසා මුත් පනින් පෙරෙ බුන්ද්නෙන් එකඩ්මනාක් දිගි ඇතුල්කොට් හිර් සන්ද් ඇතිනාක් සැඳෑ පවත්නා ඉසා සාල් නොදී බත්ගෙ පිසැ බත් දෙනු ඉසා වෙහෙරැ වියගුරක් ඇත මෙබත් කවුඩු බල්ලනට් ඔසා ඉසා මෙ විබිඩ කළ කෙනෙකුන් මහ මෙනෙ සම්මා සම්බුදුන් දෙරින් යත් අත් නොනැඹිය හෙනු කොට් දළනාම් මෙබත් දින්මියි සිම් මමද් මෙකරණෙයහි ගිවිසැ බතක් දින්මිසි . . . . .

කසුබ් මහරජතුමන්ගේ අභයගිරි ශිලාලේඛනයෙන් උපුටා මෙහි iv වැනි පිටේ බහාලනලද කොටස මෙතැනට යොදාගෙන මේ ශිලාලිපි ප්‍රාය සුපරීක්ෂාවෙන් සංසන්දනයකර බලනවිට ක්‍රිස්තුවර්ෂාරම්භයට ප්‍රථම දෙවැනි ශතසංවත්සරය පටන් ක්‍රි: ව දසවැනි ශතසංවත්සරය දක්වා ගතවූ ශතවර්ෂ දොළසතුළ සිංහල භාෂාව සංවර්ධනය වූ පරිදි තරමක් දුරට අවබෝධකරගත හැක්කේයි. එබඳු පරීක්ෂණයකදී වැටහෙන ප්‍රධාන කරුණක් නම් මේ සංවර්ධනය බොහෝසෙයින්ම මාගධ භාෂාශ්‍රයෙන් සිදුවූවක් බවයි. එසේ හෙයින් ධම්පියා අටුවා ගැටපදය සිඛවලඳවිනිස ආදි දස වැනි ශතවර්ෂයට අයත් පොත්වල ඉහතින් දැක්වූ පරිදි පාලි තත්සම වචනයන්ගේ බහුලත්වය දක්නා ලැබේ. මේ ක්‍රමය එකොළොස්වැනි ශතවර්ෂය අවසානය දක්වා නොකඩව පැවැතුණු බව මේ කාලයට අයත් ශිලාලිපිවලින් පෙනේ. එසේදවුවත් දොළොස්වැනි ශතවර්ෂයේදී මේ චිරන්තන සම්ප්‍රදාය සම්පූර්ණයෙන්මවාගේ විපර්යාසවූයේය. ශ්‍රී බුද්ධ වර්ෂ 1707 වන්නෙහි

(ක්‍රි: ව: 1164 දී) පොළොන්නරුවෙහි රජ පැමිණි මහා පරාක්‍රමබාහු මහරජාණන් විසින් ගල්විහාරයෙහි පිහිටුවන ලද කතිකාවත් ශිලාලේඛනයත් යට දක්වනලද කසුබ් මහරජ තුමන්ගේ අභයගිරි ශිලාලේඛනය හා සතරවැනි මිහිඳු මහ රජහු විසින් [1]මිහින්තලේ පිහිටුවනලද ශිලාලිපි ආදි දසවැනි එකොළොස්වැනි ශතවර්ෂවලම අයත් ශිලාලේඛනත් සමඟ බැලූවිට මේ විපර්යාසයේ ප්‍රමාණය සලකාගතහැකිසි. මහා පරාක්‍රමබාහු [2]ශිලාලිපියේ ආරම්භ පාඨය මෙසේයි:-

"අප බුදුන් කල්ප ශතසහස්‍රාධික චතුරසංඛ්‍ය පරිමිත කාලයක් සමතිස් පැරුම් පුරා මාරසංග්‍රාමභූමිවූ මහාබෝධි පර්‍යංකාරූඪ වැ දුර්වාර සපරිවාර මාරපරාජය කොටැ සර්වඥ පදප්‍රාප්ත වැ පන්සාලිස් හවුරුද්දක් දවස් චාතුර්වීපක මහාමේඝයක් සෙයින් වැඩැ සිටැ අනෙක කල්පකොටිශතසහස්‍රයෙහි ක්ලේශාග්නීන් දගධවෙමින් සිටි සත්වයන් ධර්මාමෘත වර්ෂායෙන් නිවමින් සකල බුද්ධ කෘත්‍ය නිමවා කුසිනාරානුවර අබියෙස්හි මල්ලරාජයන්ගෙ සාලවනොද්‍යානයෙහි නිරුපධිශේෂ නිර්වාණ ධාතුයෙන් පිරිනිවි සාරසිය සූපනැස් හවුරුද්දක් ගියකලැ වළගම්අභා මහරජු දවසැ පටන් එක්වාදහස් දෙසිය සූපනැස් හවුරුද්දක් භින්නනිකාය වැ ශාසනය පිරිහෙමින් සිටිකල්හි මහාසම්මතාදි පරම්පරායාත සූර්යවංශොද්භූත රාජාධිරාජ නෛක දිගභිව්‍යාපත යශොමරීචින් විරාජමාන ශ්‍රීසංඝබොධි පරාක්‍රම බාහු මහරජාණන් සකල ලංකාතෙලෙහි එක රාජ්‍යාභිෂෙකයෙන් අභිෂිකත වැ විජෘම්භිත පුණ්‍යර්ද්ධි ඇතිවැ රාජ්‍යසුඛානුභවකොටැ ශාසනුවන් අඥාන දුර්ඥාන මූලක අප්‍රතිපත්ති දුෂ්ප්‍රතිපත්ති විෂමෙවිඝ විහත වැ අපායා(ප)න්නවත ශාසනාවචර කුලපුත්‍රයන් දැකැ සුපරිශුඬ බුඩශාසනයෙහි මාවැනි ආඥාචක්‍රවර්තියක්හු මෙවැනි කිලුටක් දැකැ දැකැ උදාසීන වුවහොත් බුදුසස්න නස්සි බොහෝ සත්හු අපායභාග් වෙති පස්වාදහසක් පවත්නා බුදුසස්නම මා වහල් වුව මැනවැයි ප්‍රඥාපුරස්සර කරුණායෙන් සමොදිත හෘදය ඇති වැ මෙසේ නම සසුන් කවුරුන් වහල් කොටැ අපගත කලංක වැ පස්වාදහසක් පවත්නා පරිද්දෙන් තෙරම්ලොහොසි සිතා අබබාමජිඡූතාදි විවිධ ගුණගණාභ සඞ්ගත කොටැ රක්ෂිත වර්ධිත පොෂිත ශීලස්කන්ධාදි ලෞකික ගුණරත්නාලංකාරයෙන් සමලංකෘතවූ උදුම්බරගිරි නිවාසි මහාකාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ මහාවිහාරාධිවාසි භික්ෂු සංඝයා දැකැ ඔවුන්

---

1 කතිකාවත් සඟරාවේ 37—42 වැනි පිටු බලනු.
2 එම 1—5 වැනි පිටු බලනු.

වහල් කොටැ බුදුන් විසින් අනුඥාත බුධකල්ප මොග්ගලී පුත් තිස් මහතෙරුන් වහල්කොටැ පාප භික්ෂු නිර්මථනය කොටැ දුර්ලබ්ධි මැඩැ ශාසනමල විශොධා කෘත්‍ය ධර්මසංගායනා කැරුවූ ධර්මාශොක මහරජහුමෙන් අනෙක ශත පාප භික්ෂූන් ශාසනෘ ශාසනයෙන් අපගත කොටැ ෂඩභිඥාද්‍යනෙක ගුණාගණොපෙත මහා ක්ෂීණාශ්‍රවයන් ඇති කල්හි පවා පූර්වරාජයන් විසින් මහොත්සාහයෙනුදු සමඟ නොකොටැ ගතහුණු තුන්නිකා සමඟ කිරීමෙන් එක් නිකා කොටැ ජෙතවන මහාවිහාරාදී නොඑක් මහ ඇඟි විහාර ලක්දිවැ තන්හි තන්හි කරවා එහි සහස්‍ර සංඛ්‍යාතික්‍රාන්ත මහාසංඝයා වාස කරවා නිරන්තර ප්‍රවෘත්ත ධර්මාමිෂදානයෙන් උපස්ථාන කෙරෙමින් සඞ්ඝදර්ශන ප්‍රභව ප්‍රීති ප්‍රාමොද්‍ය රසාස්වාදයෙහි ලොල වැ කාලානුකාලයෙහි පෙෂ්ඨාග ශීල සමුපෙතවැ විහාරයට එළැඹැ සන්නිපතිත සඞ්ඝ මධ්‍යගත වැ තද්දර්ශන ප්‍රසූත ප්‍රීතිප්‍රාමොද්‍යරසාස්වාදකොටැ මාවිසින් මහොත්සාහයෙන් සාධිතවූ මෙ සඞ්ඝ සාමග්‍රිය පස්වාදහසක් අභින්න වැ පවත්නා පරිද්දෙන් මතුවන සංඝයාද අප්‍රමාද වැ ග්‍රන්ථ විදර්ශනා ධුරයෙහි යෙදී අලෙපවර්ජනාදී ගුණෙන් යුක්ත වැ වසනා පරිද්දෙන් අවවාදානුශාසනා කොටැ ශාසනය රක්ෂාකළ මැනැවැයි යුක්ත ව්‍යක්ත ගුණොපෙත වැ කරන ආරාධනාද අසා මහා කාශ්‍යප මහාස්ථවිර ප්‍රමුඛ ස්ථවිරවරයන් මැ විසින් ප්‍රමාදවිහාරීන් අවකාශ නොලබන සඳහා ධර්මවිනය සංසන්දනය කොටැ ඇඳුරොල්ද නොවිහිදූ කළ කතිකාවති’’

ධම්පියා අටුවා ගැටපදයත් දොළොස්වැනි ශතවර්ෂයට අයත් අභිධර්මාර්ථ සඞ්ග්‍රහයත් සමකර බැලූවිටද භාෂාරීතිය සම්බන්ධ මේ වෙනස ප්‍රත්‍යක්ෂවේ. ශතවර්ෂයකට අඩු කාලයක් තුළ සිංහල භාෂාරීතිය පිළිබඳව මෙබඳු වෙනසක් කෙසේ ඇතිවූයේදැයි මෙහිදී සලකා බැලිය යුතුයි. එකොළොස්වැනි ශතවර්ෂයේ මූල භාගයේදී සිදුවූ ඓතිහාසික කරුණකින් මේ විපර්යාසයට මං පැදුණු බව හැඟේ. ඒ සිදුවීම නම් සතරවැනි මිහිඳු රජහුගේ පුත්‍රවූ පස්වැනි සේන රජහු සිංහාසනාරූඪවූ තැන් පටන් ද්‍රවිඩ බලය ක්‍රමයෙන් උත්සන්නව අවුත් ඊළඟට රජ පැමිණි පස්වැනි මිහිඳු රජහුගේ කාලයේදී සොළීන් සිංහල රජහු ජීවග්‍රාහයෙන් ගෙන රුහුණු රටින් ශෙෂයක් හැර මුළු ලක්දිවම අත්පත්කර ගැනීමයි. සේන රජහු පටන් මහා විජයබාහු මහරජාණන්ගේ දසසත්වැන්න දක්වා අවුරුදු අනූගණනක් මේ ද්‍රාවිඩ ආධිපත්‍යය පැවැතුණේය. මේ දීර්ඝ කාලය තුළදී පරසතුරන් විසින් අතිශයින්ම පීඩිතවූ ලංකාවීපයෙහි ආගම ධර්මයත්

භාෂාශාස්ත්‍රාදී යත් බොහෝ සෙයින්ම පිරිහීමට පත්වූයේය. මහා විජයබාහු රජතුමා දසසත් අවුරුද්දක් සටන්කොට සොළීන්ගෙන් රට මුදවා එක්සත්කොට ලංකාශාසනයත් ශාස්ත්‍රයත් යථාස්ථානයෙහි පිහිටුවීම සඳහා උත්සාහ වැඩූනමුත් ඒ මහරජාණන්ගේ ඇවෑමෙන් විජයබාහු වික්‍රමබාහු දෙරජුන් අතරද ඉන්පසු ගජබාහු පරාක්‍රමබාහු දෙරජුන් අතරද සතලිස් අවුරුද්දක් පමණ පැවැතුණු අභ්‍යන්තර යුද්ධ කරණකොටගෙන ලක්දිව ශාස්ත්‍රාගම නැවතත් පරිහානියට පත්විය. ගජබාහු රජහුගේ මරණින් පසු මහා පරාක්‍රමබාහු මහරජතුමා චීපචක්‍රවර්තීව තුන් නිකායම සමඟිකොට ශාසනශුද්ධිය කරවා ශාස්ත්‍රාගමාභිවෘද්ධිය අනූනවම සැලැස්වූයේය. මේ සියලුම ලෝකශාසනාභිවෘද්ධිදායක කෘත්‍යයන්හි මහරජතුමාම ඉවහල්වූ තත්කාල ශාසනානුශාසක දිඹුලාගල මහාකාශ්‍යප මහා ස්ථවිර අනුරාධපුර ථූපාරාමාධිවාසී මොග්ගල්ලාන මහාස්ථවිර ආදී මහතෙරුන්වහන්සේලා සංස්කෘත භාෂාව පිළිබඳ විශිෂ්ටඥානයකින් හෙබියාවූ මහා පඬිවරයෝ වූහ. මුන්වහන්සේලා අතුරෙන් මහාකාශ්‍යප මාහිමියෝ බාලාවබෝධන නම් චාන්ද්‍ර ව්‍යාකරණග්‍රන්ථය නිපදවූහ. මොග්ගල්ලාන මහා ස්වාමීන්වහන්සේගේ සංස්කෘත පාණ්ඩිත්‍යය

යා ශක්තිඃ පාණිනෙඃ යා ච
චාන්ද්‍ර කාත්‍යායනාදිෂු
සෝ'යං මූර්තිමතී මන්‍යෙ
මෞද්ගල්‍යායන රූපිණී '' යි

තත්කාලීන කවිවරයන් විසින් වර්ණනා කරන ලදී. මුන්වහන්සේලාගේ ශිෂ්‍යවූ ශාරිපුත්‍ර මහාස්ථවිරපාදයෝ සංස්කෘත ව්‍යාකරණ පිළිබඳ ප්‍රශස්ත ග්‍රන්ථ කීපයක් රචනාකළහ. මෙසේ ලක්දිව සංස්කෘත භාෂාඥානය අතිශයින් බැබළවූ මේ ආචාර්යපරම්පරාවට අයත් පඬිවරයන්විසින් කරනලද අභිධර්මාර්ථසඞ්ග්‍රහ සන්නය ආදී සිංහල පොත්වල ඒකොළොස්වැනි ශතවර්ෂය දක්වා පැවැතුණු භාෂාරීතියට බොහෝසෙයින් වෙනස්වූ සංස්කෘත තත්සම ශබ්දයන්ගේ බහුල ප්‍රයෝගයෙන් යුක්තවූ භාෂාරීතියක් දක්නා ලැබේ, මිශ්‍ර සිංහල නාමයෙන් ප්‍රකටවූ වර්තමාන

භාෂාරීතිය මෙසේ පොළොන්නරු අවධියෙහි ආරබ්ධවූ බැව් සැලකියයුතුයි. 13 වැනි 14 වැනි ශතවර්ෂවලට අයත් පූජාවලිය, රත්නාවලිය, පන්සියපනස් ජාතක පොත, සද්ධර්මාලඞ්කාරය ආදී සාමාන්‍ය මහා ජනයාගේ ප්‍රයෝජනය සඳහා සම්පාදනය කරනලද ධර්මපුස්තකයෝ මේ මිශ්‍ර භාෂාව ප්‍රචාරයට පැමිණවීමට උපකාරී වූහ. 15 වැනි ශතවර්ෂයේදී මේ භාෂාරීතිය වඩවඩාත් තහවුරුවූ බැව් හැඟේ. මේ අවධියේදී ලියන ලද සද්ධර්මරත්නාකරය හා පඤ්චිකාප්‍රදීපයෙහි සංස්කෘත තත්සම ශබ්දයන්ගේ ප්‍රයෝගය අතිබාහුල්‍ය වශයෙන් දක්නාලැබේ. සද්ධර්මරත්නාකරයෙන් උපුටාගන්නාලද-

“සකල ලෝකානන්දකරවූ කරුණා නිධානවූ ශරණාගත ශිෂ්‍ය පඤ්ජරවූ ධර්මාමෘතදායකවූ ත්‍රිවිධලෝකහිත විධායකවූ කකුසඳ කොණාගම කාශ්‍යප ගෞතම මෛත්‍රීය යන පස්බුදු කෙනෙකුන්වහන්සේගෙන් ශෝභමානවූ මේ මහා භද්‍ර කල්පයට අතීතයෙහි සාරාසඞ්ඛ්‍ය කල්පලක්ෂයකින් මතු සාරමණ්ඩනම් කල්පයෙහි සතරවන අතුරුකප සමස්ත වස්තු විස්තීර්ණ ජනපද නිගමග්‍රාමාභිරාම රාජධානියෙන් ප්‍රතිමණ්ඩිතවූ ජම්බුද්වීපයෙහි සකල සම්පත්තීන් ශෝභමානවූ කෛලාශකූට ප්‍රතිභාග සුධාසිත ප්‍රතිවිතත ශිඛරීසතමහ සෝපානමාලාකුල කපොතපාලිකා ශෝභිත රජත ස්කන්ධශ්‍රේණීන් සඞ්කීර්ණවූ නානාස්ථානයෙහි ප්‍රලම්බ ප්‍රවාල හෙමදාම මුක්තාලතා සඞ්කුලිත විචිත්‍ර කූටාගාර භාරිත හෙමසජ්ඣිය නානාවිධ ධවජ භුජඞ්ගසුබද්ධ මිණිකිංකිණිකානාද මෘදඞ්ග රණත්‍රම්සධ්වනියෙන් අතිගම්භීර මෙචක මෙඝකූට ශ්‍රේණිශ්‍රීන් ගෘහ මයූරයන් නෘත්‍යාරම්භ කරවන උත්තුඞ්ග මඞ්ගල ප්‍රාසාද පඞ්ක්තීන් ප්‍රසාදකරවූ නිර්ජරවර ශරීරසෞන්දර්‍ය්‍යාභිරාම ප්‍රභාස්වර රූපලාවණ්‍ය ගුණයෙන් අග්‍රප්‍රාප්ත ව්‍යක්ත නරනාරිගණානුචරිත සුවිභක්ත චච්චර චතුෂ්ක සඞ්ඝාටකාදී විවිධ විචිත්‍රාන්‍යාසයෙන් විචිත්‍රවූ .... ධරණී දර්පණ තලයෙන් පෙනීගිය දිව්‍යපුරයක් මෙන් ශෝභමානවූ අමරවතී නම් රාජධානියෙහි .. ...

ඉත්‍යාදි පාඨයන් පඤ්චිකා ප්‍රදීපයෙහි පැනෙන

“මෙහි පූර්වගාථාවයෙන් ඉෂ්ටදේවතානමස්කාරයැ සංදර්ශිතයැ. ඒ පූජ්‍ය පූජානිෂ්පාදක කුශලචෙතනායෙන් විධූතාශෙෂ ක්ලිෂ්ට ක්ලේශයන් ඇති චිත්ත සන්තානයෙහි භාවානන්තරයෙහි සිද්ධකරනලද පුණ්‍යාන්තරායකර ධර්මයන් ප්‍රත්‍යය වෛකල්‍ය කරණයෙන් ප්‍රතිබාධකයෙ නොවැ තමඞ්තුක භයාද්‍යන්තරාය නිවර්තිතත්ත්වයෙන් යථාරබ්ධ

ශාස්ත්‍රය නිර්ඝෂනයෙන් පරිසමාප්තියට පැමිණෙන පිණිසයි" යනාදි පාඨත් ගැන සලකා බලනවිට සංස්කෘත භාෂාශ්‍රයෙන් සිංහල භාෂා රීතිය පිළිබඳව සිදුවූ වෙනස මනාව අවබොධකර ගතහැකියි. මහනුවර රාජධානි කාලයට අයත් සන්නස් ආදි ලිපිවල පැනෙන ප්‍රාස වාක්‍යයන්හිද මේ සංස්කෘත තත්සම ශබ්දයන්ගේ බාහුල්‍ය ප්‍රයොගය දක්නාලැබේ. පොළොන්නරු අවධියෙහි ආරබ්ධවූ මේ "මිශ්‍ර සිංහල" භාෂාව ඊට ප්‍රථම පැවැති භාෂා රීතියට වඩා සාමාන්‍යයෙන් අදහස් දැක්වීමෙහි ශක්තිසම්පන්න බව පිළිගත යුතුයි. එසේද වුවත් දුරවබොධ සංස්කෘත පාඨ යෙදීමෙන් මේ "මිශ්‍ර භාෂාවෙන්" ගතහැකි ප්‍රයොජනයට හානි වනබැව් පැනේ. යමක් කීමෙහි හෝ ලිවීමෙහි එකම අදහස නම් එය අසන කියවන අන්‍යයන්ට එහි අර්ථය වැටහීමයි. එසේ හෙයින් කාටවත්—නැත්නම් වැඩිදෙනාට—නොතේරෙන පරිද්දෙන් යමක් කීම හෝ ලිවීම නිරර්ථක ක්‍රියාවක් බැව් හැමදෙනාටම ප්‍රත්‍යක්ෂ විය යුතුයි. එසේද වුවත් මේ කාලයෙහි පොත්වල පමණක් නොව ප්‍රවෘත්ති පත්‍රවල පළවෙන ලිපිවල පවා මේ දොෂය නොඅඩුවට දක්නා ලැබේ. මේ වැරැද්දෙන් තොරව සාමාන්‍යයෙන් කාටත් තේරුම් ගත හැකි භාෂාවෙන් ලියන්ට කියන්ට ආධුනිකයන් පුරුදු පුහුණුවිය යුතුබව කියමු.

ධම්පියා අටුවා ගැටපදයෙහි බොහෝ තැන්වල අර්ථවර්ණනා පාලි භාෂාවෙන්ම දක්වා තිබේ. සමහර විටෙක පදාර්ථය පාලි භාෂාවෙන් දක්වා අනතුරුව එහි අදහස සිංහල භාෂාවෙන් සපුම කර තිබේ. කථාවස්තුන්ගේ නාමයෝද සමහරක් සිංහලෙන්ද සමහරක් පාලි භාෂාවෙන්ද යොදන ලදහ. මේ ගැටපදයෙහි විශෙෂ අඞ්ගයක්වූ මේ භාෂා සම්මිශ්‍රණයට හේතුව කුමක්දැයි නිශ්චයකොට කිය නොහෙමු. මේ පොත ලියූ කාලයේ පාලි සිංහල භාෂාවයම එකලෙස භාවිතවූ බැව් පමණක් එයින් සිතා ගත හැකියි.

මේ සන්නයෙහි කීප පළක මහටුවා හෝ හෙළටුවා නමින් දක්වනලද පුරාණ සිංහල අටුවාවෙන් උපුටාගත් පාඨ දක්නා ලැබේ. මේ පාඨ සියල්ලක්ම පාගේ කාලාන්තරයෙන් ජනිත දොෂයෙන් දූෂිත බැවින් එයින් ගතහැකි ප්‍රයොජනය ස්වල්ප බැව් කියයුතුයි.

සිංහල භාෂාවේ සංවර්ධනය පිළිබඳ පරීක්ෂණයකදී ධම්පියා අටුවා ගැටපදයේ භාෂාරීතිය අතිශයින්ම ප්‍රයොජනවත් වනබැව් ඉහතින් දක්වනලද කරුණුවලින් කාටත් ප්‍රත්‍යක්ෂවේයයි හඟිමු.

එසේම මේ ග්‍රන්ථයෙහි පැනෙන බොහෝ ශබ්දප්‍රයෝගයනුදු සිංහල භාෂාවේ නිරුක්ති ව්‍යාකරණ ලක්ෂණ හා අක්ෂර වින්‍යාසාදිය පිළිබඳ නොඑක් ප්‍රශ්නයන් විසඳීමට ඉවහල්වන බැව් කියයුතුයි. මෙහි ලා දක්වියයුතු දෑ බොහෝ වුවත් ඒ සියල්ලක්ම මේ ලිපියෙහි ඇතුළත් කළනොහැකි බැවින් ප්‍රධාන කරුණු කීපයක් පමණක් මෙහි බහාලමු.

මේ ගැටපදයෙහි නොඑක් තන්හි වර්තමාන ව්‍යවහාරයෙහි ‘ද’ කාරය වෙනුවට ‘ජ’ කාරය යොදා තිබේ. මේ ප්‍රයෝගයට නිදර්ශන ස්වල්පයක් මෙසේයි:-

| පිට | පෙළ | | පිට | පෙළ | |
|---|---|---|---|---|---|
| 27 | 34 | බෙහෙජ් | 161 | 14 | මැජහත් |
| 29 | 31 | කම්වජන් | 191 | 31 | බුජුන් |
| 49 | 3 | මූජම් | 194 | 19 | ජෙයෙක් |
| 59 | 5 | පෙපෙජකිජ් | 208 | 16 | ළජුන් |
| 63 | 24 | පෙජ් | 228 | 18 | ජගගෙහි |
| 102 | 23 | වැජියෙක් | 230 | 30 | මීවජයක් |
| 112 | 5 | පුජන | 257 | 6 | ජුවුජු |
| 143 | 11 | සැජැහැ | 263 | 32 | සජොස් |
| 149 | 16 | පහජති | 265 | 13 | සජොරු |
| | | | 274 | 16 | ජිදුළ |

මේ නිදර්ශන පාඨ ගැන විමසා බැලීමේදී මේ ජ කාර ප්‍රයොගය බොහෝ තැනෙක්හි ප්‍රකෘති වශයෙන්ද සමහර තැනෙක ආදේශ වශයෙන්ද යෙදී තිබෙන බව හැඟේ. බෙහෙජ්, පෙපෙජකිජ්, පුජන යන ශබ්දයන්ට ප්‍රභවවූ භෙසජ්ජ, උජ්ජ, පූජක යන මාගධ ශබ්දයන්ද ජ කාර යුක්ත බැවින් මේ පාඨවල ජ කාර ප්‍රයොගය ප්‍රකෘති වශයෙන් යෙදී තිබේ.

කම්වජන්, මූජම් යන වචනවල ජ කාරය කම්මවාචා, මුඤ්චාමි යන මාගධ ශබ්දයන්හි පැනෙන ‘ච’ කාරය’ වෙනුවට වැටී තිබේ. මේ වචන පළමුවෙන් ජ කාර යුක්තව සිංහලට බිඳී අවුත් පසුව ජ කාරය ද කාර බවට පැමිණ වදන්, මුදම් යි ව්‍යවහාර ප්‍රාප්තවූ බැව් හැඟේ. ජුවුජු (පා. දුබ්බච) යන්නෙහි අන්ත ජ කාරයද මෙලෙසම සිඳවී තිබේ. එසේම මජ්ඣන්තික යන මාගධ ශබ්දයෙහි ඣ කාරය වෙනුවට ජ කාරය යෙදීමෙන් පළමුවෙන් මැජගත් යි බිඳී අවුත් පසුව මැදිහත් යන වර්තමාන පාඨය ඇතිවිය.

ජෙයෙක්, ජුවුජු (ප්‍රථම ජ කාරය), සජොස්, සජොරු, ජුදුළු යන පාඨවල ජ කාරය ආදේශ වශයෙන් යෙදී තිබෙන බැව් සැලකිය යුතුයි. මේ ආදේශ විධිය ධම්පියා අටුවා ගැටපදය කළ කර්තෘවරයාණන්ගේ ව්‍යභිචාර මාත්‍රයක්ද එසේනොව ඒ කාලයෙහි පැවැති භාෂාරීතියෙහි විශෙෂ අඞ්ගයක්ද යනු ස්ථිර වශයෙන් නිශ්චය කිරීම උගහට වුවත් දසවැනි ශතවර්ෂයට අයත් ශිලාලිපිවලත් සිඛවළඳවිනිස ආදි තත්කාලීන පොත්වලත් මෙවැනි යෙදුම් දුර්ලභ බැව් කිය යුතුයි.

'ඇත්' යන්නෙහි ප්‍රභවය 'හස්ති' ශබ්දය බැව් කවුරුත් දනිති. එතකුදුවුවත් මේ මාගධ ශබ්දයෙන් ප්‍රථමයෙන් සිංහලට බිඳී ආයේ 'ඇත්' යී නොව 'හැත්' කියා බැව් බොහෝදෙන නොදනිති. ධම්පියා අටුවා ගැටපදයෙහි 'හැත්' (74,20), 'හැතුන්' (60,28), 'හැතක්' (74,13) යී මේ ශබ්දය ස්වරූපයෙන්ද විභක්ත්‍යන්තවද දක්නා ලැබේ. හස්ති ශබ්දයෙන් බිඳුණු 'හැත්' යන්නෙහි 'හ' කාරය කාලාන්තරයෙන් අනුච්චාරණයට පැමිණීමෙන් වර්තමාන 'ඇත්' ශබ්දය සැදුණේයි. මෙකල අභාවයට ගොස් තිබෙන මෙවැනි මුල් තද්භව වචන සිංහල භාෂාවේ සංවර්ධනය හා නිරුක්ති සම්බන්ධ පරීක්ෂණයේදී අතිශයින්ම ප්‍රයොජනවත් බැවින් මේ ගැටපදයෙහි බහුල වසයෙන් දක්නට ලැබෙන එබඳු පාඨයන් ගැන පොත භාවිතකරන ආධුනිකයන් විසින් විශෙෂයෙන් සැලකියයුතු බව කියමු.

“පළාබත්ගල” යන්න පැරණි ආචාර්යවරයෝ 'පුටභත්තසෙල'යී පාලියට නැගූහ. මෙහි 'පළා' යනු 'පුට' පර්යාය යී ගැන්ම ඇතැම් නවීන උගතුන්ට අභිමත නොවේ. එසේද වුවත් 'පණ්ණපුටස්ස අනන්තරෙ, පත්පළා අතුරෙහි' (204,14), 'න පණ්ණාසං තවක්ඛාස බබ මාලාපුටො, මෙ තී සඳහය් බත් මල් පළා නොවෙයි' (204,34) යනාදී මේ ගැටපදයෙහි පැනෙන පාඨවලින් යථෝක්ත පුරාණ පණ්ඩිත මතය සම්පූර්ණයෙන්ම ස්ථිරවේ. මෙහි 'පළා' යනු 'පුට' පර්යාය වූ 'පුටක' ශබ්දයෙන් බිඳී ආවක් ලෙස ගැනීම යුක්තිතරයයි හඟිමු.

'සොහං, අව ඒ තා පිතිම්' (22, 35) 'මුඤ්චාමහං, අව මුජම්' (49,3), 'අහං, අව' (74,13), 'අව ඉක්මැ පැවැතිනාක් නෙපුළ් සහනෙම්' (74,21) යනාදි පාඨවල 'අව' යන උත්තම පුරුෂාර්ථවාචී සර්වනාම පදයක් දක්නට ලැබේ 'කිමඞ්ග පන නාහං පබ්බජිස්සං, කවර කරුණෙන් අව් නොපවජ්නෙම්' (52,2) යන පාඨයෙහි මේ සර්වනාම පදය 'අව්' යී පැනේ. මේ පදයෙහි ප්‍රභවය

නිශ්චය වශයෙන් දැක්විය නොහැකි වුවත් එය 'අම්හ' ශබ්දයෙන් බිඳී ආ බැව් සිතිය හැකියි. 'ඇප්' 'අපි' ශබ්දයන්ද මේ 'අව' නොහොත් 'අවි' යන්නෙන්ම සැදුණු බැව් හැඟේ. 'තෙප්, ශබ්දය හැර 'තුප්' යන මධ්‍යම පුරුෂාර්ථවාචී සර්වනාම පදයක් පැවැතුණු බව 'තුප' (62,30, 221,15), 'තුපම' (62,35) යන විභක්ත්‍යන්ත පදවලින් පැනේ. ස්ත්‍රීලිඞ්ගයෙහි 'තිප්'(226,29)යනු ද දක්නා ලැබේ.

**'ඉදානි කථං ජීවිස්සාමි,** දූන් සම පියොවින් මතු ජෙනුයුම් කීසෙයින් ජෙමි' (29,1), **'අනාවාසා,** වසන තැනක් නැතියුම්' (227;22) **'නිරයගාමිනී,** නිරයට යනු වියුම්' (227,25), **'උක්කණ්ඨිකා,** දූන් හවගහණයෙහි උකැටියුම්' (266,7) යන පාඨයන්හි ම ශබ්ද කාරකයෙහි ස්ත්‍රීලිඞ්ගික 'උම්' ප්‍රත්‍යයක් පැනේ. ධම්පියා අටුවා ගැටපදයෙහි හැර මෙකල පවත්නා අන්‍ය කිසිම පොතක හෝ ශිලා ලිපියක මේ ප්‍රයෝගය අවිද්‍යමානයි.

**'සම්බුද්ධස්ස,** මහසැණින් සියුසස් තුම්හමෙ ජතුවහ' (2,32), **'දරුසාඛපිණ්ඩස්ස,** දරුගැල්ලක්හ' (251,17) යනාදි පාඨයන්හි පාලි භාෂාවෙහි 'ස්ස' යන ෂෂ්ඨී විභක්තිරූපයෙන් බිඳුණු 'හ' ප්‍රත්‍යය දක්නාලැබේ. පැරැණි ශිලා ලෙඛනවල මේ ප්‍රත්‍යය බහුලව ලැබෙන නමුත් දසවැනි ශතවර්ෂයට අයත් ලිපිවල එය නොපැනේ.

මෙසේ බුද්ධධර්මයත් භාෂා ශාස්ත්‍රයත් දැනගැන්මට අතිශයින්ම උපකාරීවන මේ ග්‍රන්ථරත්නය ශතවර්ෂ කීපයක් මුළුල්ලෙහි ලිපි දෝෂයෙන් දූෂිතව බොහෝසෙයින් අභාවිතව පවත්නා කල මීට අවුරුදු තිස්ගණනකට ප්‍රථම උගත් දෙඩම්පහළ සුමඞ්ගල ස්වාමීන් වහන්සේ විසින් කොටසක් ශුද්ධකොට පළකරවනලදී. දෙවැනි කොටස පළකරවන්නට ප්‍රථම උන්වහන්සේගේ අපවත්වීම සිදුවිය. පැරැණි සිංහල භාෂාව සම්බන්ධව ඒ කාලයෙහි පැවැති දැනගැන්ම ගැන සිතා බලනවිට එතොකළ ශුද්ධිය ආධුනික ජනයාට බොහෝසෙයින් ප්‍රයෝජනවත්වූ බව කියයුතුයි. එසේද වුවත් ඉන් මොබ්බෙහි අපේ පුරාණ භාෂාව පිළිබඳව ඇතිවී තිබෙන අවබොධයට අනුරූපව මේ පොත සංශෝධනය කිරීම කාලානුරූප ශාස්ත්‍රීය සඞ්ග්‍රහයක් බැව් කලක පටන් අපට වැටහී තුබූ කල්පනාවකි. සිංහල ශබ්දකෝෂය සම්බන්ධ කර්තව්‍යය ආරම්භවූ පසු සංශෝධිත ධම්පියා අටුවා ගැටපදය මේ කාර්ය්‍යය සඳහා ආවශ්‍යක බැව් පැනුණු හෙයින් උඩ පාත දෙරටින් පොත් ගණනක්

සපයාගෙන මේ ග්‍රන්ථය යථාශක්තීන් ශෝධනය කොට මුද්‍රණය කරවන්ට පටන් ගෙන 1929 අවසානයේදී පිටු 160 කින් යුත් මුල කොටස පළකරවීමු. ඉතිරි භාගයත් ඉක්මනින් ප්‍රකාශ කිරීම අපේ අපෙක්‍ෂාව වූ නමුත් ගතවූ තුන් හතර අවුරුද්ද තුළ පැවැති බලවත් අනවකාශත්වය කරණකොටගෙන මේ කෘත්‍යය මේතාක් පමාවූ බැව් කණගාටුවෙන් සඳහන් කරමු.

මේ ශුද්ධිය සඳහා අපට ලැබුණු පුස්කොළ පොත්වල ලේඛනය* මෙසේයි:—

(1) විද්‍යාලඞ්කාර පිරිවෙන්හි උපආචාර්‍ය්‍ය ධුරයක් දැරූ කලුරිය කළ ඌරුගමුවේ චන්දජෝති ස්වාමීන් වහන්සේගෙන් ලැබුණු පොත.

(2) කොටගේනේ පරමානන්ද විහාරේ පොත්ගුළට අයත් පොත.

(3) හඟුරන්කෙත රජමහ විහාරේ පොත්ගුළට අයත් පොත.

(4) කුරුණෑගල නාගොල්ලේ විහාරයට අයත් පොත.

(5) වැලිතොට අම්බරුක්ඛාරාම විහාරයේ පොත්ගුළට අයත් පොත.

(6) දෙඩන්දූවේ ශෛලබිම්බාරාම විහාරයේ පොත්ගුළට අයත් පොත.

(7) පසියාගල ධර්‍මගුප්ත පිරිවෙනින් ලැබුණු පොත.

(8) දෙඹවල සද්ධර්‍මගුප්ත පිරිවෙනින් ලැබුණු පොත.

මේ පුස්කොළ පොත් සමකර බැලූවිට මුලින් සඳහන්වූ පොත එක පරම්පරාවකටත් අනික් පොත් සතම අන්‍ය පරම්පරාවකටත් අයත් බැව් හැඟේ. දෙවැනිව කී පොත්වල ඇතැම් තැනෙක සුළු අන්‍යොන්‍ය විසදෘශත්වයක් පැනෙනත් ඒ පොත් සතම එක් මුල් පොතකින් ආරබ්ධවූ පරම්පරාවකට අයත් බැව් එක් වැදගත් කරුණකින් නිශ්චිත වේ. එනම් පළමුවැනි අඞ්කයෙන් දක්වන ලද පොත්හි විද්‍යමාන පාඨරාශියක් මේ පොත් සතෙහිම එක ලෙස ඌනව තිබීමයි. දෙඩම්පහළ සුමඞ්ගල ස්වාමීන් වහන්සේ විසින් පළකරවනලද කාණ්ඩයෙහිද මේ ඌනත්වය පැනෙන හෙයින් උන්වහන්සේට ලැබුණු පුස්කොළ පොත්ද මෙලෙසින්ම අසම්පූර්ණවූ බැව් නිසැකයි. එසේ හෙයින් මෙකල පවත්නා ධම්පියා අටුවා ගැටපද පුස්කොළ පොත් සියල්ලක්ම පාහේ අසම්පූර්ණ ගුරු පොතකින් ආරබ්ධවූ පරම්පරාවකට අයත් බැව් පිළිගත

*තවත් ලැබුණු අසම්පූර්ණ පොත් සතරක් මේ ලේඛනයට ඇතුළත් නොකරනලදී.

යුතුයි. කරුණු මෙසේ බැවින් සම්පූර්ණ එක පුස්කොළ පොතක්වත් මේ ශුද්ධිය සඳහා සපයාගන්ට පුළුවන්වීම මහත් සන්තුෂ්ටියට කරුණකි. ලේඛනයේ පළමුවැනි අඞ්කයෙන් නිර්දිෂ්ට මේ පොත අව්‍යක්ත ලිපිකරුවකු විසින් ලියන ලද්දක් බැව් බොහෝ තැන්වල දක්නට ලැබෙන අශුද්ධ පාඨවලින් ප්‍රත්‍යක්ෂවේ. එසේද වුවත් මේ පොතේ ආධාරයෙන් අනික් පොත්වල ඌනස්ථාන රාශියක් පිරවීම පුළුවන්විය. 17, 53, 64, 71, 81, 100, 104, 111, 115, 141, 161, 169, 197, 205 වැනි පිටු කියවා බැලූකල මේ ඌනපූරණයෙහි ප්‍රමාණයත් ප්‍රයෝජනයත් සලකාගත හැකියි.

අපට ලැබුණු පුස්කොළ පොත් එකක්වත් උඩත් පිරිසෙයින් අවුරුදු තුන්සියයකට වඩා පැරණියයි නොසිතමු. ජයවර්ධනපුර රාජධානිය පිළිබඳ ශ්‍රීසමෘද්ධි කාලයට අනතුරුව ඇතිවූ රාජ්‍යවිප්ලවාදිය හේතුකොටගෙන ලක්දිව ශාස්ත්‍රාවබෝධය පිරිහීමට පත්වූ පසු පොත් ලිපිකිරීමෙහි නියුක්තවූවන්ට පසළොස්වැනි ශතවර්ෂයට ඔබ්බෙහි භාවිතවූ ඇතැම් අකුරු සටහන් ඇඳිනගන්ට බැරිවීමෙන් බලවත් වැරදි සිදුවී තිබෙන බව මේ සංශෝධනය සඳහා ධම්පියා අටුවා පොත් පරීක්ෂාකර බැලීමේදී අපට නොඑක්වර ප්‍රත්‍යක්ෂවිය. ශිලාලේඛන ආදි පැරණි ලිපිවල අක්ෂර සංස්ථාන ගැන සැලකීමෙන් එබඳු බොහෝ ලිපිදෝෂ පහකෙළෙමු.

ග්‍රන්ථාවසානයෙහි කර්තෘ සන්දර්ශිත නිගමන වාක්‍යයට අනතුරුව "දළඳා පැවිජියෙම් දහම්පියට අටුවා සත්‍යය එක් හවුරුදුයෙකින් ලීම්" යන පාඨයක් හැම පුස්කොළ පොත්වලම පැනේ. මෙහි 'දළඳ' යන්න ලිපිභ්‍රමයක්යයි සැලකූ අපි එය 'දළනා' යි සකස් කෙළෙමු. මෙසේ යත්කල මේ පාඨය ග්‍රන්ථකර්තෘවූ කාශ්‍යප මහරජ තුමන් විසින් යොදනලද්දක් නොව පසු කාලයෙක්හි පොත පිටපත් කළ දාඨානාග නම් භික්ෂුවක් විසින් එකතුකරන ලද්දක් බැව් වැටහේ. භාෂාරීතිය ගැන සලකා බලන විට එය එකොළොස් වැනි ශතවර්ෂයට මොබ්බෙහි නොවන බැව් හැඟේ. ඉහතින් දක්වනලද පරම්පරා දෙකටම අයත් පොත්වල මේ පාඨය පැනෙන හෙයින් මෙකල පවත්නා සියලුම ධම්පියා අටුවා ගැටපද පොත්වලට දාඨානාග භික්ෂූන් විසින් ලිපිකරනලද පිටපත මුල් ගුරුපොත වූ බැව් සැලකිය යුතුයි.

ධම්පියා අටුවා ගැටපදයෙහි බොහෝ තැන්වල මුද්‍රිත ධම්මපදට්ඨකථාහි පැනෙන පාලි පාඨවලට වෙනස් පාඨ දක්නා ලැබේ. එබඳු වෙනස් තැන් ඒ ඒ පිටුවල අධෝලිපි මගින් දක්වීමු.

ගැටපදයෙහි ආ ඇතැම් පාඨ වඩා මැනවැයි හැඟෙන හෙයින් පෙළ පොත ශෝධනය කරගැනීමටත් මෙය උපකාරී වේයයි හඟිමු.

ශතවර්ෂ ගණනක් මුළුල්ලෙහි කෂ්ටප්‍රායව පැවැතුණු මෙවැනි ග්‍රන්ථයක් එකැවරම ශුද්ධකොට යථාස්ථානයට පැමිණවීම අතිශයින්ම දුෂ්කර කාර්යයක් බැව් කවුරුත් දනිති. ඒ ඇර අපට ඉතාම අනවකාශ කාලයෙක්හි මේ සංශෝධන කාර්යයෙහි නියුක්තවන්නට සිදුවීම සම්පූර්ණ පොත නිකුත් කිරීම අතපසු වීමටත් අපගේත් වර්ණයෝජකයන්ගේත් ප්‍රමාදයෙන් ඇතිවූ දෝෂ බහුලවීමටත් හෙතුභූතවූ බැව් මෙහි සඳහන් කිරීම අපේ යුතුකමකි. මෙවැනි පොත් අලෙවිවීමට සාමාන්‍යයෙන් දීර්ඝ කාලයක් යන බැවින් ද්විතීය මුද්‍රාඞ්කනය අවුරුදු ගණනකට වුවමනා වේයයි නොසිතමු. එහෙයින් පොත භාවිතකරන ආධුනික පක්ෂයේ ප්‍රයෝජනය සඳහා මේ වතාවේම හැකිපමණ සම්පූර්ණ ශුද්ධිපත්‍රයක් සම්පාදනය කරන්නට උත්සාහ කෙළෙමු. එසේද වුවත් මේ ශුද්ධිපත්‍රයට ඇතුළත් නොවූ තවත් බොහෝ වැරදි තැන් හා සංශයස්ථාන ඇතිවිය හැකි බැව් දනිමු. එබඳු තැන් පොත කියවන උගතුන් විසින් අපවෙත දන්වා එවනු ලැබේ නම් එය අනල්ප අනුග්‍රහයක් ලෙස සලකමු.

පණ්ඩිත මාදොවිට ඤාණානන්ද ස්ථවිරයන්වහන්සේ හා ජේ. ඩී. ද ලැනරෝල් මහතාත් මේ සංශෝධන කාර්යය පිළිබඳව විශෙෂයෙන් උපකාරීවූ බැව් මේ ප්‍රස්තාවෙහි ප්‍රකාශකිරීම අපට මහත් සතුටකි.

විද්‍යොදය පිරිවෙන්හි උපආචාර්ය තැන්පත් පණ්ඩිත වැලිවිටියේ සොරත ස්ථවිරයන්වහන්සේ විසින් පොතේ මුල පිටු 85 සම්බන්ධව සම්පාදනය කොට එවූ ශුද්ධිපත්‍රය ඉතා ප්‍රයෝජනවත්වූ බව සතුටුපූර්වකව මෙහි සඳහන් කරමු. ඩී. ඊ. හෙට්ටිආරච්චි මහතා හා පී. වික්‍රමසිංහ මහතාත් මේ ශුද්ධිපත්‍රය තැනීමේදී අපට බෙහෙවින් ආධාරවූ බැව් මෙහිදී කිය යුතුයි.

ධම්පියා අටුවා ගැටපද පුස්කොළ පොත් සපයාදීමෙන් මේ සංශෝධන කෘත්‍යය සඳහා අපට උපස්තම්භකවූ ගිහි පැවිදි මිත්‍ර භවතුන්ට අපේ හෘදයඞ්ගම ස්තුතිය මෙයින් පිරිණමමු.

D. B. J.

1933 සැප්තැම්බර් මස
6 වෙනි දින කොළඹදීය.

# සූචි පත්‍රය.


ප්‍රස්තාවනා ... .. i

සූචිපත්‍රය xx

ශුද්ධිපත්‍රය xxx

ධම්මපදඨකථාගී ග්‍රන්ථාරම්භ ගාථාවර්ණනා 1

## 1. යමක වග.

| | | | |
|---|---|---|---|
| 1 | චක්ඛුපාලත්ථෙර | වස්තු | 8 |
| 2 | මට්ටකුණ්ඩලී | ,, | 18 |
| 3 | තිස්සත්ථෙර | ,, | 25 |
| 4 | කාලියක්ඛිනියා | ,, | 27 |
| 5 | කොසඹෑ | වත් | 29 |
| 6 | මහාකාල මහතෙරුන් | ,, | 33 |
| 7 | දෙව්දත් තෙරුන් | ,, | 35 |
| 8 | සඤ්ජය පිරිවැජ්ජා වත්, අගසවු | ,, | 36 |
| 9 | නඳ තෙරුන් | ,, | 45 |
| 10 | චුන්දසූකරිකයා | ,, | 50 |
| 11 | ධම්මික උපාසකයා | ,, | 51 |
| 12 | දෙව්දත් තෙරුන් | ,, | ,, |
| 13 | සුමනා දේවියා | ,, | 57 |
| 14 | දෙසබා තෙරුන් | ,, | ,, |

## 2. අප්පමාද වග.

| | | | |
|---|---|---|---|
| 15 | සාමවතියා | වත් | 59 |
| 16 | කුම්භඝොසකයා | ,, | 80 |
| 17 | සූළුපන් තෙරුන් | ,, | 81 |
| 18 | බල්සැණ | ,, | 86 |
| 19 | මහකසුප් මහතෙරුන් | ,, | ,, |
| 20 | දෙසබඳ මහණුන් | ,, | ,, |
| 21 | සක් | ,, | 87 |
| 22 | අඤ්ඤතර මහණෙක්හු | ,, | 93 |
| 23 | නිගම්තිස් තෙරුන් | ,, | 94 |

## 3. චිත්ත වග.

| | | | |
|---|---|---|---|
| 24 | මෙඝිය තෙරුන් | වත් | 95 |
| 25 | අඤ්ඤතර මහණුන් | ,, | 96 |
| 26 | උක්කණ්ඨිත මහණු | ,, | 98 |

| | | | |
|---|---|---|---|
| 27 | සඞ්ඝරක්ඛිත බෑණ තෙරුන් | වත් | 98 |
| 28 | චිත්තහත්ථ තෙරුන් | ,, | 99 |
| 29 | අරජ විවසු මහණු | ,, | 101 |
| 30 | පූතිගත්තතිස්ස මහතෙරුන් | ,, | 102 |
| 31 | නන්දගොපාලකයා | ,, | ,, |
| 32 | සොරෙය්‍ය සිටුපුත් | ,, | 103 |

4. පුප්ඵ වග්ග.

| | | | |
|---|---|---|---|
| 33 | පන්සියයක් මහණුන් | වත් | 104 |
| 34 | ඵෙණූපම | ,, | 105 |
| 35 | විඩූඩභයා | ,, | 106 |
| 36 | පතිපූජිකාව | ,, | 112 |
| 37 | මසුරු සිටුහු | ,, | 113 |
| 38 | මාතික ආජීවිකයා | ,, | 115 |
| 39 | ඡත්තපාණි උපාසකයා | ,, | 116 |
| 40 | විසාඛා උපාසිකා | ,, | 117 |
| 41 | අනඳ මහතෙරුන් පැන පුළුවුත් | ,, | 123 |
| 42 | මහසුප් මහතෙරුන් | ,, | ,, |
| 43 | ගොධික මහතෙරුන් | ,, | 124 |

5. බාල වග්ග.

| | | | |
|---|---|---|---|
| 44 | ගරහදින්නයා | වත් | 125 |
| 45 | කොසොල් රජහු | ,, | 126 |
| 46 | මහසුප් මහතෙරුන් | ,, | 128 |
| 47 | අනඳ සිටුහු | ,, | 129 |
| 48 | ගණ්ඨිභෙදක සොරුන් | ,, | 130 |
| 49 | උදා තෙරුන් | ,, | ,, |
| 50 | පාවෙය්‍යක මහණුන් | ,, | 131 |
| 51 | සුප්පබුද්ධ කුෂ්ඨි | ,, | ,, |
| 52 | ඛස්සකයා | ,, | ,, |
| 53 | සුමන මාලාකාරයා | ,, | 132 |
| 54 | උපුල්වන් තෙරින් | ,, | 133 |
| 55 | ජම්බුක තෙරුන් | ,, | 134 |
| 56 | අහිපෙතයා | ,, | 135 |
| 57 | සඞ්කූට පෙතයා | ,, | 136 |
| 58 | සුදම් තෙරුන් | ,, | 137 |
| 59 | වනවාසික තිස් තෙරුන් | ,, | 139 |

## 6. පණ්ඩිතවග.


| | | | |
|---|---|---|---|
| 60 | රාධ මහ තෙරුන් | වත් | 142 |
| 61 | අස්සජි පුනබ්බසු දෙදෙනා | ,, | 143 |
| 62 | සන් තෙරුන් | ,, | ,, |
| 63 | මහාකප්පින මහතෙරුන් | ,, | ,, |
| 64 | පණ්ඩිත සාමණේරයන් | ,, | 146 |
| 65 | ලකුණ්ඨක භද්දිය මහතෙරුන් | ,, | 148 |
| 66 | කාණමාතා | ,, | ,, |
| 67 | පන්සියයක් මහණුන් | ,, | 149 |
| 68 | ධම්මික තෙරුන් | ,, | 150 |
| 69 | ධම්සවන් | ,, | ,, |
| 70 | පස්මහණ් සියන් | ,, | 151 |


## 7. අරහන්ත වග.


| | | | |
|---|---|---|---|
| 71 | ජීවකයන් | වත් | 152 |
| 72 | මහකුප් මහතෙරුන් | ,, | ,, |
| 73 | බෙලට්ඨසීස මහතෙරුන් | ,, | 153 |
| 74 | අනුරුජ් මහතෙරුන් | ,, | 154 |
| 75 | මහකසසින් මහතෙරුන් | ,, | ,, |
| 76 | සැරියුත් මහතෙරුන් | ,, | 155 |
| 77 | තිස් තෙරුන් හෙරණහු | ,, | 156 |
| 78 | සැරියුත් මහතෙරුන් | ,, | 157 |
| 79 | ඛදිරවනිය රෙවත තෙරුන් | ,, | ,, |
| 80 | අඤ්ඤතර ඉත්ථියා | වත්ථු | 159 |


## 8. සහස්ස වග.


| | | | |
|---|---|---|---|
| 81 | තම්බදාඨිකයා | වත් | 159 |
| 82 | දරුසිරි මහතෙරුන් | ,, | 160 |
| 83 | කුණ්ඩලකෙසී තෙරුන් | ,, | 162 |
| 84 | අනත්ථපුච්ඡක බ්‍රාහ්මණයා | ,, | 163 |
| 85 | මිසිල් බමුණ | ,, | 164 |
| 86 | බෑන බමුණ | ,, | ,, |
| 87 | සහායක බ්‍රාහ්මණයා | ,, | ,, |
| 88 | දීඝායු කුමරු | ,, | 165 |
| 89 | සංකිච්ච සාමණේරයන් | ,, | 166 |
| 90 | අතිමුත්තක සාමණේරයන් | ,, | 168 |
| 91 | ඛාණුකොණ්ඩඤ්ඤ මහතෙරුන් | ,, | ,, |

| | | | |
|---|---|---|---|
| 92 | සප්පදාස මහතෙරුන් | වත් | 168 |
| 93 | පටාචාර තෙරින් | ,, | 169 |
| 94 | කිසාගෝතමීන් | ,, | 170 |
| 95 | බහුපුත්තික තෙරින් | ,, | 171 |

## 9. පාප වග.

| | | | |
|---|---|---|---|
| 96 | චූළෙකසාටක බමුණ | වත් | 171 |
| 97 | සෙය්‍යසක තෙරුන් | ,, | 172 |
| 98 | ලාජ දෙව්දූ | ,, | ,, |
| 99 | අනේපිඬු මහසිටාණන් | ,, | ,, |
| 100 | අසඤ්ඤත පරික්ඛාර මහණ | ,, | 173 |
| 101 | බිළාල සිටුහු | ,, | 174 |
| 102 | මහාධන වාණිජයා | ,, | ,, |
| 103 | කුක්කුටමිත්තකස්ස | වත්ථු | 175 |
| 104 | සුනඛ ලුද්දකස්ස | ,, | ,, |
| 105 | මණිකාරකුලූපග තිස්සතෙරුන් | වත් | 176 |
| 106 | තිණ්ණං ජනානං | වත්ථු | ,, |
| 107 | සුප්පබුද්ධ සක්කස්ස | ,, | 177 |

## 10. දණ්ඩ වග.

| | | | |
|---|---|---|---|
| 108 | ඡබ්බග්ගියානං | වත්ථු | 178 |
| 109 | ඡබ්බග්ගියානං (දුතියං) | ,, | ,, |
| 110 | සම්බහුලානං කුමාරානං | ,, | ,, |
| 111 | කුණ්ඩධාන තෙරුන් | වත් | ,, |
| 112 | උපොසථකම්ම | වත්ථු | 179 |
| 113 | අජගර පේතයා | වත් | ,, |
| 114 | මහමුගලන් මහතෙරුන් | ,, | 180 |
| 115 | බහුභණ්ඩික භික්ඛුස්ස | වත්ථු | 182 |
| 116 | සන්තති මහ ඇමැතියා | වත් | 183 |
| 117 | පිලොතික මහතෙරුන් | ,, | 184 |
| 118 | සුඛ සාමණේරස්ස | වත්ථු | 185 |

## 11. ජරා වග.

| | | | |
|---|---|---|---|
| 119 | විසාඛාය සහායිකානං | වත්ථු | 186 |
| 120 | සිරිමාව | වත් | 187 |
| 121 | උත්තරාථෙරියා | වත්ථු | 188 |
| 122 | අධිමානික භික්ඛූනං | ,, | ,, |

| | | | |
|---|---|---|---|
| 123 | රූපනන්දාථෙරියා | වත්ථු | 189 |
| 124 | මල්ලිකා දෙවියා | වත් | 190 |
| 125 | ලාළුදායිථෙරස්ස | වත්ථු | ,, |
| 126 | උදානගාථා | ,, | 191 |
| 127 | මහාධන සෙට්ඨිපුත්තස්ස | ,, | 192 |


### 12. අත්ත වග්ග.


| | | | |
|---|---|---|---|
| 128 | බොධිරාජ කුමාරස්ස | වත්ථු | 192 |
| 129 | උපනන්ද සක්‍යපුත්තස්ස | ,, | 193 |
| 130 | පධානික තිස්සථෙරස්ස | ,, | 194 |
| 131 | කුමාරකස්සපථෙරස්ස මාතුයා | ,, | ,, |
| 132 | මහාකාල උපාසකස්ස | ,, | 195 |
| 133 | දෙවදත්තස්ස | ,, | 196 |
| 134 | සඞ්ඝභෙද පරිසක්කන | ,, | ,, |
| 135 | කාලථෙරස්ස | ,, | ,, |
| 136 | චූළකාල උපාසකස්ස | ,, | 197 |
| 137 | අත්තදත්ථථෙරස්ස | ,, | ,, |


### 13. ලොක වග්ග.


| | | | |
|---|---|---|---|
| 138 | අඤ්ඤතර දහර භික්ඛුස්ස | වත්ථු | 197 |
| 139 | සුද්ධොදනස්ස | ,, | 198 |
| 140 | පඤ්චසත භික්ඛූනං | ,, | ,, |
| 141 | අභයරාජ කුමාරස්ස | ,, | 199 |
| 142 | සම්මුඤ්ජනිථෙරස්ස | ,, | ,, |
| 143 | අඞ්ගුලිමාලථෙරස්ස | ,, | ,, |
| 144 | පෙසකාරධීතරාය | ,, | ,, |
| 145 | තිංස භික්ඛූනං | ,, | 200 |
| 146 | චිඤ්චමාණවිකාය | ,, | ,, |
| 147 | අසදිසදාන | ,, | ,, |
| 148 | අනාථපිණ්ඩික පුත්තස්ස | ,, | 201 |


### 14. බුද්ධ වග්ග.


| | | | |
|---|---|---|---|
| 149 | මාගන්දිය | වත් | 201 |
| 150 | යමකපාටිහීර | වත්ථු | 203 |
| 151 | එරකපත්ත නාගරාජස්ස | ,, | 212 |
| 152 | ආනන්දථෙරස්ස | ,, | 213 |
| 153 | අනභිරත භික්ඛුස්ස | ,, | ,, |

| | | | |
|---|---|---|---|
| 154 | අග්ගිදත්තථෙරස්ස | වත්ථු | 214 |
| 155 | ආනන්දථෙරස්ස | ,, | 216 |
| 156 | සම්බහුලානං භික්ඛූනං | ,, | 217 |

**15. සුඛ වග්ග.**

| | | | |
|---|---|---|---|
| 157 | සාකිය කොලියානං | ,, | ,, |
| 158 | මාරාවට්ටන | ,, | 219 |
| 159 | කොසොල් රජහු | වත් | ,, |
| 160 | අඤ්ඤතර කුලදූරිකාය | වත්ථු | ,, |
| 161 | අඤ්ඤතර උපාසකස්ස | ,, | 220 |
| 162 | පසේනදි කොසොල් රජහු | වත් | ,, |
| 163 | අඤ්ඤතරස්ස භික්ඛුස්ස | වත්ථු | 221 |
| 164 | සක්දෙව් රජහු | වත් | ,, |

**16. පිය වග්ග.**

| | | | |
|---|---|---|---|
| 165 | තිණ්ණං පබ්බජිතානං | වත්ථු | 222 |
| 166 | අඤ්ඤතර කුටුම්බිකස්ස | ,, | 223 |
| 167 | විසාඛාය | ,, | ,, |
| 168 | ලිච්ඡවීනං | ,, | 224 |
| 169 | අනිත්ථිගන්ධ කුමාරස්ස | ,, | ,, |
| 170 | අඤ්ඤතර බ්‍රාහ්මණස්ස | ,, | ,, |
| 171 | දාරකානං | ,, | 225 |
| 172 | අනාගාමිථෙරස්ස | ,, | ,, |
| 173 | නන්දියස්ස | ,, | ,, |

**17. කොධ වග්ග.**

| | | | |
|---|---|---|---|
| 174 | රොහිණියා | වත්ථු | 226 |
| 175 | අඤ්ඤතර භික්ඛුනො | ,, | 227 |
| 176 | උත්තරාය | ,, | 228 |
| 177 | මහාමොග්ගල්ලානථෙර | ,, | ,, |
| 178 | සාකෙත බ්‍රාහ්මණස්ස | ,, | ,, |
| 179 | පුණ්ණාය | ,, | 230 |
| 180 | අතුලස්ස | ,, | 231 |
| 181 | ඡබ්බග්ගියානං | ,, | ,, |

**18. මල වග්ග.**

| | | | |
|---|---|---|---|
| 182 | ගොඝාතකස්ස | වත්ථු | 232 |
| 183 | අඤ්ඤතර බ්‍රාහ්මණස්ස | ,, | ,, |
| 184 | තිස්සථෙරස්ස | ,, | 233 |

| | | | |
|---|---|---|---|
| 185 | ලාළුදායිත්ථෙරස්ස | වත්ථු | 233 |
| 186 | අඤ්ඤතර කුලපුත්තස්ස | ,, | ,, |
| 187 | චුල්ලසාරිකස්ස | ,, | 234 |
| 188 | පඤ්චසත උපාසකානං | ,, | 235 |
| 189 | තිස්ස දහරස්ස | ,, | ,, |
| 190 | පඤ්චන්නං උපාසකානං | ,, | ,, |
| 191 | මෙණ්ඩක සෙට්ඨිස්ස | ,, | 236 |
| 192 | උජ්ඣානසඤ්ඤි ථෙරස්ස | ,, | 238 |
| 193 | සුභද්ද පරිබ්බාජකස්ස | ,, | ,, |

**19. ධම්මට්ඨ වග්ග.**

| | | | |
|---|---|---|---|
| 194 | විනිච්ඡය මහාමත්තානං | වත්ථු | 238 |
| 195 | ඡබ්බග්ගියානං | ,, | 239 |
| 196 | ඒකුදානත්ථෙරස්ස | ,, | ,, |
| 197 | ලකුණ්ටක භද්දියත්ථෙරස්ස | ,, | ,, |
| 198 | සම්බහුලානං භික්ඛූනං | ,, | 240 |
| 199 | හත්ථකත්ථෙරස්ස | ,, | ,, |
| 200 | අඤ්ඤතර බ්‍රාහ්මණස්ස | ,, | ,, |
| 201 | තිත්ථියානං | වත්ථු | ,, |
| 202 | බාලිසිකස්ස | ,, | ,, |
| 203 | සම්බහුලානං භික්ඛූනං | ,, | 241 |

**20. මග්ග වග්ග.**

| | | | |
|---|---|---|---|
| 204 | පඤ්චසතානං භික්ඛූනං | වත්ථු | 241 |
| 205 | පඤ්චසතානං | ,, | 242 |
| 206 | පඤ්චසතානං යෙව | ,, | ,, |
| 207 | තිස්සත්ථෙර | ,, | ,, |
| 208 | සූකර පෙත | ,, | ,, |
| 209 | පොට්ඨිලත්ථෙරස්ස | ,, | 243 |
| 210 | සම්බහුලත්ථෙරානං | ,, | 244 |
| 211 | සුවණ්ණකාරත්ථෙරස්ස | ,, | 245 |
| 212 | මහාධන වාණිජස්ස | ,, | 246 |
| 213 | කිසා ගොතමියා | ,, | ,, |
| 214 | පටාචාරත්ථෙරියා | ,, | 247 |

**21 පකිණ්ණක වග්ග.**

| | | | |
|---|---|---|---|
| 215 | ගඞ්ගාරොහණ | වත්ථු | 247 |
| 216 | කුක්කුටණ්ඩඛාදිකාය | ,, | 250 |

| | | | |
|---|---|---|---|
| 217 | භද්දිය භික්ඛූනං | වත්ථු | 250 |
| 218 | සම්බහුලානං භික්ඛූනං | ,, | 251 |
| 219 | ලකුණ්ටක භද්දියත්ථෙරස්ස | ,, | ,, |
| 220 | දාරුසාකටික පුත්තස්ස | ,, | ,, |
| 221 | වජ්ජිපුත්තක භික්ඛුස්ස | ,, | 252 |
| 222 | චිත්තගහපති | ,, | 253 |
| 223 | චූළ සුභද්දාය | ,, | 254 |
| 224 | ඒකවිහාරිකත්ථෙරස්ස | ,, | 255 |


## 22. නිරය වග්ග.


| | | | |
|---|---|---|---|
| 225 | සුන්දරිකාය | වත්ථු | 255 |
| 226 | දුච්චරිත ඵලානුභවන | ,, | 256 |
| 227 | වග්ගුමුදාතීරියානං | ,, | ,, |
| 228 | ඛෙම සෙට්ඨිස්ස | ,, | ,, |
| 229 | දුබ්බච භික්ඛුස්ස | ,, | 257 |
| 230 | ඉස්සාපකතිත්ථියා | වත්ථු | ,, |
| 231 | ආගන්තුක භික්ඛූනං | ,, | ,, |
| 232 | නිගණ්ඨානං | ,, | 258 |
| 233 | තිත්ථියසාවකානං | ,, | ,, |


## 23. නාග වග්ග.


| | | | |
|---|---|---|---|
| 234 | මාගන්දියා | වත්ථු | 259 |
| 235 | හත්ථාචරියපුබ්බ | ,, | ,, |
| 236 | බ්‍රාහ්මණපුත්ත | ,, | ,, |
| 237 | පසෙනදි කොසල | ,, | 260 |
| 238 | සානුසාමණෙර | ,, | 261 |
| 239 | බාවෙරක හත්ථිනා | ,, | 262 |
| 240 | සම්බහුලානං භික්ඛූනං | ,, | ,, |
| 241 | මාරස්ස | ,, | ,, |


## 24. තණ්හා වග්ග.


| | | | |
|---|---|---|---|
| 242 | කපිලමච්ඡස්ස | වත්ථු | 263 |
| 243 | සූකර පොතිකාය | ,, | 265 |
| 244 | විබ්භන්තකස්ස | ,, | 266 |
| 245 | බන්ධනාගාරොපම | ,, | ,, |
| 246 | ඛෙමත්ථෙරියා | ,, | 267 |

247 උග්ගසෙනස්ස වත්ථු 267
248 දහරභික්ඛුස්ස ,, 268
249 මාරස්ස ,, ,,
250 උපකාජීවකස්ස ,, 269
251 සක්කස්ස පඤ්හවිස්සජ්ජනා ,, ,,
252 අපුත්තක සෙට්ඨිස්ස ,, 270
253 අඞ්කුරස්ස ,, ,,


## 25. භික්ඛු වග්ග.


254 පඤ්චන්නම්පි භික්ඛූනං වත්ථු 270
255 හංසඝාතක ,, 271
256 කොකාලික ,, 272
257 ධම්මාරාමථෙර ,, ,,
258 විපක්ඛසෙවක ,, ,,
259 පඤ්චග්ගදායක බ්‍රාහ්මණස්ස ,, ,,
260 සම්බහුලානං භික්ඛූනං ,, 273
261 පඤ්චසත භික්ඛූනං ,, 274
262 සන්තකායථෙරස්ස ,, ,,
263 නඞ්ගලකුලථෙරස්ස ,, ,,
264 වක්කලිථෙරස්ස ,, ,,
265 සුමන සාමණෙර ,, 275


## 26. බ්‍රාහ්මණ වග්ග.


266 පසාදබහුල බ්‍රාහ්මණස්ස වත්ථු 276
267 තිංස භික්ඛූනං ,, 277
268 මාරස්ස ,, ,,
269 අඤ්ඤතර බ්‍රාහ්මණස්ස ,, ,,
270 ආනන්දථෙරස්ස ,, ,,
271 අඤ්ඤතර පබ්බජිතස්ස ,, ,,
272 සාරිපුත්තථෙර ,, ,,
273 මහාපජාපතියා ,, 278

| | | | |
|---|---|---|---|
| 274 | සාරිපුත්තත්ථෙරස්ස | වත්ථු | 278 |
| 275 | ජටිල බ්‍රාහ්මණස්ස | ,, | ,, |
| 276 | කුහක බ්‍රාහ්මණස්ස | ,, | ,, |
| 277 | කිසාගොතමියා | ,, | 279 |
| 278 | අඤ්ඤතර බ්‍රාහ්මණස්ස | ,, | ,, |
| 279 | උග්ගසෙනස්ස | ,, | ,, |
| 280 | ද්වින්නං බ්‍රාහ්මණානං | ,, | ,, |
| 281 | අක්කොසක භාරද්වාජස්ස | ,, | ,, |
| 282 | සාරිපුත්තත්ථෙරස්ස | ,, | 280 |
| 283 | උප්පලවණ්ණත්ථෙරියා | ,, | ,, |
| 284 | අඤ්ඤතර බ්‍රාහ්මණස්ස | ,, | ,, |
| 285 | ඛෙමත්ථෙරියා | ,, | ,, |
| 286 | තිස්සත්ථෙරස්ස | ,, | ,, |
| 287 | අඤ්ඤතර භික්ඛුස්ස | ,, | 281 |
| 288 | චතුන්නං සාමණෙරානං | ,, | ,, |
| 289 | මහාපන්ථකත්ථෙර | ,, | 282 |
| 290 | පිලින්දිවච්ඡත්ථෙර | ,, | ,, |
| 291 | අඤ්ඤතරත්ථෙරස්ස | ,, | ,, |
| 292 | සාරිපුත්තත්ථෙරස්ස | ,, | ,, |
| 293 | මහාමොග්ගල්ලානත්ථෙරස්ස | ,, | ,, |
| 294 | රෙවතත්ථෙරස්ස | ,, | ,, |
| 295 | චන්දාභත්ථෙර | ,, | ,, |
| 296 | සීවලිත්ථෙර | ,, | 283 |
| 297 | සුන්දරසමුද්දත්ථෙර | ,, | ,, |
| 298 | ජටිලත්ථෙරස්ස | ,, | 287 |
| 299 | ජොතියත්ථෙර | ,, | 285 |
| 300 | නටපුබ්බකත්ථෙර | ,, | ,, |
| 301 | නටපුත්තක | ,, | ,, |
| 302 | වඞ්ගීසත්ථෙරස්ස | ,, | 287 |
| 303 | ධම්මදින්නාථෙරියා | ,, | 288 |
| 304 | අඞ්ගුලිමාලත්ථෙර | ,, | ,, |
| 305 | දෙවහිත බ්‍රාහ්මණස්ස | ,, | ,, |

# ශුද්ධි පත්‍රය.

| පිට. | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 1 | 23 | ලොවුතුන් ලොකියති එපාව .. | ලොවු තුන්. ලොකී යති එපාව... |
| ,, | 26 | පරියුන් | පරියුඅත් |
| 2 | 7 | යෙන බුඩෙන | යෙන [සම්]බුඩෙන |
| ,, | 13 | ගණෙන | ගන්නේ |
| ,, | 18 | විජානෙති | පඬින්ති |
| 3 | 32 | සසරැගි | සසරැ |
| 4 | 2 | ඉධ භික්ඛවෙ ධම්මං පරියා පුණාති සුණාති සුත්තං ගෙය්‍යං | ඉධ භික්ඛවෙ භික්ඛු ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං |
| ,, | 22 | සමුස්සාහිත | සමුස්සාහිතං |
| ,, | 26 | එකංශාජීනි | එකාංශාජීති |
| ,, | 31 | පීතිපාමොක්ඛවඩ්ඩනං | පීතිපාමොජ්ජවඩ්ඩනං |
| 5 | 10 | තස්සහචරිත | තත්සහචරිත |
| 6 | 5 | සීහකුමර | සිහකු මරා |
| ,, | 34 | සක්කච්ච | සක්කච්චං |
| 7 | 5 | නාසාධයති | න සාධයති |
| ,, | 8 | කාරනප්‍රකාර | කාරණ ප්‍රකාර |
| ,, | 10 | සාවභාසා | සාව සා භාසා |
| 8 | 5 | කෙවල ශබ්ද අමිශ්‍රාජීත්තොර් හවුපද මතු විභාවය | කෙවල ශබ්ද අමිශ්‍රාජීති. තොහැවූ පද මතු විභවය් |
| ,, | 15 | ආවහන්තං | ආවහන්තා |
| ,, | ,, | පසාදවත් * | පව [සතුව]න් |
| ,, | 21 | සොදෙව්රි* | සෝදෙරි |
| ,, | 24 | අත්ථධම්මො | අත්ථධම්මා |
| ,, | ,, | උපනිස්සායතිති | උපනිස්සයිති |
| 9 | 5 | අත්ථි | අත්ථි සො |
| ,, | 26 | අනුක්කමෙමය | අනුක්කමෙන |
| 10 | 6 | 'තෙසං'සී | 'තෙ' සී |
| 10 | 17 | කාමනාං | කාමානං |

*මේ ලකුණින් යුත් පාඨ පුස්කොළ පොත්හි පැනෙන විසදෘශ පාඨයෙන් සැලකිය යුතුයි.

| පිට. | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 10 | 31 | විරමගනසෙව | විරවනනසෙව |
| ,, | 32 | පත්ථසෙනාසනනති | පන්තසෙනාසනානි |
| ,, | 33 | සෙනාසනමෙතං | සෙනාසනානමෙතං |
| 12 | 31 | ගරහනු වූ යේසි | ගරහනුවූයේසි. |
| 13 | 14 | සංසුතිවාපචායො | සංසුතිවාපචායො |
| 14 | 3 | නියරි වැසියෝ | පිටිසර වැසියෝ |
| ,, | 32 | විජඹසිංසු | විජඹාසිංසු |
| 16 | 8 | නන්බිණි | නන්බිණී |
| ,, | ,, | එබිණි | එබිණී |
| ,, | 29 | කුසල් | [අ]කුසල් |
| ,, | 31 | අබ්‍යාපාද | අබ්‍යාකත |
| 17 | 17 | නානත්වයෙන් | නානාත්වයෙන් |
| ,, | 26 | ආගනතුකෙ | ආගන්තුකෙහි |
| ,, | 27 | නානත්වයෙන් | නානාත්වනයෙන් |
| ,, | 33 | නානත්වයෙන් | නානාත්වයෙන් |
| 19 | 18 | සහස්ස | සහස්සං |
| 21 | 2 | පුවසයට* | පුසයට |
| ,, | 10 | මෙණාව * | මෙණවි |
| ,, | 23 | බස් | වස් |
| 23 | 14 | කඩවූ | කසවූ |
| ,, | 22 | අනාබෙය්‍යාතිසවැ | අනාබෙය්‍යාතිසයවැ |
| ,, | 35 | හොති | හොති |
| ,, | ,, | හණාති | භණති |
| 25 | 34 | දෙකින් * | දිකින් |
| 26 | 30 | සොපා | සාපෙ |
| ,, | 31 | අනාගතසඤ්ඤණින් | අනාගතංස ඤාණින් |
| ,, | 35 | එම | එම |
| ,, | ,, | අනාගතසඤ්ඤෙණන | අනාගතංස ඤාණෙන |
| 27 | 1 | ‘ප [යම]ඛන් | පඛන් |
| 29 | 15–16 | සඟනට[තැබව] “ආදිකතීකව දෙවූ ප්‍රකාර ආදිකම්මිකානි තානි සලාකගතකානි’සි ... | සඟනට ආදිකතීකව දෙවූ. පකාර ආදිකම්මිකානි. තානි සලාක ගතකානි’සි.. |
| ,, | අබොලිපියෙහි | 11 ආදිකතීකවූ... සැලකිය යුතුයි. | 11 ආදිකම්මිකානි |

| පිට. | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 35 | 17 | නිසිය | ණිසිය |
| ,, | 30 | තෙ සම්මතෙ | තෙසං මතෙන |
| 38 | 9 | නිබ්ඬ-උපයා | නිබ්බිද උපයා |
| ,, | 27 | සිඳ-පුදබලනුවම | සිඳු පුදු බලනුවම |
| ,, | 33 | වාසියැ | වාසිය |
| 39 | 7 | නොවැසියාමනා | නොසියමනා |
| 40 | 2 | හැසිරෙ වෙයි | හැසිරෙවයි |
| ,, | 25 | සවපැරැම්සඳැණග* | සවුපැරැම්සැණහ |
| ,, | 27 | සඳැණවෙසෙස්හි* | සැණවෙසෙස්හි |
| 42 | 4 | පටිඡගනතා | පටිජගහතා |
| ,, | 16 | මුළුලොවටචූ | මුළුලොවට චූ |
| 43 | 12 | අගරෙයා | ආගරෙයා |
| 44 | 9 | නුසිතා | නිසිතා |
| ,, | අධොලිපිසෙසි | 5 නිසිතා | 5 නුසිතා |
| 45 | 20 | එළ | එළං |
| ,, | 22 | සමගනතා | සම්මගනතා |
| 46 | 10 | චන්දකිණණර | චන්දකිනනර |
| ,, | 33 | වට්මුළු | වට්මුලු |
| 47 | 15 | ගිනායා | ගිනාය |
| ,, | 30 | බුම්සරුැත් | බුම්සරිත් |
| 48 | 16 | බිණජාති | බිණා ජාති |
| ,, | 23 | ගිනියෙනසේ | නියෙනසේ |
| 49 | 9 | නණයනටු | තාණහනටු |
| 51 | 10 | වුටු * | ශුටු |
| ,, | 31 | දෙන්හයි | දෙහැයි |
| ,, | ,, | එාලෙයා | එලෙයා |
| 52 | 11 | දැකයුතු * | දැකිඅැයුතු |
| 54 | 4 | අනනගවලන | අනනගවලන |
| 55 | 2 | සුවකටැයෝ | සුකටැකියෝ |
| ,, | ,, | මේ උදන් ධම්- සංවෙනෙන් | මේ උදන්- ධම සංවෙනෙන් |
| ,, | 11 | දන්නාට* | දන්නට |
| ,, | ,, | සලහක විවම කස කණණ ජපපන | ගුලහක විවමස සකණණ ජපපන |
| 56 | 1 | සුවිනිනං | සුවිනිතං |

| පිට. | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 56 | 4 | මයුරගිම | මයුරගිව |
| ,, | 23 | පියපිහි | පියපි. |
| ,, | ,, | ආයාජිතබබ | අයාචිතබබ |
| 58 | 7 | මහණ | මහා |
| 60 | 2 | බ්‍යසසති | බ්‍යසති |
| ,, | 8 | සු* | පිසු |
| ,, | 10 | පුනකදූරා | පුනාකදූරං |
| ,, | 35 | අසමහාවයට | අසමහවයට |
| 62 | 4 | පිතුසනානිකං | පිතුසනාකකං |
| 63 | 27 | ආ ඇත ජකම්නු | ආ ඇතජ කම්නු |
| 67 | 3 | පමුඛසහන | පමුඛපසහන |
| 68 | 1–2 | බාරොදකං | බාරොදක |
| 69 | 25-26 | නොමිසැම | නොකිමිසැම |
| 71 | 1 | මොනු | මොන |
| ,, | 14 | රාග | රගා |
| 72 | 9 | විකබාලාපෙනා | විකබාලාපෙනා |
| 73 | 10–11 | මාලාවිය | මාලාවිය |
| 75 | 26 | නගනුව* | නගනුව |
| ,, | 33 | පස්මාත්* | පස්මත් |
| ,, | අවබාලිපියෙසි | නගනුව | නගනුව |
| 76 | 22 | සසර නියරැ සයන් | සසර නියර සමන් |
| ,, | ,, | ගිනින් දුම්අත් බැමුජ් | සඳණින් නොදුත් |
| ,, | 23 | කියත් | බැමින් කියත් |
| ,, | 30 | කාජිගෘව නහාකජීශව ඇ සවනුයි බඳුම | කජිගශි හෝ 'බබ' මනු බඳුම[?] |
| 79 | 5 | බොතහෝතුජ් | බොහෝවතුජ් |
| ,, | 23 | මානා | මානු |
| ,, | 30 | දුලෙලනක | දුලෙලහක |
| 80 | 4 | අනිමානක | අනිමානක |
| ,, | 9 | නොගෙජයි | නොගෙයගෙජයි |
| 81 | 16 | කදුමෙන් | කදුගමින් |
| 82 | 21 | එරමැටිමැ | එරවිනැටිමැ |
| 84 | 22 | ඇමගක | ඇමගක |
| ,, | 28 | හෙජක* | තජක |
| 85 | 19 | බඳු | බඳු |
| ,, | 20 | බඳුම | බඳුය |

| පිට. | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 85 | 27 | මහනෙත | මහතෙත |
| 86 | 22 | අනුවෂ්ජිකං | අනුවජ්ජිකං |
| ,, | 24 | පණිණ | පණීත |
| 87 | 18 | ජවං | [ශනන] ජවං |
| ,, | 19 | සුණුදව | සුනු දව |
| ,, | 27 | බදුයෙක් | බද්‍රුයෙක් |
| 88 | 10 | කුලජෙඨාපචායී | කුලෙ ජෙට්ඨාපචායී |
| 89 | 1 | කුලජෙඨා | කුලෙජෙට්ඨා |
| 90 | 19 | පිඹිබජ්ජක | පිඨබජ්ජක |
| 91 | 4 | ගෙනූන | ගෙනූණ |
| 92 | 5 | අගතාගතානං | ආගතාගතානං |
| 94 | 26 | හ්‍රමණ | භ්‍රමණ |
| 96 | 32 | සලක්නු | සළක්නු |
| 97 | 20 | සිහිය | සැහිය |
| ,, | 32 | මාතිකාමාතු | මාතිකමාතු |
| 99 | 1 | පහඬො | පහටො |
| ,, | 5 | සම්පටිවජනජාතකං | සම්පටිවජනකජාතිකං |
| 100 | 12 | බත් | බක් |
| ,, | 28 | අළලත | අලළත |
| 101 | 23-24 | කොටවෙහි* | කොවෙහි |
| 102 | 1 | පූතහූත | පූතිහූත |
| ,, | 34 | උවාරන් | උවාරණ් |
| 103 | 27 | නන්දශොපාලකයා | නන්දගොපාලකයා |
| 104 | 14 | අළලයි | අලළයි |
| 108 | 15 | ඇතියා | ඇතීයා |
| ,, | 16 | ,, | ,, |
| 111 | 16 | ඛීරපාකෙ | ඛීරපායකෙ |
| 117 | 20 | ඇළලිය | ඇලළිය |
| 119 | 8 | ඊසු | වීසු |
| ,, | 3 | පිළියෙළ | පිළියෙල |
| ,, | 16 | ආතතාවිතතං | ආතතවිතතං |
| 120 | 8 | කාලකණ්ණිං | කාළකණ්ණිං |
| ,, | 19 | උවාරන් | උවාරණ් |
| 121 | 15 | හණී ඇලුයෙහි | හිණී ඇළුයෙහි |
| 124 | 25 | විසින් පසලද | විසින්. පසලද |
| 126 | 3 | සුණුයෙන් | සුනුයෙන් |

| පිට | පෙළ | අශුබ | ශුබ |
|---|---|---|---|
| 127 | 25 | පිඹිබජ්ජක | පිඨබජ්ජක |
| 129 | 3 | චුලසීලං | චූලසීලං |
| ,, | 8 | ධුතුගුණා | ධුතගුණා |
| 131 | 14 | 4 නගරසොහනිං | නගරසොභිනිං |
| ,, | 15 | ,, | ,, |
| 132 | 21 | අකාරයකින් | ආකාරයකින් |
| 133 | 2 | වරු | වරු |
| 134 | 8 | මීලහං | මීළහං |
| 136 | 31 | ඇසකු | අසකු |
| 137 | 3 | මුළු | මූලු |
| 139 | 11 | කුමෙ | කුමෙ |
| ,, | 11-12 | ඔවිනිචා | ඔවිනිච්චා |
| 142 | 1 | සතර | සකර |
| 143 | 17 | උපන්න | උප්පන්න |
| 144 | 19 | යෙන්මැයි | යෙත්මැයි |
| 145 | 17 | සුමුටුහානි | සුමුටුගැනි |
| ,, | 2 | ඔණත | ඔනත |
| ,, | 30 | සච්ඡකිරියාභිසමය | සච්ඡිකිරියාභිසමය |
| 148 | 15 | හැජ | හැජ |
| 149 | 6 | පිණිවි | පිණිස්වි |
| ,, | 30 | ආජානීයා | ආජානීය |
| 151 | 2 | සක්කායි | සක්කාය |
| 152 | 17 | බිලි | බිලී |
| ,, | ,, | මඳකුච්චං | මඳකුච්ඡිං |
| 159 | 16 | සොතාචාර | සොතාචාර |
| ,, | 21 | විතරාගා | වීතරාගා |
| 160 | 14 | අධාහාර | අධ්‍යාහාර |
| ,, | 34 | එකරත්තිවාසෙන | එකරත්තිවාසෙන |
| 161 | 1 | ඔණත | ඔනත |
| 162 | 18 | මම | මමං |
| 164 | 13-14 | භාවිතනකහම | භාවිත තැනක්හම |
| 166 | 22 | පිරිහුන්* | පිරියුන් |
| 167 | 1-2 | එළබීමයැයි | එළවීමයැයි |
| ,, | 4 | වාලිකාය | වාලිකා |
| ,, | 24 | කිළිලක් | කිළිලක් |

| පිට | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 168 | 3 | බිණි | බිණී |
| ,, | 11 | එතන | එතැන |
| ,, | 21 | කූමෙ, කූළෙක්හි | කූමෙ, කළෙක්හි |
| 171 | 18 | සුමුවු³නැතිරිවින් | සුමුවුහැතිරිවින් |
| ,, | අධොලිපියෙහි | 3 මෙය විමසියයුතුයි | (ලොප්කරනු) |
| 172 | 20-21 | ජඬසිකං | ජඩඩසිකං |
| 175 | 8 | සණින් | ණින් |
| 176 | 15 | සියකින් | සියතින් |
| 177 | 30 | ආධ්‍යාහාර | අධ්‍යාහාර |
| 178 | 13 | ඡබ්බසියානං | ඡබ්බග්ගියානං |
| ,, | 21-22 | සමාදිට්ඨ | සාමං අක්ඛීහි දිට්ඨං |
| 179 | 32 | පේසත්නු | පේයක්නු |
| 181 | 2 | පුරිසසාත | පුරිසඝාත |
| 184 | 34 | ආධ්‍යාහාර | අධ්‍යාහාර |
| 185 | 25 | විරත | වීරත |
| 186 | 23 | ආහාරති | ආහරති |
| 187 | 8 | පිළි | පිළී |
| 188 | 30 | අනුවජ්ජිකං | අනානුවජ්ජිකං |
| 190 | 10 | ඔදගතපොය | ඔදහතපොය |
| 191 | 24 | පච්චෘයාදි | පච්චයාදි |
| 194 | 4 | සනෙතාස | සනෙතාස |
| 198 | 12 | 4 සත්හිඳුවත්නට | 4 සත්වත්නට |
| ,, | අධොලිපියෙහි | 4 සත්වත්නට | 4 සත්හිඳුවත්නට |
| 201 | 16 | පූජා | පූජා |
| ,, | ,, | අගා | අග |
| 203 | 33 | සපපාදිනි | සුපපාදිනි |
| 205 | 9 | ධජභූතං | ධජභූතං |
| 209 | 22 | මිණිසොපානං | මණිසොපානං |
| 211 | 21 | ඇත් | අත් |
| ,, | 28 | නුවන් | නුවණ |
| ,, | 34 | 154 | 150 |
| 212 | 2 | එරකපතතං | එරකපත්තං |
| 214 | 1 | කතිසක්ඛරා | කති [වි] සක්ඛරා |
| ,, | 22 | මානතුඛතාය | මානත්ථඛතාය |
| 215 | 35 | සැදුන් | සැදුණ |

| පිට. | පේළි | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 216 | 20 | අග්ගිදත්තපොරස්ස වත්‍ථු | 154 අග්ගිදත්තපෝරස්ස වත්‍ථු |
| 218 | 33 | පරියෙසනස්සුකො | පරියෙසනුස්සුකො |
| 220 | 30-31 | අභිවන | අභිභවන |
| 223 | 23 | කසී | කසි |
| 228 | 34 | උඨහි ත්වා | උඨහිත්වා |
| 229 | 28 | දියඩ්ස | දියඩ්ඨ |
| 233 | 2-3 | වලුකොටැ | වළුකොටැ |
| 235 | 21 | සිලාසයාම් | සිලාසායාම් |
| 237 | 27 | රූපානී | රූපානි |
| 238 | 28 | ආනරාමෙසු | ආරාමෙසුං |
| 239 | 11 | පඨවි උද්‍රියන | පඨවි උද්‍රියන |
| 240 | 21-22 | මුළුවැසුන් කල්හි | මුළුවැ හුන්කල්හි |
| 245 | 8 | පිළිගා | පිළිහා |
| ,, | 26 | පිළිනිමිත්නි | පිළිහා නිමිත්ති |
| 247 | 26-27 | යූයේසි | යූසේසි |
| 248 | 20 | මහභිණික්මන් | මහභිනික්මන් |
| 249 | 11 | පකුසසවා | එකුසසවා |
| 250 | 18 | බැඳ | හැඳ |
| ,, | 32 | සම්පඤ්ඤං | සම්පජඤ්ඤං |
| 251 | 17 | දරුකැල්ලක්හ | දරුගැල්ලක්හ |
| 255 | 18 | චූලසුභද්‍රය | චූළසුභද්‍රය |
| 256 | 24 | වග්ගුමුදා තිරියෙ | වග්ගුමුදා තීරියෙ |
| ,, | 30 | වග්ගුමුදා තිරියාතං | වග්ගුමුදා තීරියාතං |
| 265 | 26 | අනුයමානි | අනුසමානි |
| ,, | 36 | හවටි | කවටි |
| 267 | 25 | අනන්තා රන්තරෙ | අනන්තරන්තරෙ |
| 270 | 11 | දුතියකං | දුතියකං |
| 271 | 2 | තක්කසිලාජනස්ස | තක්කසිලාජාතකස්ස |
| ,, | 8 | කාය [5] විඤ්ඤාණදු | කාය [5] විඤ්ඤතුදු |

| පිට. | පෙළ | අශුද්ධ | ශුද්ධ |
|---|---|---|---|
| 271 | 9 | විසැඳෑණ | විසැඳෑනති |
| ,, | ,, | විසැඳෑනතවතුත්‍රා | විසැඳෑනතිවතුකා |
| ,, | අධොලිපියෙහි | 5 විසැඳෑතුදු | 5 විසැඳෑණදු |
| 272 | 25 | අඩබුන් | අඩබුන් |
| 274 | 13 | අනතමෙ | අනතමො |
| 279 | 3 | සාඝනතං | ඝායනතං |
| 283 | 31 | යුමෙයේසි | යුමෙස්සි |
| 284 | 9 | සුණු | සුනු |
| ,, | 18 | යුමෙයේසි | යුමෙස්සි |
| 286 | 6 | පතොාදලසිං | පාතොාදලසිං |

# ධම්පියා අටුවා ගැටපදය.

**නමො තස්ස භගවතො අරහතො සම්මාසම්බුද්ධස්ස.**

ගත් [1]වියඛ්‍යාන් කරන ඇදුරක්හු ගත් පූහායෙහි පළමු [2]තුනුරුවනට නමකර කටයුතු බැවින් කුදුගත්නිකායෙහි සවිසි[3]වැගෙකින් සරහා තබනලද [4]ධම්මපද පාලියට සංවණ්ණනා කටැටි බුදුගොස් තෙරණුවෝ [5]පළමු නමාඝී තුනුරුවනට නමස්කාර කෙරෙමින්

“මහා මොහ තමොනුදෙ ලොකෙ ලොකන්තදස්සිනා” යනාදී යුතු.

**මොහ** යනු [6]අවිජ්ජයෙහි [7]සඤ්ඤ; **තම** යනු අඳුරුයෙහි සඤ්ඤ; මෙතැන් දෙජ් අවිජ්ජමෙ කියා. අවිජ අරමුණුහි මුළාවන අටින් මොහ නම් වෙයි; අරමුණු පිළිසොයන අටින් තම නම් වෙයි. ‘මොහොව සො තමොචා ති මොහතමො’යි කම්ධර සමස්; නොහොත් ‘තමොවිය මොහො මොහ තමො’යි උපමා සමස් එවි. මෙසේ කියන් **තම** ශබ්දයෙන් අඳුරු මෙ කියා. තම බඳු මොහ **මොහතම** යනු වෙයි. [8]මොහතම මැ මහා විෂයවන බැවින් එවි මහා පටිපක්ඛ වන බැවින් එවි ‘මහා මොහ තම’ නම්. මුළු නෝ [9]පිළිසෙයන බැවින් මහාවිෂය වේ. රාත් මහ සැණින් මෙ පැහෙන් බැවින් මහාපටිපක්ඛ වෙයි. මහාව සො මොහතමොචාති මහාමොහ තමො, තෙන ඔනුදො පරියොනුදොති මහා මොහතමොනුදො, තස්මිං **මහාමොහ තමොනුදෙ**, මහත් මොහ අඳුරුයෙන් වළඳනා ලජ්ජයෙහි– අඳුරු බඳු මහත් මොහෙන් වළඳනා ලදුයෙහි එවි. **ලොකෙ**, ලෙවු හිය ‘සබ්බම පජ්ජොතො ජාලිතො’ යනුව හා සබඳ. ලොවු තුන් ලෝ කියති. ‘එකව සුභා සුභං [10]තං ඵලංච’ යි ගත සත් ලොවු. ‘ලුජ්ජති පලුජ්ජති’ යි ගත සබරලොවු. ‘ලොකීයනති එතු ථාවර ජඞමා’යි ගත බජුන් ලොවු. මෙහි සත් ලොවු ගන්නේ අනුසය පරියුන් වීතික්කම විසින් පරියොනහනය එහි ලැබෙන් බැවින්. තුන් විධීන් සිටි [11]ලොවුජ් ගණනෙ මෙ[එ]වි සැණ ඇස් වරා හැමජ මොහ අඳුරු පිළිසෙයන බැවින්.

---

1 ව්‍යකෑන්. 2 තුනුරුවන්ට. 3 වගකින්. 4 දම්පියා පෙළව. 5 පළමුව නමා, පළමු නවාඝී. 6 අවිජයෙහි, අවිජ්ජයෙහි. 7 සංඥා. 8 මොහතමාම. 9 පිළිසේයන, පිළිහෙයන, පිළිසොයන. 10 අපට ලැබුණු හැම පුස්කොළ පොත් වලම “ත පථංච’ යි ඇතේ. 11 ලොවුජන්, ලොවුජණ්.

ලොකනත දසසිනා, ලොවත් දක්නාවුනු විසින්. 'ලොකනතං [1]පසසතීති ලොකනතදසසී' යනු වේ. මෙහි 'ලොකනත' නම් නිවන්—

“නච අපපතවා ලොකනතං දුකඛා අතථි පමොචනං”

යන තන්හි සෙයින්. යෙන, යමක්හු විසින්. මතුයෙහි 'සම්බුඩසස' යනු කරණ වචනයෙන් විපරිණාම කොට මේ හා යොජනු 'යෙන බුඩෙන' යි. සඩමමපජෙජාතො, සදම්පහන්. 'සඩමෙමා එව පජෙජාතො සඩමමපජෙජාතො'; නොහොත් 'පජෙජාතො විය සඩමෙමා සඩමම පජෙජාතො' යි උපමිත සමස්. මෙසේ හොත් 'පහන් බදු සදම්' යනු වෙයි. සඩමම දෙ වේ—ආගම අධිගම විසින්. බුදු වදන් ආගම සඩමම වෙයි, මග පල නිවන් අධිගම සඩමම වේ. දෙජ් 'සතං ධමෙමා සඩමෙමා සනෙතා පසතෙථා ධමෙමාතිපි සඩමෙමා' යි [2]ගණනෙ. [3]ජාලිතො, බබුළුවනලද[ද]— පුවසනලදද යුසේයි. “වෙ මෙ භිකඛවෙ අනතා පබබජිතෙන න සෙවිතබබා” යි යෙමින් ආගම සඩමම [4]බැබැළුවුහ. කොණඩඤඤතෙරුන් මගපල උපයමින් අධිගම සඩමම [4]බැබැළුවුහ. ජලිතිඩිනා, ජුලු ඉධ ඇතියනු විසින්. 'ජලිතා ඉඩි යසස සො ජලිතිඩි'. විජානෙති පටා ජිලි යෙමින් අවුජ් ඉධපාධමුන් රහත්එල සමග කෙළපත් බැවින් එකෙණෙහි මෙ බුදුහු 'ජලිතිඩි' නම් වෙති. නොහොත් බෝමඩ නෑසමම්හි ගඩඹමුල ඉඩිවිධ [5]ඤණ වෙසෙසින් පැවැති බැවින් 'ජුලු [6]ඉඩිවිධ ඤණ ඇතියනු විසින්' යනු වේ. මෙයින් බුදුන් කවර ගුණ කියුහයත්? සවාජ්ථ සමපතති ගුණ හා පරාජ්ථ පුතිපතති දෙගුණ කියුහ. 'ලොකනත දසසිනා ජලිතිඩිනා' යනුයෙන් සවාජ්ථසමපතති ගුණ කියුහු. 'සඩමමපජෙජාතො [3]ජාලිතො' යනුයෙන් පරාජ්ථ පුතිපතති ගුණ කියුහු. දෙගුණෙන් බුදුන් පුණාමාරහසේ දක්වා දූන් පුණාම කෙරෙති—

'තසස පාදෙ නමසසිතවා සමබුඩසස සිරිමතො' යි.

තසස පාදෙ—තසස, [7]එනු; පාදෙ, පාසහළුවන්—උපයොග බහු වදන්; නොහොත් පාදෙ, භුමෙමකවචන හෙ. නමසසිතවා, වැද. “තිසෙසා වනදනා—කායෙන වාචාය මනසාච”. මෙහි තුනුජ් යෙදේ. සමබුඩසස, මහඤණින් සියුසස් තුමහමෙ ජතුවන. 'බුජඣිතා සචචානීති බුඩො'. නොහොත් සමබුඩසස, දෙසුන් ඤණින් සියුසස් මුළුලෝ [8]දැන්වු[ව]හ. 'බොධෙතා පජායාති බුඩො'. නොහොත් සවඤණින් මුළුනේ ජතුවහ—

1 දසසතිති. 2 ගණනි. 3 ජලිතො. 4 බැබුළුවුහ. 5 ඤාණ. 6 ඉඩිපුබබවිඩඤණ. 7 එවිනු, ඒ බුදුහු. 8 දූන්වුහු.

“සබ්බං අභිඤ්ඤාසි යදත්ථි ඤෙය්‍යං
තථාගතො තෙන සමන්ත චක්ඛු”.

**සිරීමතො,** සිරි ඇතියහ—සැපත් ඇතියහ යුසේයි. සැපත් සතර ඤණ පහන් අනුභවුරුස් සුව විසින්. ‘සිරි එතස්ස අත්ථීති සිරිමා, තස්ස සිරිමතො’. ඊකාර ගාථානුරක්ඛන සඳහා [1]දිගි. මෙසෙයින් බුදුනට නමකර දක්වා දැන් [2]ධමුරුවනට නමකර කෙරෙති ‘සද්ධම්මස්ස පූජෙත්වා’යි. **අස්ස සද්ධම්මෙච,** ඒ සවැඤුනු සබඳ මඟපල නිවන්. ‘අස්ස’ යනු නිමිත්ත නෛමිත්තික සම්බන්ධයෙහි සාමිවචන. මඟ [3]භවුන් හා ඵල නිබ්බානසච්ඡිකිරියයෙන් බුදුවූ බැවින් සධම් එවුනට නිමිත්ත වෙයි, තෙමේ නෛමිත්තිකවේ. මෙයින් ධර්මරත්නයෙහි බුද්ධභාවහෙතුත්ව ලක්ෂණ ගුණ දක්වා ප්‍රණාමාරභසේ [4]කියූ වෙත්. **පූජෙත්වා,** පුද. මෙයින් ධමුරුවනට නමසකාර දක්වා දැන් සඞ්ඝරත්නයට නමකර දක්වති ‘කත්වා සඞ්ඝස්ස අඤ්ජලිං’ යි. ‘අස්ස’ යනු ඈරැ යොජනු. **අස්ස සඞ්ඝස්ස,** ඒ සවැඤුනු සවු සඟහට. මෙයින් ඔවුනු ඵුරෙයිඳ ආබවු කියා ප්‍රණාමාරභසේ දක්වුනුයි. ‘සීලදිට්ඨි සාමඤ්ඤෙන සඞ්ඝටිතත්තා සඞ්ඝො’. [5]සෙබදුහොතුජ් අටඅරිපුහුලෝ සීලාදී ගුණෙන් ‘සඞ්ඝ’ නම් වෙත්. නො අරිපුහුල් හොතුජ් තථාභාවයට පිළිපන් බැවින් පොථුජ්ජනික සඞ්ඝද සඞ්ඝමෙ වෙයි.

මෙසේ තුනුරුවනට නමකර කොට දැන් තමන් [6]වියක්ඛ්‍ය කමැති ගත් දක්වති ‘තං තං කාරණමාගම්ම’ [7]ඉච්චාදී. **තං තං කාරණ මාගම්ම,** ඉඳුනොපකමඳුන අකබිහෙදන ඈ ඒ ඒ කරුණු පිණිස. ‘යං ධම්මපදං දෙසෙසි’ යනු සබඳ. **ධම්මා ධම්මෙසු කොවිදො,** කුදු මහත් ධම්හි සෙවු. ලොවිලොවුතුරා ධම් කුදු මහත් ධම් නම්. නොහොත් **ධම්මාධම්මෙසු,** කුසල් අකුසල් [8]ධම්හි. නොහොත් **ධම්මාධම්මෙසු,** කුසල්කම්පථ ධම් හා අකුසල්කම්පථ ධම්හි. නොහොත් **ධම්මාධම්මෙසු,** ඉටානිටු විවාට කරුණු හා නො කරුණෙහිය. **සම්පත්තසද්ධම්මපදො,** සපත් සධම් පිහිට ඇතියෙ. ‘සද්ධම්මො එව පදං සද්ධම්මපදං, සම්පත්තං සද්ධම්මපදං යෙන සො සම්පත්ත සද්ධම්මපදො’. නව ලොවුතුරාධම් [9]දුගීගතිගා සසරැහි නොහිය දෙනුව පිහිටවන බැවින් ‘සද්ධම්මපද’ නම් වේ. ඒ සපත් බැවින් [10]සථර ‘සම්පත්ත සද්ධම්මපද’ නම් වී. නොහොත් **සද්ධම්ම** නම් දෙසනා.[11]**පද** නම් එට කරුණු දෙසුන් ඤණ හා සවැඤුනු ඤණ. ‘යානත්තාය

1 දිඝ්. 2 දමුරුවනට. 3 භවුන. 4 දැක්වුහු. 5 මෙයද විමසිය යුත්තකි. පුස්කොළ පොත්වල ‘සෙඛුබහොතුජ්’, ‘සෙඛුකහොතුජ්’, ‘සෙඛුක්ඛ හොතුජ්’යි පැනේ. 6 වියක්ඛ්‍යන්. 7 ඉසාදී. 8 දෙ ධම්සි. 9 දුගීතිග. 10 සතර 11 ධම්මපද.

මුඛෙන විනෙය්‍යජනං සාසති අනුසාසතීති සත්‍ථා'. **ධම්මපදං,** ධම්පියා. **ධම්ම** ශබ්ද 'පාළි' කියයි—"ඉධ භික්ඛවෙ ධම්මං පරියාපුණාති සුත්තං ගෙය්‍යං" යනාදී තන්හි සේ. **පද ශබ්ද** 'පිහිට' කියයි— 'සන්තිපදං' යන තන්හි සේ; 'කොටස්' එවු කියයි—'නස්ස නත්‍ථ ධම්මපදා අපිලාපනති' යන තන්හි සේ. 'ධම්මොච සො පදංචාති ධම්මපදං'. [1]ධම්ජු හෙමෙවයි පෙළ අපින් පියෙ හෙ මෙවයි පිහිට අපින් හා කොටස් අපින් 'ධම්මපදං' යනු වේ. පිහිට අට නම් ගතුවනු දුගීහා සසරැ නොහිය [2]දෙන අට. කොටස් අට නම් පෙළධම්හි අවයව් අට. රත්පැහැ සෙසු මල්හි ඇතද රත් මල් යුව එක්මෙ මලක් ගැනෙන බැවින් මෙ [3]අරුත් හැමයට සාමාන්‍ය හොතුදු මෙතෙන 'ධම්මපදං' යනුයෙන් [4]තුන්සියක්වත් පිණිස දෙසූ සතරසිය දෙව්සි ගයෙක්ද හෙමෙ ගැනේ. **සුභං,** හොබවන. 'සොභතීති සුභං'. අදුරු විධමා හොබනා සුරක්හු සෙයින් [5]විනෙ සතන්හි කෙලෙස් විධමා හොබවන බැවින් එව් උත්තාන පදබ්‍යජනහා ගම්භීරාර්‍ථ ඇතිවන බැවින් එව් [6]ශ්‍රැතිරම්‍යව විමද්දක්ෂම බැවින් එව් 'සුභ' නම්. 'යං' යනු මෙයට ඇරැ 'යං ධම්මපදං සුභං' යි යොදනු. **දෙසෙසි,** දෙසිය යු තන්. 'කිරති කිණාති කරොතීතිවා **කරුණා'.** පරහට පත් දුක් දුරුලයි එව් නහයි එව් [7]පරහට දික සාධූන් කපවයි එව් [8]'කරුණා' නම්. 'කරුණාය **ආවෙගො,** පරදුක්ඛ දස්සනෙ තුරිතතා කරුණාවෙගො, තෙන සමුස්සානිත මානසං යස්ස සො කරුණාවෙග සමුස්සාහිත මානසො'. දුනුදිය වෙනෙන් ජුවන කඩසෙයින් [9]කුලුණු වෙනෙන් සත්විහර විහිජ දෙසුන් ඤණපිට දුවන බැවින් බුදුහු 'කරුණාවෙග සමුස්සාහිත මානසො' යි කීවෙත්. 'වෙ' යනු පදපූරණහි නිපාතයි. නොහොත් [10]එකංශාර්‍ථහි එව්. [11]එකායනා [ය] කරුණාය සමුස්සාහිත මානසො.' යු සේයි. බුදුන් නාග සුපර්‍ණාදීන්ට දෙශනාකරතුදු අධිගමාරහයන් ගෙනැ 'දෙව මනුස්සානං' යුහු. 'දිබ්බන්තීති දෙවා, මනස්ස උස්සන්නත්තා මනුස්සා, දෙවාච මනුස්සාච දෙවමනුස්සා'. 'තෙසං දෙවමනුස්සානං' යනු 'දෙසෙසි' යනුවහයිද් 'පීතිපාමොජ්ජවඩ්ඪනං' යනුවහයි [ද්] සබඳි. 'පීතිච පාමොජ්ජංච පීතිපාමොජ්ජං, තං වඩ්ඪෙතීති පීතිපාමොජ්ජවඩ්ඪනං'. හුණු ලාකල් කිලිල් නම් වන [12]සෙයින් පිමෙ තුරුණුකල් 'පාමොජ්ජ' නම් වෙයි. කිලිල් [13]මිහිකුරුණ හුණු නම් වන [12]සෙයින් "පාමොජ්ජ මුහුකල

1 ධම්මො ච සො ධම්ජුහෙමෙව. 2 දෙන්න. 3 අරුත් යට හැමයට. 4 තුන් සියයක්. 5 විනේ. 6 සාතිරම්‍යව. 7 පරගහට. 8 පුස්කොළ පොත්වල 'කරුණා නම්' යනු නොමැතියි. එකක පමණක් 'කතනා නම්' යන්නක් පැනේ. 9 කුලුණු නොවෙන්. 10 එසාත්එහි. 11 කායන කරුණා. 12 හෙයින්. 13 මිහිකුරුණු.

‘පීති’ නම් වේ. කම [1]බලත් “පාමොජ්ජ පීතිවඩ්ඪනං” යි කිය යුතුත් [2]අල්පාච්තර බැවින් ‘පීති’ යනු පෙරට වී. මේ දෙගයින් කුම් කියූහ යත්? තුමන් වැනියයුතු ධම් කියූහ. ඒ ධමට නිදන් කියූහ. ඒ ධම්හි [3]ප්‍රයොජන් කියූහු. ‘ධම්මපදං සුභං’යි වැනිය යුතු ධම් පැවූහු. ‘පීතිපාමොජ්ජවඩ්ඪනං’යි එ ධම් ප්‍රයොජන් පැහැ සෙසු පෙදෙන් නිදන් පැවූහු. නිදන් දෙ වේ— අජ්ඣත්තික බාහිර විසින්. අජ්ඣත්තික නිදාන කරුණාය. හේ ‘කරුණා වෙග සමුස්සාහිත මානසො’ යනුයෙන් පානාලද. බාහිර නිදාන අජ්ඣුප්පත්ති ඇයි. එහි ‘තං තං කාරණ මාගම්ම’ යනුයෙන් අට්ඨොත්පත්ති හා තස්සනුචරිත දෙශ කාල දැක්වූහ. ‘ධම්මා ධම්මෙසු කොවිදො’, ‘සම්පත්ත සද්ධම්මපදො සත්ථා’ යනුයෙන් දෙශකයා දැක්වූහ. ‘දෙවමනුස්සානං’ යන්නෙන් ප්‍රතිග්‍රාහකයන් දැක්වූහු. මෙසෙයින් තමන් [4]ව්‍යාඛ්‍යාන් කරන ධම් සනිදානසේ පමණසේ [5]පිරිසුදුසේ [6]පිළිවේ වහනසේ දැක්වූහු. අට්ඨොත්පත්තීන් සනිදානසේ පැවූහ. දෙශක ගුණාඛ්‍යානයෙන් පමණසේ පැවූහ. [7]කරුණොත්ථිතසේ දක්වමින් පිරිසුදුසේ පැවූහ. ප්‍රතිග්‍රාහක ප්‍රයොජන දෙ දක්වමින් පිළිවේ වහනසේ පැවූහ. පීතිපාමොජ්ජ ග්‍රහණින් පිළිවේ කිසෙයින් පැවෙති යත්? [8]පිළිවේ සපියුතු පිහා පිළිවෙයට මුල්ව සිටි පාමොජ්ජ ගත් බැවින් පැවෙත්.

‘ධම්පියට අටුවා කෙරෙමි’ යුව ‘එයට බුදුකැලි මහටුවා ඇත් නො?. එ ඇත් තෙප් කුමට කරව?’ යනුවනට එ අටුවා ඇතද තුමන් අටුවා කරනුවට හේ දක්වති—

‘පරම්පරාභතා තස්ස නිපුණා අත්ථවණ්ණනා’ ඉච්චාදි.

**පරම්පරා**, ඇජරපරපුරෙන්—තුනුවන ධම් සභා පවා, [9]එයින් හෙළදිවු පවා අරනලදීයැ. **තස්ස**, ඒ ධම්පියාවු; **නිපුණා**, සේ විය නොහොත් සියුම්විය. **අත්ථවණ්ණනා**, අටුවායි. ‘අත්ථො වණ්ණීයති එතායාති අත්ථවණ්ණනා’. **සා**, යමක්ද; **තම්බපණ්ණිදීපම්හි**, තඹෙන් දිව යැ. ‘තම්බපාණී එත්ථාති’ යන වාක්‍යයෙහි සමාසකළ බැවින් ‘තම්බපාණි’ යනු වියයුතුයෙහිදු නෙරුත්තිකවිධියෙන් පකාරයෙහි ආකාර හ්‍රස්වකොට අතික් [10]ණකාරයක් හැර ‘තම්බපණ්ණි’ යනු කොළෝ. විදූරජනු ලක්දිවට බටදා බිම එබූ අත්පැහැ බලා පිරිවරවූවෝ තම්බපණ්ණි යුහු ල. එයින් [11]නම්දිවැ ලක්දිවු [12]තම්බපණ්ණි නම් විය යෙත්. ‘තම්බපාණීව සො දීපොවාති තම්බපණ්ණි දීපො’. පිහිට

---

1 බලවත්. 2 අල්පාවතරණ. 3 පයොජන්, ප්‍රයොජුන්. 4 ව්‍යක්ඛ්‍යාන්. 5 පිරිසුදුසේම. 6 පිළිසොව. 7 කරුණොත්ථිසේත. 8 පිළිවෙයෙ පියුතු. 9 එයි. 10 ණකාරයක්, 11 මෙය විමසිය යුතුයි. ‘නම්දිවු’ යි ද පාඨයි. 12 තම්බපාණි.

සුන් [1]මුහුද්හි සත්නට පිහිටව සිටි බැවින් දීපනම් සෙත්. **දීපභාසාය**, හෙළුබසින්. 'දීපවාසීනං භාසා දීපභාසා'—මධ්‍ය පද ලොප් සමස්. 'දීපභාසාය'යනු සාමාන්‍ය නො? 'හෙළුබසින්' යනු [2]කිදෙට ලැබෙයි යත්? දීපවාසීන් හෙළු බැවින් ලැබේ. 'හෙළුහ' යනු කිසෙනි යත්? සීහබාහු රජ සීහකුමර 'සීහළ' [3]නම්වී. 'සීහං ලුනවා ඉති සීහළො'. විදූකුමර ඒ ඔහු දරු බැවින් 'සීහළ' නම් වී. සෙසුවො එවුහු පිරිවර බැවින් 'සීහළ' නම් වූහු. **සණ්ඨිතා**, සිටි. මගධබසින් වැටෙමින් ආ [4]බුදුකැලි අටුවා හෙළදිව අජුරො හෙළුබසින් තුබූහ. ඔවුන් තුබූ නිසා සෙන් තුමන් අටුවා කරනතාක් සිටි බැවින් 'සණ්ඨිතා' යුහු. **නසාධයන්ති**, නොසානා. මතුසෙහි 'සා' යනු මෙතැන හැර යොදනු. **සෙසානං**, [5]තෙසුවනට—[6]දීපාන්තර වාසීනටය යු සේයි. **හිතසම්පදං**, [7]හිය සපුව. 'හිත' නම් සුඛකාරණ. හේ මෙතැන ලොවී ලොවුතුරා සුවට කරුණුව සිටි [8]ළුවසපුව වේ. 'හිතංච තං සම්පදංචාති හිතසම්පදං'. **අපෙව නාම**, [9]මැනැවි නම් නො. මේ නිපාත සමුදය ආශංසාර්ථයෙහි වැටේ. මේ පැ දක්වූහ [10]මතුයෙහි 'ඉති ආසිංසමානෙන' යි. **සාධෙය්‍ය**, [11]සාහැනි. ක්‍රියාපදජ ආශංසාර්ථයි මෙ වූ. **සබ්බලොකස්ස**, හිම් නොතබා මුළුලොවට; **හිතං**, හිතව; **ඉති**, මෙසෙයින්—නිදර්ශනාර්ථයෙහි ඉතිශබ්දය නොහොත් ආකාරාර්ථයෙහි. මේ ආකාරයෙන් **ආසිංසමානෙන**, ඉස්නහු විසින්; **දන්තෙන**, දමුණාවූ—දුනු ඉදුරන් [12]ඇත්තහු විසින්; **සමචාරිනා**, සලේ පිළිවුවහි සරනුවා විසින්—දෛශශීලාමල ඇ සමන බැවින් සලේ පිළිවුවා 'සම' නම් වෙයි. 'සමං චරති සමෙ චරතීති සමචාරී'. **කුමාරකස්සපෙන**, එනම් ඇතියහු විසින්. 'චිරයොගතො [13]ථෙරො.' [14]හානභාගිනීනොවන ශිලාදී ගුණමෙ චිර ගුණ නම්. **චිරචෙතසා**, තහවුරු සිතැතියනු විසින්. විවට ෂැකි ධම්හි පිහිට සිත් තහවුරු සිත් නම්. 'චිර චෙතො යස්ස සො චිරචෙතො, තෙන චිරචෙතසා.' **සධම්මඨිතිකාමෙන**, අධිගම සධර්මයට කරුණුවූ ආගම සධර්මයා සිටුම් කැමැති යනු විසින්. 'සධම්මස්ස ඨිතීති සධම්මඨිති, තං කාමො, තෙන සධම්මඨිතිකාමෙන.' හෙළුබසින් තුබූ අටුවා [15]පෙරළා සවභාව නිරුත්තීන් තුබුව පිළිපජනවුන් බොහො ජනා වනු බැවින් 'ආගම ධම් සිටි හැගියනු විසින්' යුසේයි. **සක්කච්ච**, ඇදුරුව; **අභියාචිතො**, යජන ලදයෙම්. මෙයින් අධ්‍යෂණ

1 මුහුන්හි. 2 කිඅෙව, කිදෙට. 3 නම්වෙ. 4 බුදුකැම්. 5 සෙසුවනට. 6 අන් **දීපාන්තර**. 7 සසපුව. 8 වූවසපුවවෙ. 9 මැනවි, මැනාවුවී. 10 මයෙහි. 11 සාහැනි, සාහැණී, සාහනි. 12 ඇත්නාහු. 13 ථෙරෙත. 14 හානභාගිනි. 15 පෙරළු.

තත්කර්තෘ තදභිප්‍රාය තත්සමුට්ඨාන තන්නිදාන තදාශ්‍රය දක්වූහු. "සක්කච්චං අභිඤ්ඤාවිතො" යන්නෙන් අධ්‍යෙෂණ දක්වූහ. 'දන්තෙන-පෙ-කාමෙන' යනුයෙන් එයට කර්තෘහු දක්වූහු. 'අප්පෙව නාම-පෙ-[1][ආසිං] සමාහෙන' යනුයෙන් [2]කරුවා අභිප්‍රාය දක්වූහු. 'තා සාධයති' [යන ඇයින්] අභිප්‍රායට [3]සමුඨන් දක්වූහ. [4]'යා-පෙ-සඤ්ඤිතා' යනුයෙන් එ සුමුටුනත වන්නන් දක්වූහ. 'පරම්පරා-පෙ-වණ්ණනා' යනුයෙන් මේ හැමයට ආශ්‍රය දක්වූහු. දුන් [5]කරන ප්‍රකාර දක්වතියි 'තං භාසං-පෙ-භාසන්තරෙන භාසිස්සං' යන මෙතෙකින්. **තම්භාසං**, ඒ හෙළු බසුජු. 'සාව භාසාවාති තම්භාසා.' නොහොත් 'දීපභාසාය සඤ්ඤිතා'යි කියනලද හෙළ අටුවායෙහි බසුජු. මෙසේ කියත් 'තස්සා භාසා තම්භාසා' යනු වෙයි. නොහොත් එයින් බස් මතු හැරු මෙසේ කියත් 'තතො භාසා [6]තම්භාසා' යනු වෙ. **අතිවිත්ථාරගතං**, ඉතා විස්තරබවට ගිය. 'අතිවිත්ථාරභාවගතං අතිවිත්ථාරගතං'. **වචනක්කමං**, වචනක්‍රම—තෙපුල් මඟ යුසේයි. 'වචනානං කමො වචනක්කමො'—'වචනසන්නිවෙසො'යි සේයි. මෙයින් හෙළ [7]අටුවානි පුනපුනා කියූ කථාමාර්ග කියත්. [8]**ආරොපයිත්වාන**, අරවා. මෙතෙන 'තම්භාසං' යනුයෙහි තිදුවූ තත් ශබ්දය සප්තමීන් විපරිණාමකොට යොජනු 'තත්ථ [ආ]රොපයිත්වාන'යි. ඒ අටුවායෙහි අර්ථ ශරීරභා යොජා යුසේයි. **තන්තිභාසං**, පෙළබස්—මගධබස් යුසේයි. 'තන්තියා භාසා තන්තිභාසා.' **මනොරමං**, මනතුස්වනු වූවා. හැම සතුන් මුල් බස් බැවින් මගධබස් මනොරම යෙත්. 'මනං රමතීති මනොරමා.' **ගාථා[නං]**, "මනොපුබ්බඞ්ගමා ධම්මා" යන ඈ ගාථාවන්. **බ්‍යඤ්ජන පදං සං** යනුව හා සබඳු. යම් බැජුන් හා පෙදෙක්. 'බ්‍යඤ්ජෙතීති බ්‍යඤ්ජනං'—අරුත් [9]විසජායි [10]බැජුන් නම්. 'පජ්ජති අත්ථො එතෙනාති පදං'—අරුත් එයින් ජන්න ලැබෙයි පෙදෙ නම්. 'බ්‍යඤ්ජනමෙව පදං බ්‍යඤ්ජනපදං'. නොහොත් බ්‍යඤ්ජන [11]ෂට්ක පදෂට්ක. එසේහොත් 'බ්‍යඤ්ජනඤ්ච පදඤ්ච බ්‍යඤ්ජනපදං'යි සමාස වෙ. එහි බ්‍යඤ්ජන ෂට්ක නම් අක්ඛර පද බ්‍යඤ්ජන ආකාර නිරුත්ති නිද්දෙස යන මේ සපෙදෙ. අර්ථ ෂට්ක නම් සංකාසන පකාසන විවරණ විභජන උත්තානීකරණ පඤ්ඤත්ති යන මේ සපෙදෙ. **තස්ස**, එ හෙළු අටුවායෙහි; **සං න විභාවිතං**, අත්‍යුද්ධාර නිරුත්ති වෙ

1 සමානො, සමානෙ. 2 කරවා. 3 සමුඛන්. 4 **සො-පෙ-සඤ්ඤිති.** 5 කාරණා. 6 තබනාසා. 7 අටුයෙසි, අටුවායෙහි. 8 **රොපයිත්වා.** 9 **විසජ්ජෙයි** 10 **බැඤ්ජන්.** 11 **ෂට.**

වචන [1]ප්‍රත්‍යයොඞාර ප්‍රත්‍යයාඤී දීපනාදීන් විසින් යමක් නොපාලකරනලද්ද; **කෙවලං තං විභාවෙත්‍වා,** ඒ සියලු පාලකොට. ‘කෙවල’ ශබ්ද අනවශෙෂාර්ථයෙහි—“කෙවලකප්පං ජෙතවනං ඔභාසෙත්‍වා” යන තන්හි සේ. නොහොත් ‘කෙවල’ ශබ්ද අමිශ්‍රාර්ථහි නො? හවු පද මතු විභාවය යු සේයි. **සෙසං,** සෙසු ගයට තුබූ. [2]‘අත්‍ථවණ්ණනා’ පද උපයොග වචනයෙන් විපරිණාම කොට මෙහා නොජනු ‘සෙසං අත්‍ථවණ්ණනං’ යි. ‘තමෙව භාසිස්සං’ යනුව හා සබඳ. ‘එමෙ කියනෙම්’ යුසේයි. එමෙ කියුව හෙළුයෙන් කියුවා යනුවනට කියති “අත්‍ථතො-පෙ-භාසන්තරෙන’යි. ‘අත්‍ථතො තමෙව න සද්දතො, සද්දතො පන භාසන්තරෙන භාසිස්සං’ යුහු. අරුත් විසින් මෙ කියනෙම්, [3]පද විසින් ඒ නොකියනෙම්. පදවිසින් මගධ [4]බසින් කියනෙම්යි යට තුමන් කියූ “ආරොපයිත්‍වාන තන්තිභාසං මනොරමං” යනු ප්‍රත්‍යවස්ථාව නො කොළෙ‍්. **ආවහන්තං,** එළවනුයෙම්; **විභාවිනං මනසො,** [5]පසාදවන් සිතට. ‘අත්‍ථං විභාවයන්ති පකාසෙන්තීති විභාවිනො.” නොහොත් ‘සුකතං දුක්කතං විභාවෙන්ති ජානන්තීති විභාවිනො, තෙසං මනසො,—කෙළෙහි නාමනම් ජන්තවුන් සිතට ය යුසේයි. **පීතිපාමොජ්ජං,** පීතිපාමොජ; **අත්‍ථධම්මූපනිස්සිතං,** පෙළ අරුත්හා පෙළ ඇසිරු කළවු. ‘අරීයති ඤායතීති අත්‍ථො,—[6]සෝ දෙව්රි ජවන් අනුසරින් පැවැති මුනිදෙරි ජවන් විසඳුණින් ජනන ලැබෙයි අරුත් නම්. ‘ධාරෙතීති ධම්මො’—පෙළ අරුත් ධරයි ධම් නම්. ‘අත්‍ථො ච ධම්මො ච [7]අත්‍ථධම්මා, තෙ උපනිස්සායතීති අත්‍ථධම්මූපනිස්සිතං’. මෙහි කරණප්‍රකාර පසු: ‘තම්භාසං-පෙ-පහාය’ යනු එකු. “[ආ]රොපයිත්‍වාන-පෙ-මනොරමං” යනු එකු. “ගාථානං-[පෙ]-විභාවිත්‍වා” යනු එකු. “සෙසං-පෙ-භාසිස්සං” යනු එකු. ‘ආවහන්තො-පෙ-නිස්සිතං’ යනු එකු. මෙ පස්සෙයින් කරණප්‍රකාර දක්වා දැන් තමන් අටුවාකරන ධම්පියෙහි යමකවගැ පළමුවන [8]ගා පෙළවිසින් දක්වා ඒ වණ්ණනා කටැපිව “මනොපුබ්බඞ්ගමා ධම්මා” යන ඇ කීහු.

“මනොපුබ්බඞ්ගමා ධම්මා-පෙ-පදංති” එත්‍ථ **ඉති** සද්දො නිදස්සනෙ පරිසමාපනෙවා. ‘කත්‍ථ භාසිතා’ති පුච්ඡා. **‘සාවත්‍ථියං’** ති පරිහාරො. එත්‍ථ ච ‘භාසිතා’ති පදං ආනෙත්‍වා යොජෙතබ්බං. **චක්ඛුපාලත්‍ථෙරන්ති** නාඤ [9]චක්ඛුමෙතං ථෙරං. සොහි

1 ප්‍රත්‍යයාපොඞාර 2 අත්‍ථවණ්ණනා 3 සද්දවිසින්. 4 මගධ විසින්. 5 පවන් සිතට, පසාදවක සතට. 6 සොදෙව්පි, සොදෙරිපි, සොදෙව්ජ. 7 අත්‍ථධම්මා. 8 ගාථා. 9 චක්ඛුපාලමෙතං ථෙරං.

එලිත චක්ඛුනතා එලිත චක්ඛුත්වා එලිත සද්දස්ස පරතිපාතො චක්ඛු එලිතොතිවා වත්තබ්බෙ එකාරස්ස පකාරං අකාරස්ස දීඝත්තං තකාරස්ස ලොපං ඉකාරස්ස අකාරං කත්වා නිරුත්ති නයෙන චක්ඛුපාලොති වුත්තො. **කිරාති** අනුස්සවත්ථෙ නිපාතො. කුටුම්බං වුච්චති සාපතෙය්‍යං, තං යස්ස අත්ථි **කුටුම්බිකො**, ආධිපච්චපරිහාරාදි වසෙන **අඩ්ඪො**. හිරඤ්ඤ සුවණ්ණාදි වසෙන **මහද්ධනො**. ගෙහොපකරණ වසෙන **මහාභොගො**. සබ්බසාපතෙය්‍ය වසෙනවා **අඩ්ඪො**. නිදහිත්වා ඨපිත ධනානං වසෙන **මහද්ධනො**. වළඤ්ජනක ධනානං වසෙන **මහාභොගො**. **නහානතිත්ථන්ති** අචිර වතිං. **වනප්පතින්ති** වනජෙට්ඨකං; **මහෙසක්ඛාය**, මහානුභාවාය; **හෙට්ඨාභාගං**, රුක්ඛමූලං; **සොධාපෙත්වා** තිණපණ්ණාදිහරණවසෙන; **පාකාරපරික්ඛෙපනන්ති** පාකාරෙන පරික්ඛිපනං, තං පරික්ඛෙපන පාකාරංවා; **ධජන්ති**, මූලෙ බන්ධිත්වා විස්සඨං; **පටාකන්ති**, තිරියං යඨියා අප්පිතං; **ගබ්භපරිහාරං**, ගබ්භ පරිපාලන විධානං මඞ්ගලාදිකංවා; **සෙඨීති** කුටුම්බිකො. සොහි ලද්ධ සෙට්ඨිච්ඡත්තතාය සෙට්ඨීති වුච්චති. **අපරභාගෙති** අපරකාලෙ; **සගබ්භතො**, ගෙදලින්; **පවත්තවර ධම්මචක්කො**, පවත්වනලද උතුම් ධම්සක් ඇත්තේ. ධම්සක් නම් "දුක්ඛං පරිඤ්ඤෙය්‍යං පරිඤ්ඤාතං, සමුදයො පහාතබ්බො පහීණො, නිරොධො සච්ඡිකාතබ්බො සච්ඡිකතො, මග්ගො භාවෙතබ්බො භාවිතො"යි කියනලද එකෙකි සස්හි තුන් තුන් ආරෙන් පැවැති දෙසුන් ඤණ. **අනුපුබ්බෙන** බාරාණසිතො කපපාසික වන සණ්ඩං, තතො උරුවෙලං, තතො රාජගහං, තතො කපිලපුරං, තතො සීතවනනති ඉමිනා අනුක්කමෙන ආගතත්තා **අනුපුබ්බෙන ආගතත්වා** යී යුනු. **චතුපඤ්ඤාසකොටිධනං විස්සජ්ජෙත්වා** යනු භූමිගහණ විහාරකරණ විහාර මහයෑ යන මෙතුන් තන්හි විසජනලද අට ලොස්කෙළ ධන ගැන කියත්. **සග්ගමග්ගෙ**, දන් සිල් ඈ සග[1]මග්හි; **මොක්ඛමග්ගෙ**, සමාධිවිවසුන් ඈ මොක්[1]මග්හි. 'ජෙතවන මහාවිහාරෙ විහරති' [2]යනුවහා 'අථෙක දිවසං මහාපාලො' යන ඈ කථා සම්බන්ධ විසින් යොජනු. මධ්‍යයෙහි 'තථාගතොහි' යන ඈජ මෙහි සෙයින් සෙසු තන්හි බඩවාස නොවනසේ දක්වනවස් කියුනු. **මෙ අසීතියා ඤාතිකුල සහස්සෙහි කාරිතෙ විහාරෙ** යනු නිග්‍රොධාරාම පිණිස කියත්. 'ජෙතවන මහා විහාරෙ එකූනවීසති' යනුවහා මතුයෙහි 'වස්සා වාසෙ' යනු ඈරැ යොජනු. දහරාව [තෙ] සාමණෙරාව

1 මගෙසි, මඟිසි. 2 යනුවහෑ.

**දහර සාමණෙරා. ඛාදනීයාදීනි**-ඵල ආදිගගහණෙන භොජනීයාදීනි ගහෙතබබානි. **පඤ්චභෙසජ්ජානි**, 'සප්පිනවනීතං තෙලං මධුඵාණිතං' යන පඤ්චභෙසජ්ජ. **අට්ඨපානානි**, 'මධු මුද්දික සාලූක චොච මොචම්බ ජම්බුජං ඵාරුසං' යන මේ අටවිධ පාන කියනුජ්. **තෙසං** යනුයෙහි 'සාච සොච තෙසං'යි එකශෙෂකොට බහුවචන ෂෂ්ඨී කෙළේයි. **යථිච්ඡිතමෙවා**ති යථා ඉච්ඡිතමෙව—[1]යථ පැවැසි සිත්මෙවූ යූ සේයි. **අධිමත්ත සිනෙහෙන**, අධිකපෙමෙන; **බුද්ධසුකුමාලො'** බුද්ධභාවෙන සුකුමාලො—බුද්ධභාවෙන නිදුක්ඛොති අත්ථො. 'නිසින්නමත්තෙයෙව එකං ධම්මදෙසනං කථෙසි'යි යොජනු. **අරක්ඛිතබ්බට්ඨානෙ** යනු පඤ්හාබ්‍යාකරණ තමනට කිලමනඨාන නොවන බැවින් කියත්. **උබ්බෙගතාව**, පෙරළා. **පබ්බජ්ජාදීනං** යන තැන 'ආදි' ශබ්දයෙන් ධ්‍යානාභිඥා [2]ගන්නේ. **ආනුපුබ්බීකථං**, ක්‍රමයෙන් පවත්වන කථා. **සෙය්‍යථිදන්ති** නිපාතො—තං කථනති අත්ථො. **දානකථං**, දානං උද්දිස්ස [3]පවත්තං කථං; **කාමානං ආදීනවං**, වත්කම් හා කෙලෙස් **කම්**හි අවෙන්ව. 'කාමානං **ඔකාරං** කාමනාං **සංකිලෙසං**' යි යොජනු. වත්කම් හා කෙලෙස්කමුන් [4]යටත් බැවු හා දුක් බැවු යූසේයි. [5]**නෙක්ඛම්මෙ**,

"පබ්බජ්ජා පඨමං ඣානං නිබ්බානඤ්ච විපස්සනා
සබ්බෙපි කුසලා ධම්මා නෙක්ඛම්මන්ති පවුච්චරෙ" යි

කියනලද නෙක්ඛම්හි. **සණ්හසුඛුමං** යනු එක්මෙ අර්ථ කියා. **ආදිමජ්ඣ පරියොසාන කල්‍යාණො** යනු ශීල සමාධි ප්‍රඥා ගැන කියත්. මෙය තදඟ විඛම්භන් සුමුසේ[6]පහන් ගැන කියත් මෙ. **අගාරමජ්ඣෙ** යනුයෙහි 'වසන්තො' යනුවක් දක්නේ. **කරුණාපිච තාවතු—තාව**, තව; **කරුණාපිච අතු**, ළදරුදුව්ව; **අනස්සවා**, නස්සවනාති වුත්තංහි—නප්පටිපජ්ජන්තීති අත්ථො—අනස්සවා අවිධෙය්‍යාති අත්ථො. **කිමඞ්ගපන**, නිපාත—'පගෙව' යූ සේයි. 'යස්ස හත්ථපාදා ජරා ජජ්ජරිතා අනස්සවා හොන්ති'. **විහඤ්ඤාමො**, නට බැල ඇතියේ. **තස්ස විරවන්තස්සෙව** යනු අනාදරයෙහි සාමිවචන. සල්ලහුකා වුත්ති යස්ස සො **සල්ලහුකවුත්ති**. **පන්තසෙනාසනානි** "දූරානං සෙනාසනමෙතං අධිවචනං" යූ බැවින් [7]ගොජුරුගමට දුරු සෙනසුන්. **ඛයවයං** යනුයෙහි [8]කැමෙන් නස්නේ **ඛය** නම්, එක් පැහැර නස්නේ **වය** නම්. **පණ්ණසනථා**, කොටැ—පමන් ගෙනැයි යූසේයි. **සාතච්චකිරියවසෙන**, සතත ක්‍රියා විසින්.

1 යථා. 2 ගණ්හෙ. 3 පවත්ත. 4 යටත්බැව්. 5 නෙක්ඛම්ම. 6 පහන්සේ, 7 ගොදුරු. 8 කුමෙන්, කුමයෙන්.

'සතත භාවො සාතච්චං—සාතච්චෙන කිරියා සාතච්ච කිරියා'. **සාච අරහත්තා**, රහත්ඵල පවා. **සභගාමිනො** යනු උපයොග බහුවචන්. **පරිවිසිත්වා**, බොජා; **යථාඵාසුකට්ඨානං**, යථාඵාසුවතැන්. 'භො ගච්ඡාම' යනුවක් හා යොජනු. **භවනිස්සරණං**, භවනො නික්ඛමණං; **පතිරූපං**, අනුච්ඡවිකං; **සාඛල්‍යෙන**, සෙලෙලුන්—නැති ගුණ පාලකිරීමෙන් යුසේ. **කල්‍යාණජ්ඣාසයෙන**, කල්‍යාණ අදහසින් - කලණ අදහස් ඇතියහු විසින් [1]එව්. **පමත්තස්ස**, පමසු කාම ගුණෙසු වොස්සට්ඨසතිස්ස—පස්කම්හි [2]බුහුටු සිත් ඇතියානුය යුසේයි. **පිට්ඨිං න පසාරෙස්සාමි**, පිට බිම නොපහරමි—'න නිපජ්ජිස්සාමි' යන අභිප්‍රාය. **නිද්දං අනොක්කමන්තස්ස**, නින්දට නො වජ නවුහට. අරුණස්ස උග්ගමනෙ [**අරුණුග්ගමනෙ**]; **අක්ඛී පග්ඝරණෙන** [**දිස්වා**], වැහෙනුවූ ඇස් දැක; **ආසිඤ්චනෙනා**, එවුනේ; **සරීරෙ ඨාපෙන්තෙන**, සරීරෙ පවතනනෙන; **ඤාති සාලොහිතා—ඤාති**, දුරු [3]නෑයො; **සාලොහිතා**, ආසන්නයො. **කරජකායං**— 'කරතො ජාතං කරජං, කරෙවා ජාතං කරජං'. මෙහි කර ශබ්දයෙන් ශුක්‍රශොණිත කියනු. 'කිරීයතෙ විප්පකිරීයතෙ ඉති කරං, කුච්ඡිතානං කෙසාදීනං ආයො ආකරොති කායො. කරජොච සො කායොචාති කරජකායො. 'අනු අමතො අපරිච්ඡින්නො අග්ගො යස්ස සො අනමතග්ගො—තස්මිං **අනමතග්ගස්මිං**. **සංසරවට්ටෙ**, වැටෙන අපින් සසරමෙ සසරවට නම්. **න පරිච්ඡිණ්ණාති** නසෙවිතො. [4]**ධාරෙති**, රැස්වා; **භූතකායං**, චතුමහාභූතමය කායං; **භායන්ති**, පිරිහෙත්; **මමායිතානි**, මම යි [5]ගන්නාලදුවො; **භිජ්ජන්ති**, බිඳෙත්. මෙහි පළමුවන ගයින් පිරිහීම් මතු කීනු. දෙවන ගයින් නිරව සෙස් විසින් නස්නා කියුනු. **නඤ්ඤුකම්මං**, නසය; **සප්පායං**, ඵාසුකං; **පච්චක්ඛාතො**, පටික්ඛිතෙතා; **තිකිච්ඡාය**, පිළියමින්; **විවජ්ජිතො**, පියන ලදුයෙහි; **අපුබ්බං අචරිමං**, නොපසු නොපෙරමවැ: **උපකට්ඨාය**, ආසන්නාය; **භික්ඛං**, බික්; **මා ඛො රුච්චි** [**ස්ථ**], න රුච්චතු. 'ගමනාකාරො පඤ්ඤායතීති' යනුවට 'ආහංසු' යනුවක් ඇර යොජනු. **පච්චාසිංසති**, ඉච්ඡති; **ආරඤ්ඤකො විහාරො**, [6]අරනෙහි වෙහෙරෙක්; **සරනිමිත්තං**, ආකාරං—ඉත්ථි සඥ අයනති; **පරියාදාය**, ගෙනැ; **සීලවිපත්තිං**, සීලභෙදං, සීලවිනාසං. 'සොච ඛො ඉත්ථියා ගීතසද්දෙ' යි යොජනු. **පාපෙ ජාතොසි**,

1 එව. 2 වුහුටු. 3 ඤාණ. 4 වරෙහි. 5 ගණනලදුවො.
6 අරණෙහි වෙහෙනහිවූ.

පැවැති විහි. 'පාපමෙතස්ස අත්ථීති පාපො'. **යඝී [කොටි] ගහණන කිච්චං නත්ථි**, යටකෙළ ගැන්මෙන් කටයුතු නැති. නොහොත් 'යඝී [කොටි] ගහණ සඞ්ඛාතං කිච්චං යඝී [කොටි] ගහණකිච්චං, යටකෙළ ගැනුම් නම් ඇති කිස නැති. **සංවෙගප්පත්තො**, උත්‍රාසො; **කාසායානි අපනෙත්වා**, සමණනියාමෙන පරිදහිතානි කාසායානි කායතො මොචෙත්වා.—මහණුන් අඳනා ආකාරයෙන් [1]හන් කහවත් හැරැය යුසේයි. **ගිහිනියාමෙන**, ගිහින් අඳනා ආකාරයෙන්; **මග්ගපරිපන්ථභයෙන—පරිපන්ථ** නම් උවදුරැයි. අමනුස්සා නං උපද්දවො එත්ථ අත්ථීති **අමනුස්සූපද්දවො. සඤ්ජාති** බ්‍යවසායත්ථෙ. **අසම්** යනු **ආගතොසම්** යි යොජනු. කන්තාර සංඛාතං අද්ධානං **කන්තාරද්ධානං. අද්ධාන** නම් දෙගවුවෙන් වැඩි තැන්. **සම්මානෙනො**, සයනෙනා එව. **බාලෙ**, බල්නු කෙරෙහි; **සහායතා**. සහායභාවො. නොහොත් විභක්ති විපරිණාම—'බාලෙන සහ සහායතා බාලෙ සහායතා'යි සේයි. "බාලෙන සහායතා" යත් බල්නු සහ තුමන් සහබැවු නැතිසේ කියත්. "අපරාපරම්පරිවට්ටෙන්තස්ස" [2]යනුවට නිදෙස් කියා "ඉධෙව මෙ මරන්තස්ස" යනුවට නිදෙස් විසින් දෙවන ගය කියුනු. **සංවෙගජාතො**, ජාතසංවෙගො; **මෙති** මයා. සහසා කතං **සාහසිකං. අනනුච්ඡවිකං**, සාසනස්ස අනනුරූපං; **පක්ඛන්දිත්වා**, පැක්සැ; **බාහා ති** උභොහත්ථෙ; **පග්ගය්හ ති** උක්ඛිපිත්වා; **පක්කාමෙත්තාව අහොසි**, න පුන මනුස්සවාසං ආගඤ්ඡීති අධිප්පායො. **ජයසුමන**, බඳුවදපත් එව්; **පකතිකං**, සභාවං; **උණ්හාකාරං දස්සෙසි**, උණ්හං විය දැපෙසි. **දිබ්බෙන චක්ඛුනා** යි අභිඤ්ඤා දිව ඇස් [3]නොගෙන දෙවනිකායොතප නහින් ලද් දිව ඇස් ගන්නේ. **සහස්සනෙත්තො**, දහසක් පැන ඇස් ඇත්තේ—දහසක් ජනා සිතන අත්ථ එක්කෙණෙහි සිතන බැවින් සක්හු එක්ම පැන ඇස් දහස් ඇස් නම් වී. **විසොධයී**, [4]ජෙහයි, නොහොත් **විසොධයී**, [5]සේබැලියයි සේයි. මෙසේ කියත් 'දිබ්බං චක්ඛුං' යනු 'දිබ්බෙන චක්ඛුනා'යි කරණ වචනයෙහි යොජනු. **පාපගරහී**, පව්වුන් ගරහනු වූ සේයි, නොහොත් පවු ගරහනු වූයේ; **ආජීවං පරිසොධයී**, ආජීවු පිරිසුදු කෙළේ—පව්වුහු ගත් යට එල්බැ දෙනු ගැළෙ යුසේයි. **ධම්මගරුකො**, පිළිවෙත් ධම් ගොරොක් කොට ඇතියේ—පවු මිතු සසග [6]සිඳැ කලණ මිත් සසග රිස්වූය යුසේ. **සාසනෙ රතො**, පිළිවෙත් සස්නෙහි ඇලුණේ. මෙහි පලමුවන ගය 'පරිසොධයී' යනුයෙහි හා දෙවන ගය

---

1 ගත්. 2 යනාගයට. 3 ඉගැන. 4 ජෙහස්. 5 මෙය විමසියයුතුයි. 6 රිඳැ.

‘නිසින්නො’ යනුයෙහි ‘ඉති’ ශබ්දයක් යොජා ‘පරිසොධයී ති දිබ්බං චක්ඛුං විසොධයි’ ‘නිසින්නො ති දිබ්බං චක්ඛුං විසොධයි’ සබඳ කරනු. **සත්තධා,** සත් ප්‍රකාරයකින්; **ඵලෙය්‍ය,** පැළෙනු—විසිරෙනුය යූසේ. ‘ඵල විසරණෙ’ [1]යන ධායි. දෙවරජ්ජ සිරිං ධාරෙතීති **දෙවරජ්ජසිරී ධරො.** මෙහි ඊකාර ගාථා බන්ධ වස් දිගි. **අභික්කො,** මහියෙකිම්; **පපඤ්චො,** ලස්. **අච්චායිකං** යනුයෙහි ‘කම්මං’ යනුවක් අධ්‍යාහාර කරනු—[2]ඉතික් කම් නැති යූසේ. ‘අච්චෙති අතික්කමතීති අච්චයො, අච්චයො එව අච්චායිකං’. **දසසු පුඤ්ඤකිරිය වත්ථූසු,**

“දානං සීලං භාවනා පත්තිදානං
වෙය්‍යාවච්චං දෙසනා චානුමොදෙ
දිට්ඨුජ්ජුකම්මං සංසුතීචාපචායො
ඤෙය්‍යො එවං පුඤ්ඤවත්ථුප්පභෙදො”යි

කියනලද දස පින් කිරියවත්හි. **එකං** යනු වෙය්‍යාවච්ච පින් කිරියවත් සඳහා කියා. **සප්පුරිසො,** සාධුපුරිසො; **ථාමං කත්වා,** යණිකොටිං ගහෙත්වා; **පථවිං සංඛිපන්තො සංඛිපන්තො,** පොළො තන තන හකුවනුයේ—විසම් පියෙස් මුළුලු හකවා සම පියෙස් සුලාක් නොහකවා පසින් නියනුය යූසේ. **චිරෙන** යනුයෙහි ‘කාලෙන’ යනුවක් අධ්‍යාහාර කරනු. **උජුකමග්ගං** යි තුමා හැකවූ මඟ සඳහා කියා. **දෙවතා භවිස්සතීති,** දෙවියක් [3]වන්නැයි. සුවසේ [4]යනු වන් එක්සියවිසි ලැක්මෙකින් යායුතු මඟ කීප පැයකින් ආ බැවින් ‘**ඛිප්පං සාවත්ථිමාගමි**’ යූනු. කෙණෙකින් නො හැර කීප පැයකින් සුමට [5]ඇළැයි යත්? [6]තෙරනට වෙය්‍යාවච්ච කම් බොහෝ කමැවිවැ නො ඇළැයි [7]ගන්නේ. එසින් මෙ කීයැ යට ‘දසසු පුඤ්ඤකිරිය වත්ථූසු එකං ලභිස්සාමි’යි. **කනිට්ඨ කුටුම්බිකෙන,** මල්කෙළඹියා විසින්; **පණ්ණසාලං,** [8]පන්හල්. උළුසියන් [9]තණසියන් හොතුජ් පන්හල් ආරෙන් කළ සෙනසුන් පන්හල් නම් වේ. **පල්ලඞ්කො,** හැඳ; **පිය සභාග වණ්ණක,** කල් සබඳහු සටහනින්; **පච්චොට්ඨෙන්තො,** ඇස් නමසේ [10]යටවැ පාමුල වැටෙන්නේ. **ඉදං දිස්වා,** මෙපවත් දැක—කෙළඹි තෙරුන් ඇස් නස්නා බවු පුරෙ තුමා නො දත්ද ලෝ වළඳ විසින් ‘ඉදං දිස්වා’ යි. **භුජිස්සං කත්වා,** නිදස්කොට; **උපඩ්ඪහථ,** එළබෙවයි—වටාව යූසේයි; **මතක**

1 සතධාසි, සන්ධාසි. 2 අතිසකම්. 3 වැන්නැයි. 4 යනුවක්. 5 අළු යත්. 6 තෙරණට. 7 ගණිනේ. 8 පත්සල්. 9 බොහෝ පොත්වල මෙය නොපැනේ, 10 මෙයද විමසිය යුතුයි,

**පච්චනනං,** වත්පිළිවෙත්—පළමු කරනු වත්නම්, පුන පුන කරනු [1]පිළිවෙත් නම්. **උපඨහිංසු,** වැටියෝ. **දිසාවාසිනො,** නියරි වැසියෝ. [2]**ඉදමපි,** යනුයෙහි 'ඨානං' යනුවක් දක් නේ. **තදෙවො,** [3]දෙව්ලෝ; **විගතො,** කසවී. [4]ඉදදීන් සීසේ. **ආරබ්ධ විරියො,** රැකුළ වැර ඇතියේ. 'ආරබ්ධං විරියං යෙන සො ආරබ්ධ විරියො' යනු වේ. **ආචිණ්ණ චඞ්ක මණො,** ඇසින් සක්මන් ඇතියේ—පුරුදු කළ [5]සක්මිම් ඇතියේ. "ආචිණ්ණං චඞ්කමණං යෙන සො ආචිණ්ණ චඞ්කමණො" යනුවේ. **නව වටඨාය භූමියා,** නව වට පෙළෙවින්; **ඉන්දගොපකා,** ඉදුගොවුවෝ; **විසජ්ජිංසු,** නටහු—මළුහු යූසේ; **ආවාසිකා,** නිවැසි මහණුහු; **කාලසෙසව,** දවස් ඇති කල්හි මෙ. 'ඉතරෙ භික්ඛු' යි නියරි වැසි මහණුන් ගෙන කියත්. 'පාණකෙ' යි මළ ඉදු ගොවුවන් සඳහා කියත්. **අහං කරිස්සාමිති,** හිය කෙරෙමියි. 'මාරෙතො' යනු 'පාණකෙ' යනු හා සබඳ කරනු. 'තං මාරෙතනං' යි විපරිණාම කොට යොජනු. **මරණචෙතනා** නම් වධ චෙතනා. හේ දෙමිනස් [6]සහගිය සිත් [7]අභාගම් මඟින්මෙ පුහුන් බැවින් [8]ඛීණාසවනට නැති. **උපනිස්සයෙ සති,** උපනිස්සය ඇතිකල්හි—අරහත්ඵලට හෙතු ඇතිකල්හිය යූසේ. **අහං තෙ සඞ්ං පුත්තධීතාහි දසි භවිස්සාමි,** 'අහං පුත්තධීතා හි සඞ්ං තෙ දසි භවිස්සාමි' සි යොජනු. **සංවිදහි,** යෙජ්; **එකභෙසජ්ජෙනෙව,** එක් යලක් දුන් බෙහෙජින්මැ. 'එකවාරං දින්නං භෙසජ්ජං එකභෙසජ්ජං'. **පාකතිකානි,** පියවි සිටි යවිහු. 'පකති සණ්ඨිතානි පාකතිකානි' එතස්ස **පටිජිනිං,** පිළින කෙලෙම් යන සබඳ. 'විනෙතසි' යනු 'වංචෙස්සාමි නං ති' යනුව හා සබඳ කරනු. **සමණභාන,** මොළොක් පියොවින්. මෙහි 'පයොගෙන' යනුවක් ඇරැ යොජනු. **සමුද්දචරිස්සති,** වොහරිස්සති,—මා තුමා දස්කල්හි [9]මොච්හු මොළොක් පියොවින් බැවහාර නොකරනු යූසේසි. **වංචෙස්සාමි,** වස් නෙමි, නළනෙමි යූසේසි; **කීදිසං,** කිබඳුය;—'රුජති නොරුජති' යූසේ. **ථොකං,** මඳව, **අචිරෙකාරං,** අයිරා; **දීපසිඛාවිය,** වැට [10]අග්හි ජල සිළක් සෙයින්; **විජ්ඣායිංසු,** නටහු. 'නද කත කමමං' යි යොජනු. **පච්ඡතො පච්ඡතො අනුබන්ධි,** පස් පස් තුහුබද්—ගත් ගත් හෙවෙහි නොපියා විවා වර සොයමින් මෙතැන් පවා අය යූසේසි. **ධුරං වහතො,**

1 පිළිවත්. 2 'තමපි' මූ. ධම්මපදඨකථා. 3 දෙවෙ, දෙවලේ. 4 මේ පාඨය හැම පුස්කොළ පොත්වලම මෙසේ පෙනෙන නමුත් සැකසහිතයි. 5 සැක්මිම්. 6 සහසියා, සහගියා, 7 අභාගම්, 8 ඛීණස්වනට. 9 වච්, මච්, 10 අගගිජාල.

ධුර උසුලනුවහ—ජත්හි තුබූ වියෙහි බඳ ධුර වහනුවහ යුසේයි. 'පදං අනුගච්ඡන්තං චක්කං'ව' යි යොජනු. **ඉදං වත්ථුං කථෙත්වා,** මේ අයුයෙහි පැවැති වත් කියා; **අනුසන්ධිං ඝටෙත්වා,** සබඳ යොජා, ගළපා—"අරහත්තස්ස උපනිස්සයෙ සති තස්මා අත්ථො ජාතො" යනු පුච්ඡාහා 'තෙනහි භික්ඛවෙ සුණාථ' යි අළ වත් හා දෙ එක්කොට [1]ගළපයි යුසේයි. මෙයින් පුච්ඡානුසන්ධි විසින් "මනොපුබ්බඞ්ගමා ධම්මා" යන ගා පැවැතිසේ කියුවෙත්. **පණ්ණාපිත මත්තිකං [සාසනං],** [2]මැටි මණ් රාජ ශාසනයක්; **රාජ මුද්දාය ලඤ්ඡෙතනාවිය,** රජමුන්දෙන් හස්කරන්නාක්හු සෙයින්. තෙරුන් [3]අයුයෙහි කළුතම් පුවසුන් රාජ ශාසනයෙන් දක්නේය. "මනො පුබ්බඞ්ගමා ධම්මා" යි පැවැති ධම්දෙසුන් රජමුන්දෙන් [4]ඔබුළ හස්සෙයින් දක්නේ. **තත්ථ,** ඒ ගාහි 'කාමාවචරාදි භෙදං' යන තන්හි ආදිගහණින් සෙසු හැම කුශල විපාක ක්‍රියා චිත්ත [5]ගන්නේ. එයින්ම කීහ "සබ්බම්පි චතුභූමක චිත්තං" යි. හැම සිත්ම [6]සපියුතු ධම්නුජ් සිත් පුවගමා වන බැවින් මෙ අත්‍ථ හැම සිතට යෙපෙත් හොතුජ් මෙ දෙසුන් සක්පල් තෙරුන් අයුයෙහි පිළිසු සපියුතු සිතින් මාගම් ඇස් නැහු අධියරහි පැවැති බැවින් ඒ අධියරට කොටැ යොජත් පිළිසු සපියුතු සිත්මෙ ලැබෙයි දක්වනුව වස් 'ඉමස්මිං පන පදෙ' යන ඇ කීහු. **උප්පන්නවසෙන,** උපපන්න චිත්තවසෙන. 'නියමියමානං' ඇ පයසීාය. **තෙන,** ඒ පිළිසු සිත්හා; **පඨම ගාමිනා,** පෙරෙගම්නිවුවහ; **සමන්නාගතා,** [7]සමනාවූ වහ—සම්‍යුතුවූවහ යුසේ යි. **'පඨමගාමිනා හුත්වා'** යි ඒ ලියති එසේහොත් ඒ පිළිසු සිත්හු විසින් පුරෙගම්නිව සමනාවූවාහු යනු වේ. පුරෙගම්නිවූ පිළිසු සිත්හු විසින් වේජනාදි ධම්හු [8]යෙඅජෙනලද්‍රුවහ යුසේයි. **නාසි සම විපා කිනො** යනු සබඳ. **ධම්මො,** පණිවා වරු [9]ඇ ගුණ ජ්; **අධම්මො,** [10]පණිවා [11]ඇ අවගුණජ්. 'සමො සදිසො විපාකො සම විපාකො; සම විපාකො යෙසං අත්ථි තෙ සම විපාකිනො'. [12]දෙජෙනා නොසම [13]විවාසේ දක්වති 'අධම්මො' යන ඇයින්. **නිරයං** යනු උපලක්ෂණ—හැම දුර්ගති [14]ගන්නේ. [15]**නෙති,** පිළිසඳ දෙන විසින් පමුණුවා; **පාපෙති** යනු ජු එසේ මේ. **ධම්මං චෙ,** දෙසනං චො—ධම් පෙළ. මෙහි දෙශනා නම් බුදුන් විසින් දෙසන [16]ලබනු; පෙළ නම් වාචනාමගහ කොටැ

1 ගළපස. 2 මැටින්. 3 ඇසුයෙහි. 4 ඔබුහස්. 5 ගණනේ. 6 සැපියයුතු, සැපි යුතු, සවියුතු. 7 සමඹුවහ, සමානාවූවහ. 8 යොජනා ලද්‍රුව. 9 ඇති ඇ. 10 පණි මාම්. 11 ඇට ඇ, ඇ අට. 12 දෙජනා. 13 විපා. 14 ගණනේ. 15 ඉති. 16 ලැබෙනු.

තබතලදු. **ධම්මා හොන්ති,** ආත්මාත්මීය භාවයෙන් ශූන්‍ය බැවින් [1]ධම්හු මතුවෙති; **ඛන්ධා හොන්ති,** ඛඳහු මතුවෙති. නිස්සත්ත සඞ්ඛාතො ධම්මො **නිස්සත්තධම්මො;** තථා **නිජ්ජීව ධම්මො. එතෙසං,** මේ වෙදනාදි ධම්හු; **මනොපුබ්බඞ්ගමා,** සිත් පුවහමාකොට ඇතියහ; **එතෙසං,** මේ වෙදනාදි ධම්නට; **මනොපුබ්බංගමොනාම,** සිත් පුවහමා නම් නො. සිත්හු පුබ්බගාමිවත් ධමුන් පච්ඡාභාගීවූව මැනැව. හෙවත් නන්බිණී ධම්නට මිස එබිණී ධම්නට නොසෙජෙ නො යන අභිප්‍රායයෙන් 'කථං පන' යන ඈ කියූහු. 'කථං [2]පුබ්බංගමො නාම' යන සබඳ. මෙයින් සපියුතු ධමුන් කෙරෙහි පුරිම පච්ඡිම භාව නොයෙදෙයි කියූවෙති. මේ අර්ථ 'එකක්ඛණෙ උප්පජ්ජමානො' යනුයෙන් මෙ හැමෙහ තුඳු සම්ප්‍රයොග ලක්ෂණ දැක්විසපිවැ 'එකක්ඛණෙ අපුබ්බං අචරිමං' යුනු. **අපුබ්බං අචරිමං** යනු භාව නපුංසක— ධම්නට නොපසු නොපෙරටවසැ යුසේයි. එයින් එකුප්පාද කියූහු. [3]උප්පාද ඛණ කියන බැවින් එක නිරොධ නො කියූහු. **උප්පාද පච්චයට්ඨෙන** යන ඈ පරිහාර. මෙයින් ධම්නට පුරෙට්වැ [4]උපජුනෙයින් සිත්හු පුබ්බඞගමායි නො කියම්හ. සහධමුන් උපනට වෙසෙස් කරණ බැවින් 'පුබ්බඞ්ගමා ධම්මා' යුවෙත්. පච්චයට්ඨයෙන් පුබ්බඞ්ගම වොහාර බැවහාරජ් ඇතිසේය් දක්වනුව වස් 'යථාපි' යන ඈ කියූහු. **එවං සම්පදමිදං,** එවං සම්පදං එතස්සාති එවං සම්පදං—එවැනි [5]සැබජම් ඇතියේ යුසේයි. ධම්නට සිත්හු [6]පසවන සෙයින් බැතිරෙක මුඛයෙන් සැධියපි වැ "නහි තෙ මනෙ අනුප්පජ්ජනෙත උප්පජ්ජිතුං සක්කොන්ති" යුහු. සිත්හු නො උපන නො උපජිය හෙන බැවින් සිත්හු ධම්නට පසවන බවු ජන්නේ යුසේ. ධමුන් නො උපන නො උපජිය හෙන බැවින් ධමුජ් සිත්හට පස වේ නො යනුවනට "මනොපන-පෙ-උප්පජ්ජති යෙව" යුහු. අහේ සිත් හා කුසල් සිත්හු සොභන චෙතසිකයන් නො උපනුජ [7]උපජති. **සෙසු කුසල් සිත්** හා අබ්‍යාපාද සිත් මෙ අකුසල චෙතසිකයන් නො උපනජ උපජති යුසේ. **අධිපතිවසෙන,** තුමා ඉසුරුයෙහි පවත්වන විසින්. අධිපතියක් හට සෙට්ඨවොහාර ඇතිසේ දක්වති "යථාපි-පෙ-සෙට්ඨො" යි. අධිපති අට ඇති බැවින් සිත්හටද සෙට්ඨවොහාර කළැයි දක්වති "[8]තථා තෙසම්පි මනොති මනොසෙට්ඨා" යි. **තෙසම්පි** යි ධමුන් කියනු.

---

1 ධම්මනු. 2 පුබ්බංගමො. 3 උප්පාදනා. 4 උපජිනෙයින්, 5 සැබැජ්ම, සැබැජුම්, 6 පුවසන, 7 උපජනුනි. 8 යථා.

"**මනො**" යනුයෙහි "සෙඨා" යනුවක් ඇරැ "මනොසෙඨා" යි යොජනු. "දූරැ ආදීහි" යන තැන ආදිගහණින් [1]සුවන මතකිකාදී ගන්නේ. [2]**'තානි තානි කටක කුණ්ඩලාදීනි'** යන තැන ආදි ගහණින් සුවණ්ණමයාදි ගන්නේ. **මනසො නිපඵනනකතා,** [3]චිතතාතමක තැන් සඳහා නොකියූ යැ. සිත් පසයෙන් වූ තැන් සඳහා කියූහු. [4]**ආගනතුකෙහි අභිජඣාදිදොසෙහි පදුසෙන,** භවඟ මන් අභිජඣා නැතිවැ පවත්හිමෙ වන බැවින් අවුතුවූ අභිජඣාදි කෙලෙසින් දූස්නා ලදුයෙන්. **අභිජඣා** නම් [5]පරායත් තුමහට වුව දහයි සිතන [6]ලොබ්. ආදි ගහණින් බ්‍යාපාද ඈ ගන්නේ. පදුඪ අපප දුඪ සිත් වෙන්කොට දක්වියපිවැ 'පකතිමනොහි' යන ඈ කියූහු. පිළිසඳ සිත්මෙ භවඟ සිත්වන බැවින් හේ පකති [7]සිත් නම් වී. හේ අපපදුඪ නම් වෙයි කෙලෙස් සපියෝ නැති වන බැවින්. කිරියමය සිත්හි කෙලෙස් සපියෝ ලදුයෙක් පදුඪවේ. සෙසු අපපදුඪවේ. දැන් හැම සිත් අපපදුඪ සිත් හා [8]එකතතනයෙන් ගැන අපපදුඪකොට කෙලෙස් සම්ප්‍රයොග විප්‍රයොග විසින් නානතතයෙන් ගැන පදුඪ අපපදුඪ කොට දක්වති 'යථා හි' යන ඈ නිදසීතයෙන්. මෙහි 'පසනනං උදකං' යනු එකතතනයෙන් පසනන අපපසනන උදක පසනනකොට ගත්සේ. "ආගනතුකෙහි නීලාදීහි උපකකිලිඪං නීලොදකාදිභෙදං හොති" යනු නානතතනයෙන් අපපසනන උදක වෙන්කොට පැසේ. 'නව නවං උදකං'යි එකතතනයෙන්. "නාපි පුරිමං පසනන උදකං'යි ඈ නානතත නයෙන්. මෙයින් දෙ නය ව්‍යකතකොට දැක්වූහු. **තමපි,** ඒ සිතුජ්. [9]මෙයින් එකතතනයෙන් අපපදුඪකොට ගත් සිත් දැක්වූහු. "ආගනතුකෙ අභිජඣාදිදොසෙහි පදුඪං හොති"යි නානතතනයෙන් වධකදුඪවනසේ දැක්වූහු. 'නව නවං චිතතං නාපිපුරිමං භවඟ චිතතමෙව'යි දෙ නයෙන් සිත් බෙදා දැක්වූහු. 'තෙනාහ' ඇයින් තුමන් කියූ අර්ථයට ආගම දැක්වූහු. මෙහි 'පභසසරමිදං භිකඛවෙ චිතතං' යනු පභාසුර සිත් හා එකතතනයෙන් ගැන හැමසිත් පභසුරැකොට දැක්වූසේ. 'තඤච ඛො ආගනතුකෙහි උපකකිලෙසෙහි උපකකිලිඪං" යනු පභසුරැසිත් බිඳ නානතතයෙන් අපපභසසර සිත්

1 සුවණ්ණ, සුවණ. 2 'තානි තානි භණ්ඩානි'—මු. ඛ. අ. 3 චිතතාතමකතාන්. 4 අපට දක්නට ලැබුණු පුස්කොළ පොත්වලින් එකක හැර අනික් සියල්ලෙහිම "ආගනතුකෙහි අභිජ්ඣාදි කෙලෙසින් දූස්නා ලදුයෙන්" යන්න පමණක් පැණේ. ඉතිරි පොතේ පාලිපාඨය නිවරදලෙසද සත්නය "භවුගහන් අභිජාැනිව පවත්හිමෙ වන බැවින් හව්තුබූ අභිජ්ඣාදී කෙලෙසින් දූස්නා ලදුයෙන්"යි දෙෂදූෂිතවද තිබේ. 5 පරායත්, පරසන. 6 ලොබ්. 7 සිත් නම් වී, 8 එකතතයෙන්, 9 තමෙන්සිත්.

වෙන්කොට **දුක්වූසේ. එවං**, මෙසෙයින් පදුළ අපපදුළ සිත් ඇතියෙනි; **පදුට්ඨෙන මනසා**, පදුළ සිතින්; **වචීදුච්චරිතමෙව [භාසති]**, වාක් [1]විඥපති [2]කියනු මෙ නං පතිඨාපක චෙතනා [2]කියනුමෙ. චෙතනා කියත් 'භාසති' යනු නොයෙදේ නො යත්–භාසනයට හෙතුභාව ගැන කියනු බැවින් නිදෙස්. **කායදුච්චරිතං** යනුයෙහිප් කාය විඥපති චෙතනා විසින් යොජනු. **මනොදුච්චරිත** නම් අභිජ්ඣා ව්‍යාපාද මිසදිඨ. [3]'චතුසු අපායෙසු ගච්ඡන්තං' සි යොජනු. **තමභාවං**, අඳුරුබැවු–දිළිඳුවැ කුරුකුඹු ඇව නො පැනෙන බැවු; **කායවත්ථුකං**, සිරුරු අධිඨන්කොට වන දුක්. **ඉතර** නම් චෙතොවත්ථුකයි; හේ සිත් අධිඨන්කොට වන දුකි. **කායික විපාක දුක්ඛ** නම් අකුසල විපාක කාය විඤ්ඤාණ සම්පටිච්ඡන සන්තීරණ; **චෙතසික විපාක දුක්ඛ** නම් අකුසල් විපාක අරමුණු. **අභික්කන්තමනාපස්ස ගීවං**, පුරෙට වැ යනුවා [4]කඳට; **පටික්කන්තමනාපස්ස ඌරුමංසං**, පසුබස්නවුනු කළවේ මස්; **පදානුපදිකං**, (පියනුපියවූයේ;) **සහ පටිසම්භිදාහි**, සිවුපිළිසිඹියා හා සමඟ; **අරහත්තං**, රහත්ඵල; **සම්පත්ත පරිසාය**, සෙසු සැපත් පිරිසට; **සාත්ථිකා**, වාසනාධානතො ඵලගවහොානිප්පාදනතො —

## 1 චක්ඛුපාලත්ථෙරවත්ථු.

**පිළන්ධනං**, පළඳනා; **සුවණ්ණකාරස්ස**, තුලාරක්හට; **වෙතනං**, බැල; **සුවණ්ණං කොට්ටෙත්වා**, රන් තළා; **මට්ඨානි**, කටාම් නැති බැවින් මටවූවන්; **මට්ඨකුණ්ඩලීත්වෙව**, මට්ට කුණ්ඩලීයි මෙ; **පණ්ඩුසීතො**, පාළුවී; **පණ්ඩුරොගො**, එනම් රොච්; **තිකිච්ඡාපෙති නාං**–නං, ඒ රොච්; **තිකිච්ඡාපෙති**, සන්හිඳුව; **නොහොත් නං**, එතක පුත්නු; **තිකිච්ඡාපෙති**, තිරෝකර; [5]**භොති**, [6]භවත; **ධනබ්‍යයං**, ද්‍රව්‍යක්ෂය; **කිං භෙසජ්ජං**, කවර බෙහෙත්; 'කතර භෙසජ්ජං'යි සේයි. **යංවා තංවා**, යම්තමක්. එම කියති 'රුක්ඛතචාදිං' යි. [7]බමුණා [8]සිතු [9]හැඳින එවි බෙහෙද [10]බැළ නැතියෙන් අනාදරවැ එවි [11]යමක්තමක් කියති යුසේයි. **බලවපච්චූසසමයෙ**, බිළිපසොස් සල්[12]සිම්පාති. 'පච්ඡිම යාමාවසානං පච්චූසො, සො එව නාතිඕසානකතා බලවපච්චූසො, තස්මිං බලව පච්චූස සංඛාතෙ සමයෙ'. මහාවිසයතා මහතී කරුණා [13]මහාකරුණා,

---

1 විජාපත්. 2 කියනු මෙවි. 3 චතනා රා අපාගෙ. 4 කැඳවා. 5 හොති. 6 කව, කවතා. 7 බමුණු. 8 සතු, සාර. 9 හැඳින, හැඳිකා එල් වේද. 10 බලනැතියෙන්. 11 යම්තමක්. 12 සිම්. 13 'මහාකරුණා' යනු එක පුස්කොළපොතක පැනෙ.

සා එව සමාපජ්ජිතබ්බට්ඨෙන සමාපත්තීති **මහාකරුණා සමාපත්ති,** තතො වුට්ඨාය—කරුණාසවින් සමවැදී එයින් නැගිය යුසේයි. නොහොත් කරුණාජ්ඣානපුබ්බක රහත් ඵල සමවැතින් නැගී. **කතාධිකාරානං,** කළ අධියර ඇති යන්—නිබ්බෙධනාගියැ කුසල් ඇතියන යුසේයි. **උස්සන්න කුසලමූලානං,** අධික කුසල්මුල් ඇතියන්. 'විනෙතබ්බට්ඨෙන [1]වෙනෙය්‍යා, අරියභාවනිප්ඵාදකෙන කුසලමූලෙන සමන්නාගතත්තා බන්ධවාචාති **වෙනෙය්‍යබන්ධවා,** නෙසං. **බුද්ධචක්ඛුනා,** බුදුඇසින්—ආසයානුසයඤාණ හා ඉන්ද්‍රිය [2]පරාවරතාඤාණ 'බුද්ධචක්ඛු' නමි. **ඤාණජාලං,** නුවණදැල්—බුද්ධචක්ඛුමෙ කීසේයි. **පත්ථරි,** පතළේ; **තස්ස අනෙකා,** ඒ ඤාණජල්හු ඇතුළු—විසැඤණසට විෂයවීය යුසේයි. **ආළාහනෙ,** සොහොන්හි. 'ආනෙත්වා දහන්ති එත්ථාති ආළාහනං.' **සබ්බකාම හාරාලඞ්කාර පතිමණ්ඩිතං,** සැම ගැලෙක්හි පිරිය යුතු පමණ පලඳනායෙන් සජනලද. 'සබ්බ සකමෙසු හරි තබ්බත්තා සබ්බකාමහාරා, තෙච තෙ අලඞ්කාරාච සබ්බකාම හාරාලඞ්කාරා, තෙහි පතිමණ්ඩිතං සබ්බකාමහාරාලඞ්කාර පතිමණ්ඩිතං'. අච්ඡරානං සහස්ස පරිවාරො එතස්සාති **අච්ඡරාසහස්ස පරිවාරො,** තං. **අයං සිරිසම්පත්ති,** මෙ සිරි සැපත්. 'සිරිසංඛාතා සම්පත්ති සිරිසම්පත්ති'. නොහොත් අත්බැවූ සිරිහා උපභොගසපුව. 'අයං සිරි අයං සම්පත්ති' යි යොජනු. **විප්පකාරප්පත්තානං,** එවුහු [3]විපුවරවතුවනු. පුත්හට පිළියම් නොකෙළෙයින් වන [4]විපිළිසර විප්පකාර නම්. 'විරූපො පකාරො විප්පකාරො'. **පිතරි අක්ඛන්තියා,** පියාකෙරෙහි උපන් අක්ෂමායෙන්; **මට්ටකුණ්ඩලිවණ්ණෙන,** [5]මටුකුඩලිහි සැටියෙන්; **ධම්මපදෙ ගාථං,** [6]ධම්පියෙහි ගා. ධම්මපදනම් සඞ්ග්‍රහයක් [7]එසඳැ නැති බැවින් "ධම්මපදෙ ගාථං" යනු නොයෙජේ නො යත්—මතුයෙහි ධම්මපද නම් සඞ්ග්‍රහයෙහි [8]සැඟහියයුතු තැන් ගැන තිබැවින් යෙජේමෙයැ. [9]බුදුන් සදජු මෙතියර දෙශනා ධම්මපද නමියි වෙන්කොට ගජාරන බැවින් යෙජේමෙ. 'ධම්මපදෙ සංගහෙ තබ්බං ගාථා' යි කියයුතුයෙහි 'සංගහෙතබ්බ' පද ලොප්කොට කීයේයයි [10]ගන්නේ. **ධම්මාභිසමයො,** ලොවුතුරාධම් පිළිලැබ; **ධම්මපානො,** ධම්මදෑන; **කතසරීර පටිජග්ගනො,** කරනලද මුඛ ධොවනාදී සිරුරු පිළිජග් ඇතියේ. 'සරීරස්ස පටිජග්ගනං සරීරපටිජග්ගනං, කතං සරීර පටිජග්ගනං යෙන' යන වාක්‍ය. **අනන්තරෙ ගෙහාභිමුඛො,** දෙරට පිටිපැ—ගෙට [11]මුහුණදී;

1 විනෙයෙසා, 2 පරාවරණ 3 විපුරවච්තුවනි. 4 විපිළිසාර. 5 මට්ටකුණ්ඩලී. ධම්පියාසෙහි ගාථා. 7 එස එකාන, 8 සැඟවියයුතු, හැඟවියයුතු. 9 බුදුන්ජු 10 ගණනෙ. 11 මුහුණ.

**ඒකං රස්මිං විස්සජ්ජෙසි**, තුමා බලනු සඳහා රසක් විහිටි. කට යුතු නොදක්නා බැවින් හා නොකටයුතු කරන බැවින් **අන්ධබාලං** යි. **කායවෙය්‍යාවටිකං**, කයින් කටයුතු මෙහෙ. කටැට යෙහි නොවත්නා බැවින් **අවිධෙය්‍යා**. 'විධාතුං අසක්කුණෙය්‍යා' යුසේ. **මනමෙව** යනුයෙහි 'එව' කාර අඤ්ජලිකරණ ඈ වළකා. **අලං එත්තකෙන ඉමස්ස**, ඒ මතුයෙන් මෙවුහට හඹා. සග මෙවුහට චිත්තප්‍රසාද මතුයෙන් නිපජ්ජි යුසේ. **චක්ඛුපථං**, ඇස්සමු; **විජම්භෙන්ත විජම්භෙන්ත**, පිඹත් පියත්.—ශොකාර්ථි ආමෙඩිත. පහන් සිත් නොබිඳැමෙ කලුරියකළ බැවින් [1]**පසන්නමනො කාලං කත්වා** යුහු. **සුත්තප්පබුද්ධො විය**, නිඳු [2]පුබුද්දක්හු සෙයින්. 'පඨමං සුත්තොවිය පච්ඡා පබුද්ධො විය'—සියු [3]බෙණෙහි නිඳු පිළිසඳ [3]බෙණෙහි පුබුද්දක්හු වැනිය යුසේයි. **රොදනපරායනො**, [4]වලප්පරිසින්කොටැ ඇතියේ. 'රොදන පරායනං එතස්ස' යන වාක්‍ය. **දෙවසිකං**, [5]දවන දවන. [6]**හා** යනු විෂාදාර්ථි. **එකපුත්තක** යනුයෙහි 'ක' ප්‍රත්‍යය අනුකම්පායෙහි. 'හා එක්මෙ පුත, හා එක්මෙ පුතැ' යි කැපැ කැපැ [7]ඕරෙයි යුසේයි. **අත්තනො සම්පත්තිං**, තුමා හවභොගසම්පත්; **අඵාසුක කාලෙ**, නොසුව කල්හි. 'නත්ථි ඵාසු එත්ථාති අඵාසුකො, සොච සො කාලො චාති අඵාසුක කාලො, තස්මිං අඵාසුකකාලෙ'. **බාහා**, දෙහො අතුන්—කර්ම බහුවචන. **රොදන්තො අට්ඨාසි**, වලප්මින් සිටි. මෙතැන 'වලප්මින් සිටි' යි බැවින් යට 'නිපජ්ජිත්වා රොදිස්සති' යි බුදුන් දුටමහ යනු නොයෙජේ. ඉති බැවින් එතැන 'ඨත්වා රොදිස්සති' යනුමෙ මැනැවි. [8]එයට නිසිසේ මෙතැන 'රොදන්තො නිපජ්ජති' යි කියැයුතු නොයත්—'බාහා පග්ගහය' යනු ඨානායට මෙ යෙජෙන බැවින් හේ නොයෙජේ. **අලඞ්කතො**, සැජියෙහි; **මට්ඨකුණ්ඩලී**, මටකුඩුල් ඇතියෙහි; **මාලභාරී**, මල්බර ඇතියෙහි; **හරිචන්දනුස්සදො**, හරිසඳුන් ගැල්වූ යෙහි. 'උස්සද හරිචන්දනො'යි කියයුතුයෙහි 'උස්සද' ශබ්දයට පරනිපාතකොට කියූ. **කිං දුක්ඛිතො තුවං**, කවර කරණෙන් තෝ [9]දුක්පත්හි; **සො ආහ**, දෙව් පුත් කීයි; **සොවණ්ණමයො**, රන්මුයේ; **පභස්සරො**, පහාසුරු; **රථපඤ්ජරො**, රියපජරෙක්; **තස්ස**, ඒ රිය පජරට; **චක්කයුගං**, දෙස කක්; **න වින්දාමි**, නො ලැබෙමි. 'තෙන දුක්ඛිත' යන තැනට 'දුක්ඛිතො' යනු ඇරැ යොජනු. 'ඒ නොලබන දිකින්

1 සමත්තමනො. 2 පුබුද්දුහුසෙයින්. 3 කෙණෙහි. 4 වප්පරින්සින්කොට ඇතියෙහි. 5 දවනහ දවහ, දවනග දවහ, දවනහදවස්හි. 6 මුද්‍රිත ධම්මපදඅට්ඨකථාහි 'කහං' යි පැතොතුදු නිරවද්‍ය පාඨය 'හා' බැවි 'හා එක් මෙ පුත' යන් නෙන් සවුමවේ. 7 ඔරෙන. 8 එයට නිසේ. 9 දුප්පත්,

දුක්පත්මි' යුසේ. මෙතෙකින් 'කිං දුක්ඛිතො තුවං' යන පුවසයට විසඳුන්දී දූන් [1]සක්යුග නොලද තුම දිවි නොසිරි නාසේ කීයා. 'ජහිස්සං ජීවිතං තෙන දුක්ඛිතො' යනු ජීවිත ජහනයට සාධකතම කොටැ යොජත් දෙස් නැත්මෙ. මෙග සින් දෙව්පින් තමා [2]දිලුබ් ජේයට වලප්නසේ දක්වා 'මා සෙයින් මෙ තොද දිලුබ් ජේයකට වලප්හි' යුසේ. බමුණු අභිප්‍රාය නො දූන 'තට කැමැති සක් සගළක් දෙමි. නොවලප'යි ''සො වණ්ණමය'' යන ගයින්. **රූපියාමයං,** රිදීමුවා. ආකාර ගාථා බන්ධන සඳහා [4]දිගි. **පටිලාභාසාමි,** පිළිලබවමි. **තෙ,** තායි සේයි. **මාණවො,** දෙව්පිත්. භූතපූර්වගතීන්හෝ [5]මණ්ණාව වෙසින් ආ බැවින් හෝ 'මාණවො' යුනු. 'භෙසජ්ජං අකාසවා රොදතෙතා'යි යොජනු. **පුත්තපතිරූපකං,** පුතනසදිසං; **නිගණ්ණිස්සාමි නං,** එවුනු නිගනිමි. පුතන [6]පටිසෙධනෙන පිළුනං නිගගහො. **කිව මහනනං,** කිපමණ මහත්. ඔහු නො දියහැකි සක් සගළක් දක්වියපිවැ 'චන්ද සුරියෙහි මෙ අනෙථා' යී. 'රූපියාමයං' 'මණිමයං'යි කීබැවින් මේජ් රජත මණිමය වන බැවින්ජ් චක්‍රාකාර වන බැවින්ජ් 'තා විසින් පටිසැඳූන නො?' යන අභිප්‍රායයි. **උභයෙසත්,** උභො ජ්නු. **හාතනෙ,** හාසමානා. 'හා [7]දිපෙතණ' යු තැන්. කුමයි [8]කියැව යත් ? ''මාගෙ රිය රන් රියෙ යැ. එයට [9]දිලිසෙන සක් සගළක් වුව මැනැව මේ ලෙවුහී ජිලිසෙනුවෝ හිරුසඳු දෙජේනයැ. ඔවුන් මට සක් සගලකොට දෙ''යි කීයව්. බමුණු පළමු [10]පුත්හට නා ඇවිටු මෙම වැනිය යි හඟවනුව බස් [11]කීබැවු නොදූන ''බාලො ඛො තවං'' යන ගා කී. **පත්ථයෙස අපත්ථියං,** නො ලැබෙන බැවින් නො පැතිය යුතු පතහි. **මරිස්සසි** යනුයෙහි 'ඉති' ශබ්දයක් [12]හෙළයි 'තො මියන්නෙහි'යි අජී කියනු. 'කුමට මියනෙමි' යනුවහට ගේ දක්වා ''නහි **තං** ලච්ඡසි චන්ද සුරියෙ'' යී. **හි** ශබ්ද හෙතුවර්ථි—'යස්මා චන්ද සුරියෙ න ලච්ඡසි තස්මා මරිස්සසි' යුසේ. 'සුරියෙ' යන තැන උ෴කාර ජන්දනුරක්ඛන විසින් දිගි. **ගමනාගමනං,** හිරු සඳ දෙජේනාගේ ගමන් හා ආගමන්. ගමන් නම් [13]උදගලින් හත්ගල්පවා යිම්. ආගමන් නම් ගියවුනු පිළි උදගලට ඊම්. **'අපි'** ශබ්ද සම්පිණ්ඩනාර්ථි. 'වණ්ණධාතු [14]විපියොපි' යි යොජනු. පරලොකං ගතො **පෙතො,** පරලෝ ගියේ. කාලං මරණං, තං කතො **කාලකතො,** මෙළේ. **කන්දතං,** වලප්නා

1 සක්තුත. 2 නොලද්. 3 දිලුබුජයට 4 දිසි. 5 මණෙවා, මාණො. 6 පටිසොධනෙන. 7 දීපනං. 8 සැටිය. 9 දිලිසෙත, දිලියන. 10 පුත්නවත. 11 කීබැවින්. 12 එළයි. 13 හැම පුස්කොළ පොත්වලම 'හත්ගලින් උදගල් පවා'යි පැනේ. හත්ගලින්'යිද පාඨයි. 14 විපියොපියොපි.

අප දෙජනා අතුරෙනි; **කො නු බාල්‍යතරො**, බලිනෙරෙක් කවරෙහෝ—පැනෙන හිරුසඳම වලප්නා මමයැ හෝ නො පැනෙන පුත්හට වලප්නා තොපය හෝයි සේයි. **චන්දංවිය දාරකො රුදං**, සඳට වලප්නා දරුවක්හු සෙයින්—චන්දං රුදං දාරකොවිය. [1]**කාලකතාභිපත්ථයං**, මළහු පතම්. 'කාලකතං', 'අභිපත්ථයං' යි බිඳිනේ. **ආදිත්තං වත මං සන්තං**, මා සෝගිනිහ් දිලියෙන [2]සැගැවියා අනුසස්නෙයි; **ඝතසිත්තං**, තෙලින් ඉස්නාලද; **පාවකං**, ගින්නක්; **වාරිනා**, දියෙන්; [3]**ඔසිඤ්චංවිය**, තෙමනුවක්හු සෙයින්; **සබ්බං දරං**, හැම කායචිත්ත දරථ; **නිබ්බාපයෙ**, නිවිහි; **අබ්බහී**, උපුළෙහි. සිත් [4]පිළුණීකොට සිටුනෙයින් ශොකයට **'සල්ලං'** යි. **සොකපරෙතස්ස**, සොකෙන අභිභූතස්ස. පුත්ත වියොගජං සොකං **පුත්තසොකං**—මධ්‍ය පදලොප් සමස්. 'සො ත්වං **අපානුදී**' යි යොජනු—අපහරි **අබ්බූළ්හ සල්ලොස්මි**, උපුළ හුල් ඇතියෙමි. 'අබ්බූලහං උබටං සල්ලං යස්ස' යන වාක්‍ය. **තව සුත්වාන**, තව අනුසසුන් අසා. 'අනුසාසනං' යනු වක් අරනේ. **දෙවතා නුසි ගන්ධබ්බො නුසි** යනු සංශයෙහි තො දෙවියෙක්හි හොයි නොනියමා පුළුවුත්සේ, **ගන්ධබ්බො නුසි**, [5]ගඳබ ගළ වැසියෙක් හි හොයි නියමා පුළුවුත්සේ. 'ගන්ධබ්බොදෙවතානුසි' යි එක්පද කෙරෙත්මෙ. **ආදු**, නොහොත්—'උදාහු' යුසේයි. **සක්කො** යනු නම්, **පුරින්දදො** යනු එවුනු [7]පූ පිරි ගුණේ. 'පුරෙ දානං දදාතීති **පුරින්දදො**.' නොහොත් 'පුරින්දදෙ' යනු නම්. 'සක්කො' යනු ගුණේ. **සක්කොති** වීසු දෙව්ලොකෙසු දෙවෙ අනුසාසිතුං [6]අසුරෙව අභිභවිතුං පහොති යුසේයි. පාරිය දැක්වූසේ එවි. **කො වා ත්වං**, නොහොත් තො කවරහි—[8]තා මිනිස් දෙවියන් අතුරෙහි [9]කවරුනම්හි යුසේයි. **කස්ස වා පුත්තො**, නොහොත් තො [10]ක දරියෙහි—තා නොකියපිහොත් තා මවුපියනු ජු කියා යුසේ. **කථං ජානෙමු**, කි සෙයින් දන්මහ—'නාම ගොත්තාදීසු කෙන පකාරෙන ජානාම' යුසේ. නොහොත් පුසයට හේ දක්වා තා නොකියුහොත් කිසෙයින් තා දන් මෝද එසෙයින් පුළුවුස්මහ යි. 'අත්ථස්ස ආවිකතී'' යි යොජනු. **යංච කන්දසි**, යම් පුතක්හු පිණිස හඬසිද. **යංච රොදසි**, යම් පුතක්හු පිණිස කඳුළු [11]මොණුයෙහිද; **සයං** [12]**දහිත්වා**, තෙමේ දවා; **ආළාහනං**, අව[13]ඡ් තා පිතිම්. **කුසලං කම්මං**,

1 කාලකතාභිපත්ථයෙ. 2 සැහැවිය. 3 ඔසිඤ්චිවිය. 4 පිළිණීං, පිළිංණි, පිළිනිත්. 5 ගඳබගහිළ, ගඳඹගල. 6 සුරෙව. 7 පූ සිරි. 8 තාම්මිනිස්. 9 කරුම්හි, අරුම්හි, කරුමෙහි, 10 කදරියෙහි. 11 මුහුණු. 12 ඩහිත්වා. 13 එතම්පිතිම්, එතමපිතිම්.

බුදුන් දක නමා කළ චිත්තප්‍රසාද සඳහා කියා—පුන පුන පුළුවුසුන් [1]ගොරොක්කොට කියනෙම් යි. **සහව්‍යතං,** සහ භාවං, සමඟ වන බැවු. **දුතං,** දී ධමක්. ‘දීයතීති දුතං’ **දදනතස්ස,** දෙනුවා. ‘දදනතං’ යි සේයි **ෂෂ්ඨී** විපරිණාමයෙන් හෝ, නොහොත් ‘දදනතස්ස තව දුතං නාද්දසං’යි යොජනු. **සකෙ අගාරෙ,** අතනනො ගෙහෙ; **උපොසථකම්මං වා,** පෙහෙ ධමක් එව්; **තාදිසං,** එබඳුවක්—සඟනි උපදවන්නට නිසියක් යුසේ. **ආබාධිකො,** උපන් රොව් ඇතියෙම්. ‘ආබාධති පීළෙතීති ආබාධො, සො එතස්ස අත්‍ථීති ආබාධිකො’. **දුක්ඛිතො,** ආබාධයෙන්වූ කායික චෛතසික [2]දිකින් දුක්පත්මි; **ගිලානො,** [3]ගුලින් පි සොම්නස් ඇතියෙම්. ‘ගෙල හර්ෂක්ඛයෙ’ යන ධාතුයි. **ආතුරරූපොමහි** [4]ආතුර සැහැවියෙම්—රෙලූ හල්ලෙම් යුසේයි. ‘බුද්ධං අද්දක්ඛිං’ යි යොජනු. **විගතරජං,** කඩවූ කෙලෙස් ඇතියා. ‘‘රාගො රජො නාව පන රෙණු වුච්චති’ යු බැවින් ‘රජ’ ශබ්ද කෙලෙස් කියා. ‘විගත රජො යස්ස’ යන වාක්‍ය. **විතිණ්ණකඞ්ඛං,** තුරූ කක් ඇතියනු. ‘විතිණ්ණා කඞ්ඛා යෙන’ යන වාක්‍ය. කක්, [5]විසිකිස්. සොභන ගමනතතා [**සුගතො**], මනාවූ පිළිවූවායෙන් ගියානු, නොහොත් සුන්දරඨානගතතතා, මනාවූ තැනට ගියවූවන යුසේයි. **අනොමපඤ්ඤං,** පිරියුණු පැනා ඇතියා. ‘පරිපුණ්ණපඤ්ඤං’ යුසේයි. බුදුන් හැම පැනජ [7]අනාධෙය්‍යාතිසවැ නිපන් බැවින් බුදුහු අනොමපඤ්ඤ නම් වුනු. ‘අනොමා පරිපුණ්ණා පඤ්ඤා යස්ස’ යන වාක්‍ය. **මුදිතමනො,** හඩ චිතෙතා; **තාහං,** තං අහං; **අචඡියා,** අසිරි—එක්වන්නෙ නොවන ජැ අසිරිනම්. **වත** යනු විසමයෙහි. **අබ්භුතං,** [8]නොවූ විරූ බැවු. **අයං විපාකො, ඊදිසො විපාකො** යි යොජනු. ‘අයං’ යී දිව අත් බැවු [9]දකැ කියා. ‘ඊදිසො’යි එහි සිරි හා ආභරණාදී උපභොග [9]දකැ කියා. **සරණං වජාමි,** යනු භාවනපුංසක—සරණකොට සෙමි යුසේයි. [10]**සිකඛාය පදනි** යනු [11]අලුප් සමාස—‘සිකඛාපදනි’ යුසේ. **අඛණ්ඩානි අඡුල්ලානි** යි වෙන වෙන යොජනු. ‘**අඛණ්ඩානි**’ යී ආදි අනතයෙහි විකුම් වැරිය. ‘**අඡුල්ලානි**’යි ඡිද්‍ර සබල කම්මාස වැරි. පන්සිල් [12]සියර්විත් පා ‘‘පාණාතිපාතා’’ යන ඇ ගයින්, **අමජ්ජපො** යන තැන ‘හොති’ යනු ඇරැ යොජනු. **මා හණාහි** යි යොජනු. **සකෙන,**

1 කොරොක්කොට. 2 දෙකින්. 3 ගුණ්, ගුත්. 4 ආතුසහැම්යෙමි, ආතුසහාම්යෙමි. 5 විසිස්. 6 ගමනමතතතා. 7 අනාධෙය්‍යතිසවැති පැන බැවින්. 8 නොවූවිරූබැවින්වි. 9 දුක්කියැ. 10 සිකඛායං. 11 සමන්, 12 සියවම්ම්වා, සියරිවින්වා.

ඤාතං'යි උපදනා [1]පච්චත්ත ඤාණින් දැනැය යුසේයි. **උප්පසම්පජ්ජ විහරති,** ඇටිඇටිසඳ සමවැජැ වෙසෙයි; **මුචාමහං,** අව මුජම්; **එතස්මා පටිස්සවා,** ඒ පිළිනයෙන්—ඒ ඇපයෙනි යුතැන්. 'චෙතො' යි යොජනු—සතැන උපන් රහත් ඵල සිත්. **චෙතසා,** චෙතොපරිය ඤාණින් නොහොත් [2]සව්ඤඤාණින්; **පරිච්චං,** පිරිසිඳැ. **විහරති** යන තැන 'ඉති' ශබ්දයක් දක්නේ. **සස්ස,** යමක්හු විසින්; **නිත්තිණ්ණා,** තරනලදු; **පඞ්කා,** කෙලෙස් මඩ; **මද්දිතො,** මඩනලදු; **කාමකණ්ටකො,** කණ්හකටු; **මොහක්ඛයං,** රහත් මගඵල එව්; [3]**සුඛදුක්ඛ නවෙධති,** ගේ සුවහයි දික් [හයි] නොකපි—සුඛ දුක් අරමුණු හා කම්අනුරිවින් උපජන ඵමුලු අනුනය හා පිළිසු සුන් බැවින් [4]නතුරු මැඳහත්හිමෙ සිටි යුතැන්. **ඉදානි මහා කාලං,** දැන් තා උකටලී කෙසේයැ; **ආලයො,** අදහස්; අඤ්ඤං, රහත්; **දුච්ඡන්නගෙහ සදිසො,** දුසෙවු ගෙකක් වැනිය—[5]හවුන්සැති සිඳැ අතුරැ අතුරෙහි මිස විතක් උපජන බැවින් දුසෙවු ගෙකක් වැනි. **පබ්බජිත කිච්චස්ස,** පැවැජි කිසය—පැවැජිකිස නම් මෙතැන විවසුන්ධුර. **මණ්ඩකං,** මතු—රහත්ඵල; **විරලච්ඡන්නකං,** නොගනකොට සෙවු; **ඡිද්දාවඡිද්ද,** සිද්අවුසිද්—ඡිද්ද නම් මහ සිද්, අවඡිද්ද නම් කුදු සිද්. **වස්සවුට්ඨි** යනු 'වුට්ඨි' ශබ්දයෙහි අර්ථ දක්වයි. **අතිවිජ්ඣති,** විජුති—[6]නොහැවූ සිතට [7]වජති යුසේයි; **ආමිසං කත්වා,** [8]අඹකොටැ; **කුම්භහාරං,** කුඹක් බර—කුම්භ නම් දසාමුණෙක යෙත්; **සො,** ඒ වෙණෙජ්; **ගුළභාරකෙකි [සඞ්ං],** ගඩබුවන් වහා [9]බර හා සමඟ; **සාව භණ්ඩස්ස විස්සජ්ජනං,**[10]බඩු විහිජන දූත—විකුණන ජනයිසේයි; **චරිතුං,** කන්නට; **පරිතො පිණ්ඩ චරමානො,** පිරිවට කන්නේ; **කාමසංයොජන සමවනකං,** කාමසංයොජනයෙහි [11]ගලවනුවට—කාමරාගයෙහි යොජනුවටය යුසේයි; **උක්කණ්ඨි,** උකැටි—පුවස්කෙලෙයි සේයි; **පාතොදං,** කැහැටි; **සොළසඞ්ගුලකණ්ටකං,** සොළොස් අඟුල් දික් කටු ඇති; **පුරතො පතිට්ඨපිත්වාන,** පෙර පයින් පිහිටා; **උබ්බරිත්වාන පච්ඡතො,** පස්සෙහි පා උදුරා; **සාවයිස්සාමි,** හෙළනෙම්—'පාතයිස්සාමි'යි සේයි. **සඞ්ඛමුඛං,** ශඞ්ඛාකෘති මුඛ ඇතියක; **සබ්බඞ්ග**

---

1 පච්චත්ත. 2 සවංඤණින්. 3 සුඛදුක්ඛසු. 4 රාතුරු. 5 හවුන්. 6 නොහැවු. 7 බජනි. 8 අමෙකොට. 9 ගඩබු බරහා. 10 බඩු වාණිජකා. මේ පාඨයෙහි 'දූත' 'ජන' යනු විමසිය යුතුයි. 11 ගැළවනුවට.

**සොභිනිං**, හැම අවයවයෙන් හොබිතිය; **භියො**, වටා; **වච්චං**, තෘණතණ්ඩුල ඈ වට්; **පලොභෙත්වා**, පොලඹා; **ජාතකං නික්ඛෙපෙසි** යනු චතුක්කයෙහි ගද්‍රහ ජා.....

## 9 නඳ තෙරුන් වත්.

**චුන්දසූකරිකං නාම**, සුඳුනම් හුරු වැද්දකු; **ජාතක කාලෙ**, සායෙහි; **නාළිමෙනාළි මනෙනාන** යන තැන [1]විතිඳ නැළියක බනක් දක්නේ. **කිණිත්වා**, කැණෑ ගෙනැ—[2]ඔවුන් පුස්නවුන් අතින් ගෙනැය යුසේයි; **පච්ඡානිවෙසනෙ**, පැළ දෙරැ; **වජංවිය**, ගොවුදක් සෙයින්; **නිවාපං**, තෘණාදි ගොදුරු; **රොපෙත්වා**, රුවා—හටගන්වා යුසේයි; **ආළානෙ**, වැඹැ; **උඹුමාසිත්වා**, ඉදිමැ—[3]සප්පිසි ගැනැයි යුසේයි; **චතුරස්ස මුණ්ඩගෙරෙන පොථෙත්වා**, මස් නොකැඩෙනු සඳහා සිරි මුඟුරෙන් පොයයි; **අන්තරෙ**, [4]දෙවලු අතුරෙහි; [5]**ලොහනාළියා**, උගුරු පවා පැමවූ ලොහො නැළින්; **පක්කාථිතං**, කකියන. 'පක්කාථිතං තං ආවිලං හුත්වා නික්ඛමති' යන සබඳ. **අච්ඡං**, [6]තුනුවූයේ; **අනාවිලං**, නොකැළැත්තේ; **කාළචම්මං**, කළුපැහැ ඇති සම්; **තිණුක්කාය**, තණසිළුදෙලෙන්; **ධුරවිහාරෙ**, වැළැත් වෙහෙර; **ජීවන්තස්සෙව**, ජේතුවනට මෙ—අනාදරයෙහි සාමිවචන. 'යථා බණෙනා විලයංගච්ඡති' යි යොජනු—යම් සෙයෙකින් කෙණෙකින් දද එසෙයින් අවිපරිළාහ ඇතියා අවිච්සන්තාපයැ යුසේයි. **මහාරාජ** යි මිළිඳු මහරජහට කියන් **කූටාගාරමත්තා**, කුළාර ගෙ පමණ—එක් කැණිමඩුල් දී නැගූ වඩ ගෙකක් පමණ යු නන්; **නෙරයිකාගිමති**—'නිරයෙ භවො නෙරයිකො, සො ව සො අග්ගිචාති නෙරයිකග්ගි—තමති'. **මාතුකුච්ඡිගතාවිය**, මවු කුස් ගියවුන් සෙයින්—යම් සෙයින් මා කුස් ගිනි පත් සත්හු උදරොමමයෙන් කලල කාලයෙහිජ් කම්බැලෙන් නොවිරිද්ද එසෙයින් යි සේයි. **කම්මසරික්ඛකො ආකාරො**, [7]කම්සුරුකු ආ [ර]—හුරු හඬින් හඩ හඩා දණින [8]ඇවිජුන කිරියෙන් [9]දුවුඩම් වෙනියැ කම්නු එල වැළැජුසේ [10]කීහ. [11]'නිරයසන්තාපො උපඩති' යන්නෙන් [12]උවසෙවන් කම්නු විවා උපතට අර මුණුහි නිමිත් වැටහුසේ කීනු. **පුරත්ථිමවත්ථු**, පෙරදෙර; **පච්ඡිමවත්ථු**, පැසුළු දෙර; **මුඛං පිදහනානි**, හඩ පැවිකරනුවට

1 මේ පාඨය විශ්සිය යුතුයි. 2 ඔවුංකෙ වුන්. 3 සප්පිසි. 4 මෙවලු. 5 'ලොහාළි'—මු. බ. අ. 6 තුනුළුයේ. 7 කම්සුරුකුආ. 8 ඇවිජිකිරිය මෙයිත්, ඇවිජනකිරිය මෙන්. 9 දුවුඩම් මෙවැනියැ. 10 කීන කියා. 11 මු. බ. අඨකථාහි මේ පාඨය නොපැමෙන්. 12 උවමෙවජති.

මුව පියත්; **ඉතොචිතොච**, [1][එ]මෙපස්හිජ් සිටැය—මෙහි දෙපස්හි සිටැය යූ සේයි. 'භවිස්සති ඉති මඤ්ඤෙ' යි 'ඉති' ශබ්දයක් දක්නේ. මඤ්ඤෙ යනු නිපා—හඟම්හයි සේයි. **මෙතතං චිතතං**, හිය ඉස්නා සිත්; කාරුඤ්ඤං, දික්හි කකි යන [සිත්]; **කකඛලො**, කැකුළු ඇතියෙක්; **ඵරුසො**, තද පියොවු ඇතියෙක්. 'කමමසරිකඛකං ඵලං' යි අරනේ.

## 10 චුන්ද සූකරිකයා වත්.

**සලාකයාගු**, ලහහඹු—ලහායෙනි තුමා නමි හෙළා නිබද කොටැ පෙවූ හඹු; **පකඛිකභතතං**, අඩමස් බත්; **නවචඤ්ද භතතං**, අලුත් [2]සඳ වූවූ සැදෑ දෙන බත්; '**වසසාවාසිකං** පවතතෙති' යන සබඳ—වස් වුසුවනට දෙන සැවුරැ කුඹුවා. **අනුජාතපුතතා**, [3]අනුතුරුවැ උපන් දරුවෝ; **දාන සංවිභාගරතො**, දන් හා සංවිභාගයෙහි [4]අදුසර—සංවිභාග නම් තුමා වළජනුයෙන් බෙජනු; **සජ්ඣායෙථ**, පිරිවහව්; **පඤ්චපෙසුං**, පැටියෝ; **සහසස සිනධවයුතතා**, දහසක් [5]සුදුවන් යුත්. දෙව්පුත්නු මෙ රිය හයනාල්හි සුදුවෙති සෙත්. **ආගමෙථ**, බලව්; [6]**අතිඝොනා**, අස්හි නොපිරියත්; **රථධුරෙ**, රියදුරෙහි—රිය හිසැ යූ සේයි; **තදෙව**, 'පුපඵුමං' යි සේයි. **මොදමානො**, තුස්නේ.

## 11 ධම්මික උපාසකයා වත්.

**විත්ථාරෙතබා කථිතං**, [7]විථරා හෙළවූවාහි කියනලද; **මලලානං**, මල රජ්ජුරුවන්ගේ; **නිගමො**, නියම්ගම—සෙසු ගමට වැඩි ගම් [8]නියම්ගම්; **අනුපියමබවනෙ**, අනුපියනම් ගම් [9]සිම්හි අඹ වෙනෙහි. 'යෙ පටිසඤ්ඤුතා' යන සබඳ. **බහු යොනා**, බොහොසු විසින්; **සමපනන භොගො**, පිරියුණු සැපැත් ඇතියේ; **ගුළකීලාය**, වටකෙළියෙන්; **පමිතුජජිතවා**, පියාලා; **නගර පරිගගාහිකා**, නුවර පිරිගා—නුවර යානා; **අනනහාරකාලෙ**, [10]අනතනාර නම් දුනි කල්හි; **භාගභතතං**, කොටැස් බත්; **පවිසිතුං නලභිස්සාම**, වැදුම් නොලබන මෝ—සිස් [11]පෑ [12]කුම්ට දකියැ දුන්වයි දෙව මුළට නොවැ දිය [13]දෙන්හයි සේයි. **සකනාධා එාලෙයය**, [14]සිස් පෑ දික් කියැ දුන් දෙසින් [15]සත්කඩ වැ පැළෙනු. 'ඵල විසරණෙ'. **දිබබපුවපුණණං**, දිවපිවින් පිරුණවූ; **කාසා**, 'පාතියා' යි

1 මෙපස්හිජ්ගෙහි සිටිය දෙපස්හි සිටිය. 2 සැදෑ. 3 අනුතුරුව. 4 අදුසර. 5 සුදුවන්, සුණුවන්. 6 අතිතොවිඝත. 7 විතරා. 8 නිගම්නම්. 9 සිම්වහි, සිම්හි. 10 අනතනාර දගිනල්හි. 11 පා. 12 කුම්වද ගියා දුන්වහි, 13 දෙනහයි, දෙනයි. 14 සිප්පෑ දික් කියා. 15 සත්කඩවැ.

සේයි; **ජාදෙත්වා විස සීතො** යනු පැතැරු සිටි තැන් ගැන කීයත්. **සත්තරසහරණී සහස්සානි,** සත් පමණ රස ඉහර දහසුන්; **අනුළුරි,** අනුව පතුළු; [1]**චූළුපට්ඨාකං,** පුතු හා [2]ඉගිකෙලන [3]සුළුවටාවා; **කතාභිනීහාරො,** කළ අභිනීහාර ඇතියේ—නැති බවක් නොජන්නට කළ පතුන් ඇතිය යුසේයි; **ඔභාරිත,** බැහු; **කණ්ණපූරෙ,** දඹු ඇතිරියක—දඹු මැස්සෙක; **බිදලමඤ්චකෙ,** වේපත් හැදැ; **භත්තුඨානඨානං,** බත් උපදනා තැන්; **උක්ඛලියං,** ඉකිළියෙහි; **රතනමකුලාය,** රුවන් මිළි ඇති—[4]රියන් පමණ රුවන් බදනැ පියුම් මුහුළක් කෙරෙති. ඒ ගැන කියා. 'පඨමං ඛෙත්තං කසාපෙතබ්බන්ති ආදිකං' යනුයෙහි විතර [5]සඟබෝකඳුයෙන් දතයුතු. **අපරිසන්තතාය අක්ඛාතාය,** අන් නැති බවු කීකල; **එකො,** එකරුණෙන්—කමතුන් අත් නැති කරුණීනැ යුසේයි. **සඤ්ඤං පෙත්වා,** හඟවා; **චතුරඞ්ගිනියා සෙනාය,** හස්ත්‍යශ්ව රථ පදාති යන සතර අඟ ඇති සෙනඟින්; **පරවිසයං,** අන් රජුන් විසා; **භණ්ඩිකං,** [6]බැඹි-බැඹිපෙළි. **හන්ද** යනු ව්‍යවසායාර්ථයෙහි නිපා—අප පැවැජේනුවට සනිටුහන්වූ බැවින යුසේයි; **භණෙ** යනු දැසාලපනැයි; **අලං නෙ එත්තකං ජීවිතාය,** දිවි වටනු වට එතෙක් හඹා; **පවට්ටිත්වා,** වැටි; **තෙසං,** උපාලි කපුවා හා [7]සකුන්; **විධාගතකාලෙ,** තවතුන් හා ගමන් විසින් දෙකඩවූ කල්හි; **චණ්ඩා,** සැඩනු—කැකුළෙෝ; **නිපාතිතානි,** [8]තහතලදහයි. 'නිහරිත්වා [9]පාතිතානි නිපාතිතා'. **සාතෙයුමපි,** [10]මරතුජ්. [11]**කිමඞ්ග පන නාහං පබ්බජිස්සං**'යි යොජනු. **අඞ්ග** යනු **පන** යනු නිපා—කවර කරුණෙන් අව් නොපවජ්නෙම් යුසේයි. **ලභෙත්වා,** එල්වා; **පරිචාරකො,** පිරිදරු—කැපිය යුසේයි; [12]**නිම්මානසිස්සති,** [13]නිමත කරන ලැබේ; **තෙනෙවන්තරවස්සෙන,** එමේ ඇතුළු හවුරුදු යෙහි—හවුරුදු නොසපුරාමෙය යුසේයි. නොහොත් එමේ [14]ඇතුළු වස්හි—ඇතවස් නොසපුරා මෙය යුසේයි. ඝුමමත්ථහි කරණ වචන. කරණත්ථහි කරණ වචන වූව මැනැව. තෙවිජ පැමිණෙනුවට අනන්තරවස්ස සාධකතම කළා වෙත්. **තෙවිජ්ජා,** දිවසක් පුයේනිවස් අසවුන් ඛය යන තුන් විජ්ජු ඇතියේ; **දිබ්බ චක්ඛුකො හුත්වා,** දිවසක් ඇණ උපයා; **අපරභාගෙ,** අවරකල්හි—අනන්තර වස්සයෙන් පිටත යුසේයි; **පොථුජ්ජනිකං ඉද්ධිං,** පුහුජුනන් [15]ලැබිය

1 චූළපඨාකං. 2 ඉකහිකෙළත 3 සුළුවටුවා. 4 රත් පැණ, රත් පමණ. 5 සඟබෝකඳුයෙන්. 6 බඹි බඹි පිළි. 7 සකතං. 8 තහතලදහයි. 9 සානිතානි. 10 මරණජ්. 11 කිමඞ්ගපනාහං-මූ. ධ. අ 12 නිම්මාදිසිස්සති. 13 නිම්තාකරනු ලැබේ. 14 ඇතුළු ඇතවස්හි. 15 ලැබිය වියයුතු.

සුතු ඉධ කුසලාභිඤ්ඤ යුසේයි; **කුමාරවණ්ණං**, කුමරුසඑන්; [**ඉමාය**] **අභිමෙබලිකාය**, මේ [1]සප්වැල පලඳනෙයින් උපලක්ෂිතවූ—ඉත්ථම්භූතයෙහි කරණ වචන. **උච්ඡඞ්ග**, ඇක; **පටිසංහරිත්වා**, හැරැ; **පරිහරිස්සාමි**, පස්වටනෙම්—සුගතො වාද දූත සිකබාපදපඤ්ඤපන ඈ බුදු කිස කරනෙම් යන අභිප්‍රාය. **පාපකං චිත්තං**, පවු සිත්—බුදුසපුවගි ලොබ සිත් එවි, බුදුන් කෙරෙහි අගා සිත් එවි—මෙ දෙජ් නීවරණාවසථා බැවින් 'සහ චිත්තුපපාදෙන ඉඞ්ඪිතො පරිහායිත්වා' යුහු. **සරාජිකාය පරිසාය**, සහරජ පිරිසැ; [**ජිණ්ණො**], ජුණුයේ; **වුඩ්ඪො**, වියැ අතට ගියේ; **මහල්ලකො**, වියෙන් මහත්; **අපෙසායුකෙකා**, උසා නැතියේ; **නියාදෙථ**, පිළිපය; **බෙලාසික වාදෙන**, කෙළ ගලනු පස් වටනු මිස බික්සඟහු පස් වටනුවට නෝ නිස් සෙහිද යන වාදනෙන්. 'බෙළං අසති බාදතීති බෙළාසිකො, බෙළාසිකො ති වදන්ති පවත්තො වාදො බෙළාසිකවාදො—තෙන'. **අපසාදෙත්වා**, ගරහා; **පබ්බාජනීය කම්මං**, [2]දෙව්දත්හු මසස් නෙහි පුවස මහණ යි පුවසන කම්. **ඨානං ඛො පනෙතං විජ්ජති**, මෙ කරුණු ඇති; [**යං**]; යම් කරුණකින්—කරණාර්ථයෙහි උපයොගවජන්. නිපාතයෙක් එවි. **තෙන**, එකරුණෙන්—[3]ළඳ රුවැ මෙ මියනුවට කරුණු ඇති බැවින් යූ සේයි. 'අහං භගවන්තං හන්ත්වා බුඩො භවිස්සාමි' යනු එසේ බුදුනොවිය හැකි බවු තුමන් දන්තුජ් පාපෙචඡතායෙන් අභිභූතව කීහු. 'තස්මිං රජ්ජෙ පතිට්ඨිතෙ' යනුයෙහි තෙරුන් [4]ප්‍රොත්සාහයෙන් ඔහු රජයෙහි පිහිටියජ ආණත්ති [5]විසංකෙතනයෙන් තෙරුන්ට පිරිජි නොවිය යෙත්. තෙරහු "පිතරං හන්ත්වා රාජා හොහි" යෙජුහ. ඡෙ රජවැ පියාණන් මැරියැ. ඉති බැවින් ආණත්ති විසංකෙත විය යෙත්. **පුරිසෙ පයොජෙත්වා**, දූතුවාවන් යොජා; **නිවත්තනසු**, නැවැති කල්හි—තෙරුන් යෙජු මඟ පියා බුදුන් යෙජු මඟින් තුමන් ගෙ ගිය කල්හිය යුසේයි. [6]**සිලං පවිජ්ඣිත්වා**, [7]වතරුමනුයයි මහත් සෙලක් විහිජ; **රුහිරුප්පාදක කම්මං කත්වා**, ලේ සල්වන කම්කොට. තුමන් වුනුවි සෙලින් බිඳී බුදුන් පිපිපය හුණු සෙල්ලෙන් මෙ ලේ තතින් සලායි සේයි. බුදුන් සිරුරු වජ්‍රකාය වන බැවින් [8]සැලි පහර හොතුජ් ලේ [9]බුන් නොවිය යෙත්. වජ්‍රකාය හොත් ජීවකයන් අත සැතින් කුමට කඩ විය යත්? වජ්‍රකායනාම් පරොපක්‍රමයෙන් නොබිඳෙන බැවැ. ජීවකයන් සැත් පහර පරොපක්‍රම නම්

---

1 සපාවැල 2 දෙව්දත්හු මුළු පාඨයම විමසිය යුතුයි 3 ළඳරුවෙම් යනුවට. 4 ප්‍රෙසහයෙන්. 5 විසංකෙතයෙන්. 6 මෙතැන් පටන් 33 වැනි පෙළ 'බැවින්' යනු දක්වා පාඨය එක පොතක පමණක් පැණේ. 7 විමසිය යුතුයි. 8 සැලිපහරතුජ් හොතුජ්, සැලිපහරතුජ්. 9 බූය නොවිඳ.

නොවෙයි. එයින් වජ්‍රකායතාවට හානි නැති සෙත්. එසේ හොත් තෙරුන් සැලි පහර හී ලේ තනින් කුමට [1]සිලිය ඉත්—විදුරු නොබිඳෙතුජු අවුවෙහි තුබුව හුණු [2]තවාහි වන සෙයින් උවකුම් හම්යෙහි [3]නොබිඳෙතුජු අනතශවලක මානුයෙක් වේ. එයින් වජ්‍රකායතාවට හානි නොවෙයි සේයි. **නාළාගිරිං,** [4]සැඩපජොවා පඬුරු දුන් නාළාගිරි ඇත්හු. තුමන් මරවා බුදුන් රැකියවිවැ සිටි බැවින් "අත්තනො ජීවිතං සත්‍ථු පරිච්චජිත්වා' යුහු. තෙරහු නාළාගිරිහු බුදුන් නොමැඩිය හැකි බවු නොදන්නී යත්—දන්තුජු බුදුන් කෙරෙහි පෙමින් එ කිරිය කළහ සෙත්. **අභිහට,** පළවන [ලද]. නුවර සිස් කොටැ ගිය බැවින් "තස්මිං දිවසෙ සන්නිපතිතානං අට්ඨාරස කොටි සඞ්ඛාතානං" යුහු. චෘඩ දුළුල [5]අයින් පෙරෙනුජ් 'අප්පකං ගණනානුපගතං නහොති' යි කීවෙත්. **ආනුපුබ්බිකථං,** කාමාදීනව ඈ අනුපූ කියා; **ධම්මාභිසමයෙ,** සස් පිළිවේ; **චූළහංස** [**මහාහංස**], [6]අසූනවායෙහි සුළු හස්ජා හා මහ හස්ජා; **සකකාමක,** සනවායෙහි සුවන්කකුළු ජා; **දෙවදත්තස්ස කම්මං,** දෙව්දත්හුගේ ක්‍රියා. 'රඤ්ඤො මාරාපිතත්තා නෙව තථා පාකටං අහොසි' යි යොජනු. යම් සෙයින් නළගිරිහු [7]වුහුට් හෙයින් [8]පාළවීද එසෙයින්ම රජහු මැරූ හෙයිනුජු [9]සෙල් පවයින් [10]හෙයිනුජු [8]පාළනොවියැ යුසේයි. **ථාලිපාක,** මුළු බත්; **කොහඤ්ඤෙන,** කොහොන් කැමින්. 'කුහනස්ස කම්මං කොහඤ්ඤං'. **පච්චක්ඛුනි,** "යාවජීවං අරඤ්ඤකා අස්සු" යන ඈ මතුයෙහි කියන පස්වතුන්; **ලූඛප්පසන්නං ජනං,** [11]රුළු බැවුහි පහජනා ජනා; **විඤ්ඤුපෙක්ඛා** [**විඤ්ඤුපෙක්ඛො**], විනව විනවා-කිය කියා යුසේයි. කාය විඤ්ඤත්ති හා වීසි විඤ්ඤත්තීන් තුමා [12]වාසයෙහි අටී බැවු ජන්ව ජන්වා යී සේයි. **සඞ්ඝභෙදාය,** සඟ බිඳුමට; **පරක්කමි,** පියෝ කෙළේ; **චක්කභෙදාය,** සක් බිඳුමට—සඟුන් සසුන් රියෙහි සක්සුරුකු බැවින් කියූහු. **ගරුකො,** බරි—[13]කප්පට්ඨික ජෙලෙන් සගබිහව සිටි බැවින් කියත්. "සඞ්ඝභෙදෙ ති ආදීසු" යන තැන විථර සඟබේ [14]කඳින් දතයුතු. **අජ්ජතග්ගෙ**—'ත' කාර ආගම; **අග්ගෙ** යනු ආධ්‍යර්ථහි නිපා—අජවා [15]පට්ය යි. **අඤ්ඤත්‍රෙව භගවතා,** පින්වත්හු විනාමෙ; **අඤ්ඤත්‍ර භික්ඛුසඞ්ඝෙන,** බික්සඟහු විනා; **උප්පන්න ධම්මසංවෙගො,** උපන් ධම්සංවේ ඇතිවැ—ධම්සංවෙගනම් සව්

---

1 සිලියායත්. 2 තුවාසි, තමාහි 3 නොමිතතුජ්. 4 සඩපජොව. 5 අය සෙත්ම ථෙරත්පි, අප්පගතං ගණනුපගතං හොති. මුළු පාඨයම ආකුලයි 6 අසූනවයෙසි. 7 බුහුට්. 8 පැළ. 9 සෙල්වාවයිත් 10 හොණුජු. 11 රුප බැව්ස්. 12 වායෙසි. 13 කප්පඨිකාජෙලෙ. 14 කණින්. 15 වචුය යි.

[1]ධම්නූ ඔසවන ආරෙන් උපදනා සැණ; **අනඤ්ඤනිස්සිතං,** අඟි තයට වැටෙනුවා; **සුකරානි,** [2]සුවකටැයෝ; **අසාධූනි,** කාදු සිරි ඈ නොසොඳුරු කම්හු; **අත්තනො අහිතානිච,** තුමහට නොසුවයට් වැටෙනුවෝ. 'අසාධූනි' යි කරනාල්හි අමනුසැඳ සේ කියුත. 'අහිතානි' යි එල දෙනාල්හි කැකුළු සේ කීහු. **පරමදුක්කරං,** ඉතා දුකට; **ඉමං උදානං,** මේ උදන් ධම්—සං වෙනෙන් ඉතිරු ගිය තෙපුලැයි සේයි; **උදානෙසි,** [3]පැවැත්වී; **සුකරං,** සුවකට; **සාධුනා,** හුදියක්නු විසින්; **සාධු,** සොඳුරු කම්; **පාපෙන,** ලමුවා විසින්; **අරියෙහි,** [4]උදීන් විසින්; **ධමනති,** රුසියෙන්ද; **සලාකං,** ලාහ. ලද රුස් වනුවන් පමණ දන්නාට හා තරකාරනුවට සලහක විවට කාස කාණ්ණ ජපන විසින් ගන්වන හුණුපතුකඩ ඈ සලාක නම්. **වජ්ජීපුත්තකෙහි නවකෙහි,** [5]වැජිරට වැසි නව මහණුන් විසින්; [**අප්පකතඤ්ඤූහි**], නොදන්නවුන් විසින්—දුහඟ ඵාසුහොත් සමාදන්විය යුතුයැ අඵාසුහොත් සමාදන් නොවිය යුතුයැ යනු [6]සුතන්පෙළෙහි සමය, ත්‍රිකොටිපරිශුඬ මඡමංස කැව වරජ නැති යනු වන පෙළෙහි සමය; මේ දෙසමය නො දන්නා නවා මහණුන් පස්වනට [7]ලහගත් කල්හි යු සේයි. **ආදෙසනා පාටිහාරිය** නම් [8]'එවං තෙ මනො' 'ඉතිපි තෙ මනො' යන ආදි විසින් ඔවුනොවුන් සිත් පැවැති සේ කියන පෙළහර. ඒ දක්වා කරන අනුසසුන් **ආදෙසනා පාටිහාරියානුසාසනී** නම්. **ඉද්ධිපාටිහාරිය** නම් අහස පළක් අවුළුවා හිඳුනා ඈ පෙළහර ඒ දක්වාය් කරන අනුසසුන් **ඉද්ධි පාටිහාරියානු සාසනී** නම්. **කොකාලිකො,** කොවැලි මහණු—දෙව්දත් තෙරුන් බුඩ විෂයෙහි අග්සැවිය සෙන්. **මාවිස්සාසි,** නහම් විස්වැසෙ; **පාපිකානං ඉච්ඡානං,** ලමු [9]ඉසයන්—අසත් සහවුනෙහි ඉස ළමු ඉස නම්. **වසංගතා,** විසී බවට ගියාහු; **උණ්හං ලොහිතං,** "නීතා තෙ භික්ඛූ" යි කොවැලි තෙරුන් කියත් මෙ උපන් සන්තාපයෙන් වූ හුණු ලේයි. [10]'ජණ්ණුකාභිප්පාතෙන' යන් නිදෙස්මෙ. **අත්තනා දුතියොව ගතො,** තුමා දෙවනු කොටැ ගියේයි—තමා [11]පිරි වර පන්සියෙන් එකුකුදු නොගෙන ගිය සේයි; **අජො,** වැඩ; **පටිසන්ථාර වුත්තිනං,** පිළිසඑරින් වැටෙන සුලුවන; **ලක්ඛණං,** එනම් මුවා; **ඤාතිසඞ්ඝ පුරක්ඛතං,** නෑ මලින් පිරි

1 ඝමන්. 2 සුවකාසායෝ, සුවකටායෝ. 3 වත්වී. වැත්මී, වැක්වී. 4 ඉදින් විසින්. 5 වාජුරට. 6 සුත්තන්පෙළෙහි. 7 ලහැ. 8 'එවං තෙ මනො' යන ආදි විසින් 'ඉතිපි තෙ මනො ඔවුනොවුන්. 9 ඉස සෙන්. 10 ජණ්ණුකාභිකා තෙක. 11 පිරිවැරූ.

වරනලදුවා; **කාළං,** එනම් මුවා; **සුවිකිනං,** පියනලදුවා; **ඉදං ජාතකං,** [1]එකානූනවාංසෙහි ලකුණු මුව ජා; **අනුකිරියං,** අනුරූ කිරිය—තුප කිරිය හා එක්වැනි කිරියය සේයි; [2]**මඤ්ජුභාණකං,** මියුරු තෙපුල් ඇතියහු; **මයූරගීවසංකාසං,** පහන් මොණරකර සුදුසුවා; [3]**සවිඨකං,** එනම්හු; **උදකථලචරස්ස,** දියගි ගොඩගි සරනුවා; **තස්සානුකාරං,** ඔහු එක් වැනි කිස කරනුයේ; **සෙවාලෙ,** 'සෙවාලෙන' යු සේයි; **පළිගුණ්ඨිතො,** වළදනා ලදුයේ—හැම පසින් මෙ පිහිකරන ලදුයේ; **ජාතකං,** දුක නිපාතයෙහි [4]වීරක ජා; **තථා රූපිමෙවකථං,** එබඳු මෙ තෙපුල්—තොප අනුකිරිය කෙළේය යන තෙපුල්; "අචරි—පෙ—". **පච්ඡිමෙකාලෙ,** පැසුම් කල්හි—මරණ ආසන්න කල්හි. 'අත්තනො සාවකො' යන තැන 'ආහ' යනු වැඩියේයි. "කොසග්ග මයෙනාපි ආකාතො නත්ථි" යනු ලොක බැවහාරයෙන් කියූය. අරුඬම්නට ප්‍රමාණයක් ඇත්තෙන් නොකීයු. ලෙඹුහි සැවින් සැව නැති සෙයි කියපි කෙනෙක් 'කොසග්ග මතෙනාපි නත්ථි' යෙත්. බුදුනට කැරුණු වධයක් නැත හොතුජු තුමන් වධයට පියෝ කළ තැන් ගෙනැ "වධකො දෙවදත්තමහි" යුහු. [5]'අඞ්ගුලිමාලකො' යන තැන් පටය් 'මාලිනෙ' යි හඳුරත් මෙ. හුමමඨහි සමපදන වචන කළා වෙත්. **ධනපාලෙ,** නළගිරි ඇත්හු කෙරෙහි; '**සබ්බපථ**' යි ආළවක සුචිලොම ඈ අප්‍රිය කාරීනුජු ගන්නේ. 'දසෙසථ මං එතං' යි බිඳුනේ. **අඝං,** මෙ දස්සනාලාභා; **ධම්මතා,** [6]පියවිහි නියුණු සෙයින් ආනාවි නක්ඛ යාචනකම්හු පියවියයි සේයි; **මඤ්චං ඔතාරෙත්වා,** තොරුන් හොත් හැඳ බහය්; **සාවගොපඵකා,** ගොපු ඇට පවා; **හනුකඨිස්ස,** [7]හනු ඇටහු. "ඉමෙහි අඞ්ගෙහි—පෙ— සරණං ගතොසම්" යන සබඳ. **දෙවාතිදෙවං,** දෙවියනට අධි දෙවියා; **නරදම්මසාරථිං,** පුරිසදම් සැරියා; **සමන්තචක්ඛුං,** සවසැසැහු; **සතපුඤ්ඤ ලක්ඛණං,** සිය පින් ලකුණු. 'සතපුඤ්ඤතො නිබ්බත්තලක්ඛණං යස්ස' යන වාක්‍ය. අනත් අපිරිසේ සක්වළහි හැම සත්හු එකි එකී පින් සත ගුණ කොටැ කොළෙෝ නම් [8]එතෙක් ජන කළ එතෙක් කම් සත ගුණ කොටින් කළ [9]පිනින් නිවත් ලකුණු ඇති බැවින් බුදුහු සතපුඤ්ඤලක්ඛණ නම්හු යැ. **පාණෙහි,** දිවියෙන්—'ආපාණකොටි' යු සේයි. **ඉදං කිර ඨානං,** මෙ කරුණු—'කිර' යනු [10]අනුශ්‍රවාත්ථිහි නිපා. **කම්මජවා භාරියං,** රුහිරුපපාද

1 එකුන්නවාංසෙයේ. 2 මඤ්ජුභාණකං. 3 සවිඨං. 4 වීරකජා. 5 අඞ්ගුලිමාලිනං. 6 පියවිහිහි හුණු සෙයින්, පියවිහිහි හුණු සෙයින්. 7 හනු ඇට. 8 එතෙක් කම් සත ගුණ කොටින්. 9 පින්. 10 අනුසාවත්ථිහි.

පච්චත්ථියාවන ඇසි නොමහණව කටහැකිකම්. සඟබේ කම් වනාහි [1]මහණ නොව නොකටහැකි; **ආසත්තිභවස්ස පච්චයං,** අනාගතයෙහි පසේබුදුවනුවට උපනිස; **ඉතො,** මෙතැපින්; **අඝිස්සරොනාම,** එනම් ඇති. [2]**යාවකණ්ණසඞ්ඛලිකො,** කන්සිළිපවා—කන්සිළින් මතුයෙහි යුසේසි; **යාවගොප්ඵකා,** ගොපුඇටපවා; **මහානාලකඛඛපරිමාණං,** මහනල්කදෙක්හි පරිණාසා පරිණාඇති; **අකානකඤ්ඤුස්ස,** කළවා නොදන්නවු හට; **විවරදස්සිනො,** සිදුරු නහමනුවහට; **නෙව අභිරාධෙසෙ,** [3]නොම අරිය හෙනු; **ඉමං ජාතකං,** එකනිපාතයෙහි මේ සීලව නාග ජා; **ඛන්තිවාදිජාතකං,** දුකනිපාතයෙහි ඛන්ති වාදි ජා; [4]චුල්ලධම්මපාලජාතකං, පස්නවායෙහි සුළුධම්පල් ජා; **ධජ,** යට අගැ බඳ ධජ; **පටාකා,** කිසෙලි—සරස ගැන්වූ පටාක; **චණ්ඩ,** කැකුළු සිත් ඇති බැවින් සැඩහි; **ඵරුසෙ,** වසම් පියොවු ඇති බැවින් පරුස්හි; **හිංසිතො,** නහනුලදු; **පච්චයා,** සොම්නස්; **අකණ්ණනොනෙනා,** පිඟුඇස් ඇතියේ; **පච්චාගමනායෙ,** පුන ආ ගමනින්—'පච්චාගමනතො' යි සේසි; **පිඞ්ගලජාතකං,** දුක නිපාතයෙහි පිඞ්ගලජා; **තපපනෙනා.** පිළිසුසිත් සපියුතු [5]දොම්නස් වෙතෙන් තැවෙනුයේ.

## 12 දෙව්දත් තෙරුන් වත්.

**අනුච්ඡවිකා කිච්චානි,** රුසි අනුරූ කිසගත; **චිත්තානුරූපං,** රුසි අනුරුවින්; **පතිට්ඨිතුං,** සතපනුවට; **වෙය්‍යාවච්චං,** මෙහෙසි. 'දනගෙග ඕතො' යි [6]අරනේසි. **ඛනිළ හාකිස,** [6]සගැ බෑ; **සරීරකිච්චං,** සිරිරට කටයුතු ආළාහන කිස; **දුක්ඛී,** චෙතසික දුකින් දුක්පත්හි; **දුම්මනො,** දුම්නසින් [7]වුටු සිත් ඇතියෙහි; **අස්සුමුඛො,** කඳුළු මොස මොණ ඇති යෙහි. 'අස්සු මුඛෙ යස්ස' යන වාකා.

## 13 සුමනා දෙවියා වත්.

**උරං දත්වා,** ළදී; ධුරං, ප්‍රධන් කිස; **විපස්සනා ධුරං ගන්ථ ධුරං,** විවසුන් ධුර හා ගන්ධුර; **යාව අරහත්තා,** රහත්ඵල පවා; **ඝටෙන්තො,** තැත්කරන්නේසි; **වායමන්තො,** [8]සම වයම්හි යෙජනුයේ; **සහපටිසම්භිදාහි,** [9]පිළිසැඹියා හා සමඟ—[10]අත්

1 මහණ නොවළඳ කටහැකි. 2 "යාවකණ්ණ සඞ්ඛලිකො" ගැනහට පෙරවුව 'අනුනු පිළිසුසැවුම් නැති තථාවං කරෙසි' යන්නක් හැම පොත්වලම පැනෙන නමුත් එය ආගන්තුක පාඨයක්සේ සැලකීමු. 3 නොම අරිය යහනු. 4 චුල්ල ධම්මපාලජාතකං. 5 සොම්නස්. 6 සගබෑ, සගබ. 7 වුච්. 8 සම්යම්හි. 9 පිළිසිඹියා. 10 අඛම් නිරූ පිළිහන්.

ධම් නිරුත් පිළිසඹින්—මෙ සතර තැන ප්‍රභෙදයට ගිය ඤාණ ගය් සමඟයැයි සේයි. **සරභඤ්ඤං**, උදාත්ත ස්වරයෙන් යොජා කරන [1]අජ්ඣායන සරභඤ්ඤ නම යෙත්. පදභාණ පෙදෙහි පෙදෙහිම නැවැති ස්වර ඇතියේයි. සරභඤ්ඤ ගීත ස්වරයට නොගොස් අනුකරණව පැවැති [2]ස්වර ඇ [3]විශෙෂ [4]ඇතියේයි. **අට්ඨාරසන්නං මහාගණානං**, සූත්‍රාන්තික ගණ [5]වෙනයික ගණ ඇ අටළොස් මහණ ගණයන්ට; **ථොකං කාලං**, සුලාක්කල්; **සණ්ඨිතුං අසක්කොන්තො**, වියත්මි යන මතින් නොසිඟිය හෙනුමයේ; **සමපමාණං ආසනං**, මහලු හොතුජ් පැන පිළිවිසැට් බැවින් සම පමණ අස්නක් ගත්හු; **ගන්ථික භික්ඛුං**, ගත ජන්න මහණු; **රූපාරූපෙ**, රූවාරූධම්හි; **ඉතරො**, ගත් [6]ජන්න මහණ—පාවිජ්ජකයා කොරෙන් අන් බැවින් 'ඉතරො' යි කීවෙත්. 'සො සබ්බං කථෙසි' යත් මැනැවි. **උජ්ඣායිංසු**, අවඤ්ඤයෙන් [7]නැරඹුහු; **සබ්බ පරියත්තිධරස්ස**, හැම [8]පෙළි ධැරූවහට; **පාමොක්ඛස්ස**, ප්‍රධන්හට; **පසංසාමත්තම්පි**, පැසසිය මතුවක්. 'මත්ත' ශබ්දයෙන් සාධුකාර දුන වැළකුහ. **භතියා ගාවො රක්ඛණ[ක]සදිසො**, [9]පෙළ ධම් කියා තොප කොරෙන් වත් පිළිවෙත් මතුවක් ලබන බැවින් බැළයට ගෙරි රක් නාක්හු වැනි; **පඤ්චගොරසෙ**, කිර දධි තක්ක නවනීත සප්පි යන පස්ගෝරසයන්; **පරිභුඤ්ජනක සදිසො**, උතුරු මිනිස් ධම් සුව වළජන බැවින් ගෝරස වළඳනුවා වැනි; [10]**සහිතං** යනු මෙ බුදුවජන්. [11]සඞ්ගතාර්ථ වන බැවින් සහිත නම්. **පක්ඛපහරණමත්තම්පි**, පියා පහරන මාත්‍ර කල්හිජ්; **පච්චජ්ජිත්වා**, පිණිස ගෙනැ; **දිවසභතිමත්තං**, දවස් බැළ මතුවක්; **වත්තපටිවත්තං**, වත් පිළිවෙත්—පළමු කරනු වත් නම්, පුන පුන කරනු පිළිවෙත් නම්; **භාගීහොති**, කොටැසි වෙයි—හිමිවෙයි සේයි; **සාමඤ්ඤස්ස**, [12]මඟඵල; **නිය්‍යාදිතානං**, පිළිවායන ලදුවන්ගේ; **යථානුසිට්ඨං**, අනුසසුන් අනුරිවින්; **ගොරසස්සෙව**—'ඉව' යනු සාදෘශ්‍යාර්ථි. 'යථා ගොසාමිකා ගොරසස්ස භාගිනො එවං සාමඤ්ඤස්ස භාගිනො' යි යොජනු. **සීලසම්පන්නස්ස**, පිරිහුන් සිල් ඇතියහු—'සම්පන්නසීලස්ස' යි සේයි. **බහුස්සුතස්ස**, ආගම බහුසුවා; **පමාදවිහාරිනො** යනුයෙහි අර්ථය 'අනිච්චාදි වසෙන' යන ඇයි. 'න දුස්සීලස්ස වසෙන කථෙසි' යි යොජනු. **ථොකං**, සුලාක්. 'එකවණ්ණ

---

1 අජ්ඣාධ්‍යායන. 2 ස්වර ඇති. 3 ශෙෂ. 4 ඇතියෙන්, ඇතියෙත්. 5 වෙනසික. 6 ජනන. 7 කැත්මබුහු. 8 පිළි. 9 පෙළුයම්. 10 එතං සහිතං, 11 සඟනාව, සහනාක. 12 මඟලඵල,

**විවෙකමත්තං** යනු ධම්මපද අභිකාරයෙන් කියත්. එකපුත්ත විපුත්තමත්තං' යන ඈසිජු කියනු. 'පුබ්බභාග පටිපදාසඞ්ඛාතං' 'චරණතො' යන සබඳ—පූහා පිළිවුවා පාති 'චතුපාරිසුද්ධි' යන ඈසින්. **අනුධම්මචාරී,** ලොවුතුරා ධමට අනුරූ ධම් සරනුයේ. [1]**අජ්ජ අජෙජවාතී**—'එව' යනු [2]පළමු පෙජෙතිජ් යොජනු. 'ඉති' ශබ්දයෙන් පෙරවැ 'අධිගම්ස්සාමි' යන්නක් අදනේයි. **පටිවෙධං,** සස් පිළිවෙයි; **සම්මා** යනුයෙහි අර්ථ 'හෙතුනා නයෙන' යනු; **පරිජානිතබ්බ ධම්ම** යි දුක්සස් කීහු. මෙය හා එකලක්ඛණ වන බැවින් සච්ඡිකාතබ්බ නිවන්හාය් භාවෙතබ්බ මඟජ් කීවෙත්. **එකලක්ඛණ** හොතුජු “රාගංච දෙසංච පහාය මොහං” යනුයෙන් කී බැවින් [3]පහාතබ්බ [4]සුමුදු නොකීවෙත්. **පරිජානනෙනා,** පිරිසිඳ ජන්නේ. මෙයින් මෙ 'සච්ඡිකරොතොනා' යනු ගන්නේ. **තදඞ්ගවික්ඛම්භන සමුච්ඡෙද පටිප්පස්සද්ධි නිස්සරණ විමුත්තීනං වසෙන,** තදඟ විඛම්බුන් සුමුසෙයි පිළිපසද නිසරුණු [5]විමුත්තීන් විසින්. [6]පූහා පිළිවුවායෙහි තදඟ විඛුඹුන් මඟැ [7]සුමුසේ ඵලෙහි [8]පිළිපසද් මඟ ඵල දෙතැනැ [9]නිසරුණු විමුත්ති ලැබෙයි. **ඉධ හුරං** [10]යනු දෙජ් අධිකරණාර්ථි නිපායැ යන පක්ෂය ගෙනැ 'ඉධලොක පරලොක පරියාපන්නා' යුහු; පච්චත්තහි නිපාතැ යන පක්ෂයෙහි සිටැ “අජ්ඣත්තික බාහිරාවා” යුහු. **චතුහි උපාදානෙහි,** කාම දිඨි සීලබ්බත අත්තවාද යන සතර උපාදන්නෙන්; **මග්ග සඞ්ඛාත සාමඤ්ඤස්ස,** [11]මඟ නම් ඇති මහණ කම්හු. 'සමණස්ස කම්මං සාමඤ්ඤං'. **ඵල සාමඤ්ඤස්ස,** ඵල නම් ඇති මහණ බැවුහ. 'සමණස්ස භාවො සාමඤ්ඤං'. **පඤ්ච අසෙඛධම්මක්ඛන්ධස්ස** ච යි 'ච' යන්නක් අරනේ—සීල සමාධි පඤ්ඤා විමුත්ති විමුත්තිඤාණ දස්සන යන පස් අසෙයි ධම් කඳහුද්; **රතනකූටෙන විය අගාරස්ස,** රුවන් කැණි මඬලෙකින් ගෙකොක කැණිමඬුල් ගන්නක්හු සෙයින්; **අරහත්තෙන,** රහත් ඵලෙන්; **දෙසනාකූටං ගණ්හි,** දෙස්නෙහි මුඳුන් ගති—දෙසුන් නිමවියයි සේසි.

## 14 දෙසහා තෙරුන් වත්.

---

### යමකවග අටුවා සන්‍ය නිමි

---

**කොසම්බියං,** [12]කොසඹැ නුවර; **ඝොසිතාරාමෙ,** ගොසු සිටුහු කළ ඇරැම්හි; **සාමාවතී පමුඛානං,** සාමවතිය ප්‍රධාන

---

1 අජ්ජ අජ්ජවාති. 2 පළමු පළමු පෙජෙතිජ්. 3 පහායතබ්බ. 4 මුසු, සුමුනු. 5 විමුතින්. 6 සුහාපිළිපුවායෙහි. 7 මුසුසේ. 8 පිළිපසව, පිළිපසවි. 9 නිසිරින්, නිසුරන්. 10 කියනුදෙජ්, යනුජ්. 11 මගදුරු, මගදුරු, මගදුහරු. 12 කොසබැ.

කොට ඇති; **එතිස්සා,** මාගන්දියා; **මරණබ්‍යසනං,** මරණ දුක්—'බ්‍යස්සති විපත්ති සුඛන්ති බ්‍යසනං.' නොහොත් මරණ විනැස්—'විච්ඡින්දිත්වා අසනං ඛිපනං බ්‍යසනං'. **ආනුපුබ්බිකථා,** අනුපූර්‍වයෙන් පැවැති කථා; **අල්ලකප්පෙ,** අල්ලකප්ප නම් රට; [1]වෙඨදීපකෙ, වෙඨදීපක නම් රට; **ජත්තං උස්සාපෙත්වා,** අභිසේසත් ලබා; [2]ජීයමානං, ජීරනුවා; **අනන්තමසො,** සටකින්—පියයුතු තාවත් පියූ [3]එසඳ අනන්ත නම්. එකල්හි පියයුතුවන් අනන්තයෙහි යූ බැවින් [4]අනන්තම නම්. **පුත්තදාරස්ස,** දරුවන් හා [5]ජාඅත්බඳම—'පුත්තාච දාරාච පුත්තදාරා, තස්ස'. **මන්තයිංසු,** [ස] සැදියෝ. 'න ජීවිතුං අසක්කොන්තා' යනු හා 'පබ්බජිතා' යනු යොජනු. **අඩ්ඪමාසං,** අඩ අඩ මසින්; **ගණසඞ්ගණිකා,** [6]ගණ සැඟැණි—'ගණස්ස සඞ්ගණිකා—සංසග්ගො—ගණෙන සඞ්ගණිකා ගණසඞ්ගණිකා'. **ජාලෙය්‍යාසි,** ජලවන්නෙහි; **මහෙසක්ඛො,** මහත් අන්බැවු ඇති—'මහානුභාවො' යි සේයි. **කාලකතො,** කාලක්‍රියාකොළේයි; **ඉතරො,** අල්ලකප්පක තවුස්; **කම්මං උපධාරෙන්තො,** තමා ලද සැපතට හේ කම් බලනුයේ; **නෙක්ඛම්මතො පට්ඨාය,** නෙබැම්හි පටාය්—තවුස් පැවැජ්ජයෙහි පටායිසේයි; **තපචරියං,** [7]තවසිරිම්—[8]වත බුදුනුපාහි [9]වෙදෙකතවිධින් තවුසන් රක්නා සිල් ඈ තපචරියනම්. **මග්ගිකපුරිසොවිය,** මගි පිරිමිනියක්නු සෙයින්; **හත්ථිකන්තවීණං චෙව,** හැත්කත් වෙණජු; **හත්ථිකන්තමන්තංච,** හැත්කත් මතුරැජ්. හැත්නම නොකල් තත්හය් මතුරැජ් ඇතහොතුජ් කල් තතක් හා මතුරක් ඇති බැවින් එයින් නම්දිට් මුළුලු වෙණහය් මතුරැ 'හත්ථිකන්තවීණං' 'හත්ථිකන්ත [මන්තං]' [10]නම් වීල. **යූථපති,** හැත්මුළුපරිණා; **පිට්ඨිං උපනෙන්තො,** ලැහෙනුවට [11]පිටු එළුවනුයේ. 'උපනාමෙන්තො' යෙත්. මෙ එමෙ අජීයි—යමෙක් [12]හැතුන් පලවනුයේ එව්. **බාලාතපං,** නව නැගි හිරු—නොතද අවු. **ආකාසතලෙ,** අහස්තෙලෙහි—[13]සඳලු මඬුයෙහිය යුසේයි; **රාජමුද්දිකං,** රජහු පැලැඳිය යුතු මුදු—[14]රාජලඤ්ඡනය යෙත්. **හත්ථිලිඞ්ගසකුණො,** ඇත් ගිජුලිහිණියෙක්; **පක්ඛෙ විස්සජ්ජෙත්වා** යනු වට පහළ පියා විහිජ්; **ගරුගබ්භතාය,** බර ගබ ඇති බැවින්; [15]**හිරුක ජාතිකතාය,** හිරි පියව් බැවින්; **අජ්ඣප්පත්තො,** වතුලේයි. 'අධිච්චප්පත්තො අජ්ඣප්පත්තො'—[16]අසමභාවයට

1 වෙඨදීපකෙ, මු. ඩ. අ. 2 දීයමානං 3 එසක්. 4 අනන්තම. 5 ජාඅත්බනට, ජාඅක්බවට. 6 ගණසගණි. 7 තවසරිම්. 8 වතබුදුසි පාහි, වතබුදුන් හිපාහි. 9 වදෙකත විදින් තව්සරක්ත සිල්. 10 නම් විල්. 11 පිටි. 12 ඇතුන්. 13 සංඳලු. 14 රාජලඤ්ඡනය 15 හිරුජාතිකතාය. 16 අසභාවයට.

[1]පළමුවැ හුණුයයි සේයි. **උබ්බෙජනියො,** බියකරනුයේ; **ඡඩ්ඩසන්ති,** පියන්නේයි; **සද්දං කත්වා,** හඬයි. [2]වෙලෙපැළැයැ පතුල බැවින් 'මණ්ඩපාකාරෙන' යුහු. **මිගරූපානි,** මස් රුවින්—මිග ශබ්ද උපලක්ෂණ. [3]**විටපන්තරෙ,** වෙලෙප් අතුරෙහි; **පාණිසද්දං,** අත්තල හඬ; **සුරියත්ථඞ්ගමන කාලෙ,** හිරු ඒප්සෙන කල්හි; **කම්මජවාතා,** කැමැජිවාහු—කම්නු[4]බුනුයි [5]සිරුරුහි රුජුක්ත බැවින් කම්මපච්චය උතුජ වාතයට 'කම්මජවාත' යි කීවෙත්. **චලිංසු,** සුලූහු—ගබ පෙරළමින් උපන්හයි සේයි. **සුඛෙධිතාය,** සුවෙන් වටන ලැදියට; 'එධ වෘද්ධෞ'. **දුක්ඛ පරෙතාය,** කායික වෙතසික දුක් විසින් මඬනලැදියට; [6]**විහඤ්ඤමානාය රත්තියා,** රැ අලුවනාල්හි; **ගබ්භවුට්ඨානං,** ගබ වුටුහන්—ගබනු බුහිවියයි සේයි. **මෙඝ උතුං,** වෙලෙහි උයු; **පබ්බත උතුං,** පව්යෙහි උයු: **අරුණ උතුං,** [7]නව ළහිරු රස්හි උයු; **උදෙනො,** 'උතුං ආනෙසි අග්ගහෙසීති උදෙනො'. **කොට්ටෙත්වා,** මස්මුසු ඇට කොටාලා; මානුසිමහි, [8]මිනිසක්මි—'මානුසි අමනි'. **ජාතිසම්භෙදතො,** [9]දැ බිඳුමෙන්—නොසමජසිහය් බුවිමෙන් එවි. **ඛන්තිය මායං,**

"යෙන කෙනචි වණ්ණෙන මුදුනා දාරුණෙනවා
උද්ධරෙ දීනමත්තානං පච්ඡා ධම්මං සමාචරෙ".

යන කැත්න මායා. **මාචුසි,** [10]නහම් පහර. 'මාවුසි' යනු හා පයසීාය. **සීලභෙදං,** තුමා රක්නා නොවෙහි [11]කැළල; **පවිජ්ජගි,** පිළිජැගි—[12]පුටුයි සේයි. **මධුං ආහරිත්වා** 'අදැයි' යනු සබඳ. **සසං ජාත සාලිං,** [13]නොවපුළෙයි වූ හැල්; **විස්සාසමත්තකං,** විස්වස් මතුවක්—සිතින් [14]අස්වැසෙන මතුවක් යි සේයි; [15]**දුණ්ණිවත්ථා,** වසඩක් නොවසා හැන්දී; **දුප්පාරුතා,** වසඩක් නොවසා පෙරැවී; **නක්ඛත්ත යොගං,** නකත්යෝ—නකත් හා ග්‍රහයන් යුත්යේ; **නක්ඛත්ත පීළනං,** නකත් ග්‍රහයන් විසින් පෙළිම්; [16]**මහාජානියො,** මහත් ජානියෙක්—මහත් පිරිහිණෙකැයි සේයි; **රජ්ජ ලභන කාරණං,** රජ ලබන කරුණෙක්; **වටරුක්ඛමූලෙ,** [17]නුහරුක්මුල; **නිසීදන්ති,** සැතපෙත්; **එතෙනාව,** මෙයින් මෙ—මෙ ගම නින්ම යයි සේයි. පරන්තප රජනු පිත යුව මෙයට කිසෙයින්

---

1 පළමුව වැහුණු. 2 වෙලපැලැයි, වෙලෙපැලැයැ 3 විටසි අතාරෙ. 4 බුයි, බුස්. 5 සිරිරසි 6 විහඤ්ඤ මානාය. 7 නාබල්හිරු, නවලාහිරුස්. 8 මිනිස් කුම්. 9 දැම්දුමෙන්, දැම්නුමෙන්. 10 මිහම් පහරා. 11 කැලල. 12 පිටුයි, පිටයි. 13 නොවපාලෙවූ. 14 අස්වෙසෙන, අස්වැසෙන. 15 දුනානිවත්ථාව, සඩක් නොවසා හැන්දී; දුප්පාරුතාව, සඩක් නොවසා පෙරෙවි. 16 මහාජානියො, මහාජානියො. 18 නුග.

ආමිස යනුවහට කියයි හඤ්ඤි **ලිඞ්ගසකුණො ආනෙසි[සි],** ඇත් ගිජුලිහිණියක් මා [1]අල—එයින් මෙහි වුම්හයි සේයි. **ඉති වත්වා,** මෙ පවත් කියා; **ඛණෙණ මගනයි,** කන්මුල බිණී—පිතුසන්තිකං **පෙතනිකං; සනිපතනතූති හත්‍ථිරවං රවි—**ඉති ශබ්ද නිදශීනාත්‍ථයි—මේ අරුත් දිවන ඇත්හඬ හැඬියැයි සේයි. 'හත්‍ථිරවෙන' යනු මැනැවි. කරණාත්‍ථිහි උපයොග වචන එවි. **යොධහත්‍ථි සහස්සානි,** යෝ ඇත් දහසින්—යුජන සමිපී ඇත් දහසිනැයි සේයි. **පවෙණිරජ්ජං,** පුතන පරම්පරාය වලඤ්ජනක රජ්ජං; **අභිසිඤ්චිංසු,** බිසෙසියෝ; **අජ්ජිතරඤ්ඤෙ,** අදිලල නම් යෙත් මේ; **දුබ්භික්ඛෙ,** දුබික්ෂිසායෙහි; [2]**කොතුහලකො නාම,** කොතුහල නම්; **කාපිං නාම,** කාපි නම්; **පාථෙය්‍යං,** [3]මග හිමන; **අහිවාතක රොගෙන,** අහිවාතක නම් රොවින්. එරෝ යම් ගෙයකට වන එගෙන් දෙර බැදැ බිත් පළා [4]නික්මෙත් මෙ දිවි ලැබෙයි යෙත්. අහිවාතක රොග නම් විෂ වාත හමුළු සැදැ වන රොවෙක් යෙත් මෙ. **ඛුද්දා,** සාදිකින්; **වඤ්චිතුං,** වහනුවහම—ළසුලනුවහටයි සේයි; **පජාපතිං,** භරියං; **ජීවනනමෙව,** ජෙනුවාමෙ; **ජාතකකොපි බලවතරා,** සාදිකිහුජු ඉතිරි; **වාරෙන පරිවත්තියමානො,** වරින්වරින් [5]පෙරළෙන ලබනුයේයි; **ගච්ඡස්ස,** කුඩා [6]රුකක්හු; **පණ්ණසන්‍ථරෙ,** පත් අතුරෙහි; **තස්ස නිස්සන්දෙන,** ඒ කම්හු හෙයින්—පෙලෙන් යුසේයි; **භවන්තරෙ,** භව අතුරෙහි—ඒ අහවෙහි [7]සිටැ තුන්වන භව සඳහාය් කියත්. **න අවමඤ්ඤිතබ්බං,** නො අවමැතිය යුතු—[8]මෙනොක් කුම කටහෙහුයයි නොහැඟිය යුතු. [9]**ගොකුලං,** ගොයූථයක්—ගෙරිමුළක්. **ධෙනු මඞ්ගලං,** නව [10]වැදදෙනක මඟුල්; **පටියත්තො,** පිළියෙළ කරනලද්—සජනලදුයැයි සේයි; **මුදුජාතික කුලපුත්තො,** මොළොක් පියවිඇති කුලදරු; **පහුතෙන සප්පිනා,** නොමද ගිතෙල්හය් සැමැඟ; **ඌනොදරොසි,** අඩු කුස් ඇතියෙහි; **යාවදත්‍ථං,** කැමැති පමණ. 'යතනකොන අපෙළා තනනකං'. **තාදක්ඛිමුඛකොණ්ඩවකත්වා,** ඔහු අභිමුඛ කොටැ—ඔහු දසට නතුකොටැයි සේයි. **අතනනා,** නොමෝ; **මන්දසප්පිනා,** මඳ ගිතෙල් ඇති. 'පායාසං මන්දසප්පිං' යන වාක්‍ය. **ජාතතාය,** [11]සා බැවින්; **ධඤ්ඤවන්ත,** පිනැත්තී [12]ලව්; **හත්‍ථිං,** බැළ; **දුස්සස වො පාපුණාතු,** තුපට දූන් දනැ පෙලෙ තුප දස්හට පැමිණේවා. 'පාපුණාතු' යුව පැමිණේද යත්—[13]පරනු එකම් අනුමෙවිය

1 අත, අඑ. 2 කොතූහලිකො-මු. ඛ. අ. 3 මඟඳීම. 4 නික්මනෙමේ, නික්ෙතනක්මෙ. 5 පෙළෙන. 6 රුකක්. 7 සිටිය. 8 මේ පාඨය විමසිඟයුතුයි. 9 ගොපාලකුලං-මු. ඛ. අ. 10 බැඳ. 11 සැබැවින් 12 ලව. 13 පරම්පු.

හොත් පැමිණේ යේත්. නොඅනුමෙව්ය [1]වද [2]වෙ නොඝත්—දුවගට සුව සැපත් අරන බැවින් [1]වද නොවෙ යේත්. **මෙ වාරෙ,** දෙයලක්—රැසිම්මැ හා සවසැ; **උපට්ඨානං,** ළවැමන්; **වාලමිගට්ඨානෙ,** වගතරස් ඈ වලමුවන් සිටුන තන්හි; **සූසූතිසද්දං,** සුසූ යන හඬ—වළ මුවන් පලනුවම ඔහු කරන හඬ දක්වන අනුකරණ. **ඔකාසො,** [3]අවසර; **තෙන සඤ්ඤාණෙන,** ඒ සලකුණෙන්; **පක්ඛන්දිත්වා,** පැක්සැ—ගොසින් යුසේයි. [4]'සකන්දිගතිශොෂණයොඃ' යන ධායි. **ගච්ඡපොථන භූමිපොථනට්ඨානෙ,** ගස් හා බිම් පොසන තැන්හි—පහරන තැන්හියැයි සේයි. **තික්ඛත්තුං භුස්සිත්වා,** තුන් යලක් බුරා; **සරීරපවිජ්ඣනං,** මුඛබොවන ඇයි සිරුරු පිළිජග්; **තිරියං ඨත්වා,** මග අවරය් සරස සිටැ; **අපනුදිත්වා,** පහකොට; **නිවාසනකණ්ණං,** හන් සිවුරු කන; [විවරං] ජීරි, සිවුරු ජිරිණී; **ඵාසුකට්ඨානං,** සුව තැනකට—ගෙත් නම්හි සහායවනුවක්හු ඇති තැනටය යනු අභිප්‍රායි. **ගන්ධමාදනාභිමුඛො,** පසේබුදුන් වසන ගඳමහන් පව් අභිමුඛවැ; [5]**භුං කරිත්වා,** බුරය්; **උජුජාතිකා,** උජු පියවි ඇතියනු; **ගහනං හෙතං භගෙනන**—හගෙනන, හකි; **ඵතං ගහනං,** හේ මුවන—දුප්පවෙසය යුසේයි; **සද්දං,** හේ කාවරු; **මනුස්සා,** මිනිස් [6]ජැය නිවත් සත්හු. මිනිසුන් සිත් විරුජ් පියොවු ඇති බැවින් කියත්. **උත්තානකං,** තුරි—නොමුවහ. **පසවො,** පසුනු. [7]සියුපා ජැය්හු සිත් [8]අඳුරුකිරිය ඇති බැවින් කියත්. **උජුදිට්ඨිතාය,** ඉදිසිත් ඇති බැවින්; **අකුටිලතාය,** නොහැජ් සිත් ඇති බැවින්. ජේජ් පසේ බුදුන් කෙරෙහි ඉදිව පැවැති සිත් මෙ. **ආයුක්ඛයෙන,** විවාදුන් කම්හු ඵල දෙන ශකති [9]නොහුණජ් උපන් හෙවෙයි ආ හිමෙන්; **පුඤ්ඤක්ඛයෙන,** ආ ඇත ජකම්හු ශකති හිමෙන්; **ආහාරක්ඛයෙන,** කල් හැඳින වැළඳිය යුතු අහර නොවැළඳීමෙන්; **කොපෙන,** පරා සැපත්හි තදව උපන් රොෂයෙන්. සුතන්හි කියූ ආයුක්ඛය කම්මක්ඛය උභයක්ඛය මරණහය් උපක්‍රම මරණ මෙහි කුමට නොකීහ, සුතන්හි නොආ ආහාරක්ඛය මරණ [10]කුමට කීහ යත්—උභයක්ඛය මරණ ආයුක්ඛය පුඤ්ඤක්ඛය මරණහිමෙ ගැනෙන බැවින් නොකීහ. උපක්‍රම මරණ ආහාරක්ඛය [11]කොවා දෙමරණින් ගත් බැවින් නොකීහු. එසේ හොත් 'ආයුක්ඛයෙන පුඤ්ඤක්ඛයෙන උපක්කමෙනාති තීනි

1 වන. 2 නොවෙතො යේත්. 3 අවස. 4 සකන්ගීති සොෂණයො. 5 භුංකරිත්වා. 6 ජය. 7 සියුං පුජසිදු. 8 අදුරුකිරිය. 9 නොගුණජ්, 10 කුම කට. 11 කොප,

කාරණෙනා'ති [1]කියයුතුවෙ නො යත්—'උපක්කමෙන' යුව දෙවි යනට සෙසු උපක්‍රමයෙකුදු මරණ වෙයි යනු පැමිණෙන බැවින් එම හැර [2]සම්භවවන උපක්‍රම් මතු දක්වියපිවැ 'ආහාරක්ඛයෙන කොපෙන' යුහු. එසේහොත් දෙවියනට උපක්‍රම මරණ නැති යනු කුමට කියති යත්—අහර සඳ වැරජවීම් හා පරාසැපත්හි ඉසා [3]උපක්‍රම බැවෙකින් අප්‍රසිද්ධ වන බැවින් කියත්. **බහුං පුඤ්ඤං කම්මං,** බහු විපාක වන බැවින් එවි බහු ශක්ති වන බැවින් එක පිනෙකුදු 'බහුපුඤ්ඤකම්ම' යි සේයි. මෙයින් 'යාවතායුකං ඨත්වා' යනුවට [4]හෙතු දක්වූ වෙත්. **උපරූපරි නිබ්බත්තන්ති** යනු එක් සෙනක් මතු නොනිපැජන බැවින් එක්වැ නිපන් සෙසු [5]අවර අවිරී සෙයින් වෙන් කීවෙත්. නොහොත් **බහුං පුඤ්ඤං කම්මං කතං හොති,** දන් ඈ පින්කිරියෙහි එක්කමෙ නොඑක් දහස් සෙනෙක් [6]නිපජ්ජන බැවින් චෙතනා බහුත්ව විසින් එවි එක් සනක්හු [7]නොඑක් පින්කිරිය කරන බැවින් [8]පින්කිරිය බහුත්ව විසින් එවි කීහු. එසේ කියත් අනන්මත [9]උවඑඹ වුවද පින් බහු ශක්ති වන බැවින් 'යාවතායුකං ඨත්වා උපරූපරි [10]නිබ්බත්තන්ති' යන දෙමජ් හෙ දක්වූ වෙත්. **පණීතං පුඤ්ඤං,** [11]කීවා විපරි විසින් පුරුතු පින්. මහත් කොටාරක් දක්වියටිවැ **රාජකොට්ඨාගාරෙ** යුහු. ආ බොහෝ හෙවෙහි පිළිසැදෑ ජුතු පුරුතු පින් මහත් කොටැ ළු තුන් සතර නැළියක් ධාන්‍ය වැන් නැයි සේයි. **අනන්තරාව,** අනන්තරාලෙහි මෙ—ආයි එසඳම [12]නොපැමිණය යුසේයි. **කාමගුණෙ,** නච්චගීත ඈයි [13]කම්ගුණ; [14]**සතිසම්මොසෙන,** [15]අපර සඳහි සිහි නොකිරීමෙන්; **චවිත්වාච** යනු අතුරෙහි අතික් 'චවි' යන්නක් අරනේයි. **නගරසොභිනියා,** [16]ගිණිකා; **කිං එතං,** [17]මෙ කිමෙක—දූපුත් දෙජනහට සාමාන්‍ය පුංස වන බැවින් නිපුස් එක්වජන් වී. **ජෙ** යනු දූසම ආලපනු. **කතනරසුපෙසු,** මහලු කුල්ලෙක්හි—[18]නමද්නො පිරිහිතක් කියපිවැ [19]'කතනරසුපෙප' යුහු. **තිපිකරණ නක්ඛත්තයොගෙ,** වක් හා කරණ හා නකත්යෝ; **උපධාරෙත්වා,** සොයා; **ගහපතානිං,** ගෙහිමඹුව; **නිවෙසෙත්වා,** වසවා; [20]**භාරෙස්සාමි,** හරවනෙම්—මරවනෙම් යුසේයි; **කතිපාහච්චයෙන,** කීප දවසක් ඇවෑමෙන්; **වජෙතො,**

1 කාශ යුතුවො. 2 සම්භවන. 3 'උපක්‍රම' යන්නෙහි පටන් 'නිබ්බත්ති' යනු දක්වා පාඨය අපට ලැබුණු එක පොතක් පමණක් දක්තා ලැබේ. 4 සිතු. 5 අව, අවත. 6 නිවරජත, නිවජජත 7 නොඑ. 8 පිරියකිරිය. 9 උවඑම බලද, උවඑඹ උවද. 10 නිබ්බත්ති. 11 කීවාට. 12 නොපැමිණම්ය. 13 කම්ගුණෙන්. 14 සතිසම්මොහෙන-මු. ධ. අ. 15 අපරසඳ. 16 ගිණිකා. 17 යක්වෙක. 18 නවජනො. මෙය විමසියයුතුයි. 19 කතනරසුපොසු, කතනරසුපොසු. 20 භාරෙස්සාමි-මු. ධ. අ.

ගොවුදෙන්; **ගොගණජෙට්ඨකො උසභො,** ගෝගණව දෙව උසබ්; **චක්කමග්ගෙ,** සක් යන මගැ; **සාකටික ජෙට්ඨකො,** ගැලිදෙටු; **ධුරං,** ගැල් ධුර; **භාරියං වත කම්මං**—වත යනු විෂාදයි—බැරි [1]ලව් කම්—ඔහු කළ කම් නොහොත් සක් මැඟහි හෙවූකම් නොහොත් සොවල්හු ගැල් සකිනි දරියෙක් මෙළෙස්යි යන [2]කිසැයෙක් වූයේයැයි සේයි. **පහටො,** සක් පහරනා ලදුයේයි; **ගොචරං,** ගොදුරැ බිම; **හෙහෙති සද්දං කරොති,** සිව් තැනින් සලනුවට හෙ හෙ යනා සද කළ කලද; **චොරපපාත පබ්බතං,** සොර [3]පවසිනල් [4]පවුවට නොහොත් සොරුන් හෙළන පවසින් ඇති පවුවට; **පටිහඤ්ඤමානො,** සැපෙනුයේ; **ඛණ්ඩාඛණ්ඩිකො හුත්වා,** කඩකඩවැ නොහොත් කුදු මහත් කඩ ඇතිවැ; **මහා වෙණුගුම්බො,** මහත් හුණු ලැහැබෙක්; **ජිඤ්ජුක ගුම්බො,** කිරිඳු ලැහැබෙක්; **කොජවෙ විය,** [5]කොදෙක්හි මෙන්; **වෙණුබලි,** හුණු කරවුවර; **අකම්මඤ්ඤ කණ්ටකො විය,** ඇසැ හුණු කසළක්සේ; **ආවාපං,** [6]උළු බැජනුවට බදුන්වන් කළ තැන්—සුළාය යෙත්. **ආලිම්පෙස්සසි,** ජල්වනෙහි—'ආලිම්පයිස්සසි' යි සේයි; **අවජාත පුත්තො,** නොසමජැ පිතෙක්; **චාටිසං පක්ඛිපිත්වා** යනු සඟවනු සඳහා කියත්. **සච්චකාර සදිසං,** [7]හැනයරු වැනි—බඩු ගණන බව කැමැතියා බඩුහිමියාහට දෙන අත් පඬුරු වැන්නැයි සේයි. **එකං කම්මං** [8]**ආණත්තං,** එක් කමක් කරනුකොට ඇණැවනු ලදු. 'එකං කම්මං කාතුං' යි සේයි. 'තං තත්ථ ගච්ඡන්තං ආහ' යි යොජනු. [9]**ගුළකීළං,** වට කෙළි; **බහුං ලක්ඛං ජිනිංසු,** බොහො ලක් ජුනුහු—බොහො වට ජුනුහයි සේයි; **පටිජිනිත්වා,** [10]පිළිජැනැ—ඔවුන් ජුනුනාවට වළා ජනය් සේයි. **බහුං ජිනො,** බොහො පරජු යෙම්; **නිබන්ධි,** නිබඳ කියූ—[11]නොකොට නොම්ස්සහහෙයි වෙළෙව යූ සේයි. **අහයි**—අහ යනු විෂාදජ්ජෘති; යි යනු නිපාජ්ජෘති—තුමා පුත්හු මරණැ විෂාදහා මොහු [12]ජු[නු]යෙහි [13]අගරු හඟවා. **සකල සරීරෙ පක්කාසිත ලොහිතො හුත්වා,** සියල් සිරුරැ කකියන ලෙහෙ ඇතිවැ. 'සකල සරීරෙ පක්කාසිතං ලොහිතං යස්ස' යනා වාක්‍ය. බහුම්වචනයට [14]අලුක් කොටැ යූ. **අවත්ථටො,** පැතිරෙන ලදුයේ. '**යථා තං අප්පසන්නස්ස පදුට්ඨ මනො**'—**තං** යනු නිපා. යම් සෙයින් මෙත් ඇතියක්හට දූහැවියෙක් නොමඳ දෙම්නසක් ඉළජසිද

1 ලප. 2 කිසමෙයක්. 3 බවයිත්තල්. 4 පවුමර. 5 කොඳුදෙක්හි, කොඳුදෙක්හි. 6 උජු. 7 හැතදරු, හැතදරු. 8 ආණතො. 9 ගුළිකීළං, ගුළං-මූ. ධ. අ. 10 පිළි ඇද, පිළි ජන. 11 මෙ පාඨය අවිසදයි. 12 ජුනෙහි. 13 අඟරු. 14 අලුක් යූ නොකොට.

ඒසෙයින් මෙ මෙසින් නොමඳ දොම්නස් වැළඳියයි සේයි. ධනතිවාද ධම්මපාල කුමාර ඈ මෙන් [1]අධි මහසත්නට දුහැවැ සපරාගි දොම්නස් වැළඳු කළ කලාබු පරන්තපාදි රජුන් සෙයින් මෙ දුටුධැම්යෙහි නොමඳ දොම්නස් වැළැඳියැ යන අභිප්‍රායි. **දණ්ඩෙන**, දඬින්—කාය දණ්ඩ වචී දණ්ඩ ධන දණ්ඩයෙන්. කාය දණ්ඩ නම් තාඩන ඈ. වචී දණ්ඩ නම් පරිභාෂණ ඈ. ධන දණ්ඩ නම් සර්වස්වහරණ ඈ. **අදණ්ඩෙසු**, දඬුවම නොනිස්සන් කෙරෙහි. 'අදණ්ඩියෙසු' කියයුතුයෙහි 'අදණ්ඩෙසු' යනු වී. **අප්පදුට්ඨෙසු**, නොදූහැවියවුන් කෙරෙහි; **දසන්නමඤ්ඤතරං ඨානං**, යනු විපරිණාම කොටැ 'දසන්නං ඨානානං' යි යොජනු—දසපිළා කරුණින් අතුරෙන් එක්තරා කරුණක්. **ඛිප්පමෙව**, දුටු ධැම්යෙහි මෙ; **වෙදනං ඵරුසං**, පුරිස් වෙයින්—බලි දුක් වෙයින්; **ජානිං**, හානි—ධන හානි මතුයෙහි කියන බැවින් පුඤ්ඤහානි යසොහානි ඈ ගන්නේයි. **සරීරස්සච භෙදනං**, හස්තච්ඡෙද ඈ ශරීරභෙද; **ගරුකං ආබාධං**, බිලි රෝ; **චිත්තක්ඛෙපං**, සිත් විබෙවු—උන්මාද; **උපස්සග්ගං**, [2]ප්‍රවාසය—සර්වස්වහරණ ඈ උවදුරු; **අබ්භක්ඛානංච දාරුණං**, ජාතිකුලඝට්ටන ඈ [3]දරුණු හැවුම්; **පරික්ඛයංච ඤාතීනං**, නෑයන් වනස්; **භොගානංච පභංගුණං**, සැපත් වියෝ; **අග්ගී ඩහති පාවකො**, පාවක නම් ඇති ගිනි [4]දවයි. මෙතෙකින් දුටු ධැම්යෙහි විඳුනා පැළ දක්වා දූන් සම්පරාගි විඳුනා දුක් දක්වති "කායස්ස භෙදා දුප්පඤ්ඤො නිරයං සො උපපජ්ජතී" ති. **එවං සන්තම්පි**, මෙවූ කල්හිද්—අප්පදුට්ඨ සොසුවා කෙරෙහි පැ දොස යෙන් පුත් වියොව වූ කල්හියැයි සේයි; **උජුකං ඔලොකෙතුං**, ඉජිකොටැ බලනුවට—වෙෂ [5]ජිම්හ නොවූ සිතින් බලනුව හටය සේයි; **ආයුත්තකස්ස**, යුත් කැමියා; **කත්තබ්බ යුත්තකං**, කටයුතු සඟරාක්; **දස්සෙන්ත**, දක්නැ; **අක්ඛර සමයං**, අකුරැ පිළිවෙය; **පාතරාසං**, පෙරවරැ කෑ යුතු බත්. 'පාතො අසිතබ්බං පාතරාසං'. **සෙසි ජායං**, සෙසි භායසීවච; **පන්නරස සොළස [6]වස්සාපදෙසිකා**, පසළොස් සොළොස් හැවිරිදියයි කියනුවට තිසි—[7]පසළොස් හැවිරිදියෙහි සිටි යයි සේයි. **අභිරූපා**, වෙසෙස් රූ ඇත්තී; **පාසාදිකා**, දුටු වන් සිත් ප්‍රසාද කරනුවී; [8]**පෙසනකාරිකං දාසිං**, මෙහෙකර දාසක්; **අනාරාපණං**, අවුණට; **පෙසනෙන**, මෙහෙයුයෙන්; **තිට්ඨතු පෙසනං**, මෙහෙයිම් තිබේවයි—ඒ තබා මේ කරා යන අභිප්‍රායි. **පෙමං**, [9]සනා; **අට්ඨි මිඤ්ජං ආහච්ච**, ඇට මුල

---

1 ආදි, අධි. 2 පාමාස. 3 දරුණුවම්. 4 උවයි, වුවයි. 5 ජිම්හ. 6 වස්සුද්දෙසිකා-මු. ධ. අ. 7 සොළොස්. 8 පෙසනකංදසිං. 9 සනු.

පැහැර—පෙම් සිතින් උපන් රූ ඇට මුල පැහැර සිටියෙන් පෙම් මෙ ඇට මුල පැහැර සිටියේ යුහු. **පුබ්බෙව සන්නිවාසෙන,** අයුහෙවෙහි පරිචයෙන්; **පච්චුප්පන්න හිතෙන වා,** වත් මනු හෙවෙහි කළ හියෙන්; **එවං තං ජායතෙ පෙමං**—'තං' යනු නිපා—පෙම් එයින් වටහයි. **උප්පලංව යථොදකෙ**—ගාථා බන්ධන සඳහා ආකාර හ්‍රස්ව කෙළේයි—'උප්පලංවා' යි සේයි. වා යනු ආද්‍යර්ථයි—'උප්පලාදිකං' යි සේයි. යම් සෙයින් දියෙහි මහනෙල් [1]හපිද එසෙයින් අයුහෙවෙහි පරිචය හා වත්මනු හෙවෙහි හියෙන් [පෙම්] වැඩියි සේයි. **අඤ්ඤවිහිතකාය,** අන් අරමුණට ගිය සිත් ඇතිවන බැවින්. මෙයින් නොදක්නට හේ කීහු. **අපස්සන්තානං** යනු අනාදරයෙහි ෂෂ්ඨියි—නොදක මෙය යුසේයි. **නදිං අස්ස,** නොදක්නා ලද්දේවීනම්; **පුරිස ගුත්තියා,** පිරිමිනී රකවලින්; **සංහරිත්වා,** හකුළුවා; **අතිසාරං,** අතීසාර රොච්; **පාද මූලිකං,** [2]පිම්ල්ලකු—මෙහෙකරුවක් හුයයි සේයි. 'ගච්ඡන්තානං අම්හාකං පපඤ්චො භවිස්සති'යි සේයි. **පාදපස්ස,** පාමුල; **උස්සීසකපස්ස,** හිස් දෙර; **උත්තානකො,** උඩුමුවවැ; **ආය කම්මිකං,** අය කැමියා; **උපභොග පරිභොග භණ්ඩානං පරිච්ඡෙදෙ,** උපභොග පරිභොග [3]බඩුන් පිරිසෙයි. උපභොග බඩු නම් භොජන [4]පාත සරාව ඈ. පරිභොග බඩුනම් මඤ්චපීඨ ඈ. 'ගාමාච ඛෙත්තානිච දිපදාච චතුප්පදාච යානානිච වාහනානිච'' යන වාක්‍ය. **දිපදං,** දැසිදසා; **චතුප්පදං,** ගොමහිසාදයො; **යානානි,** රථ සිවිකාදීනි; **වාහනානි,** හස්ති අස්සාදීනි; **අලඞ්කතා වත,** නිසිරි බෝ ලව්; **මණ්ඩිතෙන,** හිසින්; **උරමජ්ඣ,** ළැම්ඩියෙහි; **පෙත්තිකං,** පියා සතු. 'පිතිතො ආගතං පෙත්තිකං'. **පටිස්සුතං,** දෙම් පිළිනකරනලද්. **යථා පුරං,** පෙරෙසේ; **සන්නිසින්නෙන හුත්වා,** සන්හුන් ඉරියවු ඇතිවැ; **ඛීනිමා,** නුවණ ඇතියෙක්—දිරිය ඇතියේ එව්—නනතුරු හම්මන්නට නිසියෙක් යි සේයි. **සබ්බසෙතෙන,** සව්සියෙන්—හස්තිසත අස්ස සත රථසත ඈ ගන්නේ. **ජිසි,** පිරිහෙළි; **නික්කඩ්ඪ,** හැයි; **එත්ථ,** මේ සැපැත්හි; **කිං හොසි,** කිසෙයෙන් නිසවුහු; **අක්ඛකපණාදීනං,** අඳ කවණ ඈනට; **දානබ්‍යාවටො,** දන්හි [5]විය වුළු; **අදිඨ [පුබ්බ] සහායකො,** නුදුටු වීරි [6]සබඳ—'අදිට්ඨපුබ්බො සහායකො' යි සේයි. **වයපදෙසං,** විය [7]ගළුන්; **සොසකසෙසිං පක්ඛන්තා,** ජීවනත්‍රාය තකෙකනතා; **ඉමිනා නීහාරෙන,** මී නියරින්; **විජාතමාතුයාපි,** [8]ලුහුවුනු මවටජ; **විපත්තියා,** විවෙතින්—සැපත් විවෙතිනැයි සේයි; **කති පච්චංසෙ,** කිහිප කොටසක්; **තස්ස වසලී,** සා සැඩල; **පච්චොරස්මිං,** උරමැදැ;

---

1 ගඳ. 2 පමලකු. 3 පඹන්. 4 පාත්‍ර. 5 වියළු. 6 සබඳු. 7 ගලුං 8 ලුහුබුහු.

**සත්තිප්පහාරං විය**, අඬයටි පහරක් සෙයින්; **වණෙ ඛාරො දත්තං පරිසෙකං විය**, වෙණෙහි කරදිය ඉස්මක් සෙයින්; [1]**පුරෙ**, පෙරෙව්; **පරික්ඛිපිත්වා**, වැටින් පිරිබෙවුකොට; **කොලාහලං**, අලොල; **නක්ඛත්තං ඝුට්ඨං**, සැණ ගුහනලද්; **සීහපඤ්ජරෙ**, හී කවුළු දොරැ; **විහෙඨෙත්වා**, පෙළා; **ලඤ්ජං පෙසෙත්වා**, හස්කරවා; **අභිසිඤ්චිත්වා**, [2]බිසෙසැ; **වාසුලදත්තා නාම**, වාසුලදත්තානම්; **චණ්ඩපජ්ජොතස්ස**, සැඩ [3]පජෝවා; **උජ්ජෙනියං**, උදේනී නුවරැ; **අයං නිච්ඡයො**, මේ සනිටුහන්; **දාරුහත්ථිං**, කටැතක්හු; **දාරුමයං**, කටමුවා; **යන්තහත්ථිං**, යතුරැ කැමින් ඇවිජුනා ඇතක්හු—ඇත්වන් කොට [4]තැනූ බැවින් 'කතවිත්තකම්මං' යූනු; **තස්ස විජිතෙ**, උදෙනා විජිත යෙහි—අස්සක රටැයි සේයි **ආසන්නට්ඨානෙ**, කොසඹැ නුව රට අසන් තන්හි නොහොත් [5]සැඩපජෝතහු විජිතයට අසන් තන්හි; **අපරාපරං චඞ්කමන්තං**, එබව එබවට සැක්මෙන්—ඇත්කිරිය දක්වනුවට යෙජූ යතුරැ මඬමින් ඇවිජුති යුසේ යි. 'අපරතො අපරං අපරාපරං'. **තත්ථ තත්ථ ජඬ්ඩෂුං**, කටැතෙක්හෝයි යන සඳ හරනට ඒ ඒ තැන පිහු; **සබ්බසෙතො**, සව්සේ; **කෙලාසකූට පටිභාගො**, කෙලෙස් පව්යෙහි කුළුවක් පිළිරූ. මහ තෙරහු කසයින් සමදිට්හැ සුනත් වියබැන් කෙරෙමින් සැඩපජ්ජෝ [6]උදෙනා ගන්මියි මහනෙල් සිව් කැමැත් දක්වය් [7]ගතැයි තුමට කියූහ පිළියත්—ඒ ඇදුරෙර්ලෙහි [8]ඇජරන් එසේ කියන බැවින් කියූහු. **මග්ගදෙසකං කත්වා**, කී මඟ කියනු කොටැ—මඟ බුමූකො ටැය් සේයි; **චරපුරිසා**, පවත් දන්නාට ඇවිජ්න පිරිමිනීහු; **උභොසු පස්සෙසු බලකායං පයොජෙසි**, දෙපස්හි සෙනඟ පියෙජී—සකටබ්‍යූහයෙන් සිට්විය යෙත්; **හත්ථිං අනුබන්ධි**, කටැත්හු [9]නුහුබද්; **වෙගෙන පලාපෙසුං**, [10]උදෙනා අරැණු ඇත්හු [11]වරා ජව ඇතිකොටැ ජැවවූහු; **පරිවත්තෙත්වා**, කියා; **සද්දං අසුණන්තො විය**, වෙණහඬ නොඅසනුයෙන් පලන තතු ඇතක්හු සෙයින් යන අභිප්‍රායි. **බලකායො ඔහීයි**, උදෙනා සෙනඟ පසුවී; **ගණ්හිත්වා**, ජීවග්‍රාහයෙන් ගැනැ; **අමිත්ත වසංගත භාවං**, සතුරැ රජහු විසියට ගිය බවු; **බහි**, නුවරින් බැහැරැ; **එකස්මිං චොරගෙහෙ**, සොර ගෙකෙක්හි—ජඟහරුවන් හුන් යම් ගෙකොක්ද [ඒ] සොරගෙ නම්වේ. **ජයපානං**, ජයලදුවන් බිය යුතු පනු—වෙදයෙහි කියූ [12]විධීන් බොන පාන විශෙෂයෙක් යෙත්. සක්හු **අසුරන්** දිනැ ජය

1 පරෙ. 2 විංසස. 3 පජ්ජෝවා. 4 වැනූ බැවින්. 5 සැඩපජෝතහු. 6 උදෙන ගණිමින්, උපාංද තැගණම්න්. 7 හතැයි, හතැයි. 8 ඒ ඇජරන්. 9 නුහුබදු, නුහුබන්. 10 උදෙනා. 11 වරාවෙ. 12 විසියින්.

පාන බොන සැඳැ [1]පෙලෙවැ හුණු පාන බිඳුයෙක්හි අරළු රික් හැපිය යෙත්. **එවරූපො නෙ කිර මනෙතාසී** හැත් කත් මතුරු සඳහාය් කියා. **ගණ්හන සමයෙන,** ගණන ලුව සරින්. 'සමයෙන ගණ්හාමි' යුවහට 'කිං ත්වං මං වඤ්චසසි' යි. **රාජාණං,** රජ අඬ—රජක්හු නිගතයුතුවක්හට වැජැරිය යුතු [2]නිගා; **සූරගජ්ජිතං,** ශූර ගජිනා; **පිඨසප්පිවා,** [3]පිළිසෙවා; **සඛකුඤි,** ශෙවත කුස ඇතියේයයි සේයි; **සළුවහරණ හයෙන,** සළුව කරන බියෙන්—සසග කරන බියෙන යුසේයි. **අරෙ ඛුජ්ජ,** අළෙ කුදු; **අති ඔහලොඨකපාලං තෙ මුඛං,** ඉතා බොල් ඔට හා කපොල් ඇතියෙකැ තීමුව—ඔට මස් කපොල් බොලින් මුව [4]නොපිරිවැපියහෙයි යන අභිප්‍රා[යි]. **සාණිකණ්ණිකං,** කඩතරා කන්; **සිප්ප ගහණං,** සිප් ගැනුම්. සිප් නම් මෙ මතුරෙහි සහවා වෙණ වැයීම්. **නිසිකං නාම,** නිම්යේ නම්—සෙළෙක් මතු ලුවසර වස් තුබූයේ යන අභිප්‍රායි. **අථ කිං අම්ම**—'අථ' යන [5]අධිකාරාර්ථහි—දූන් කිම අමම—සිප් ගහණ [6]අධියරු නිමි බැවින් මතුයෙහි කළ වටනක් කිය යුසේයි. **ඉදං කිං අම්ම,** මෙ කුමට්ය අම; **තාරකා සඤ්ඤාය,** තරු සලකුණෙන්—කිසි තරුවක් නැගි කල යු තැන්. **හත්ථගතං කරිංසු,** අත් ගිය කොළෝයි—දෙර අරුවයි කියා [7]පුණුස්වාය් තුබූහු. [8]**කරෙණුකා,** ඇතිනියක්; 'මුඤ්ජකෙ සීව' යන තැන 'යොජනා' යනු යොජන්නේ. **මාරෙන ආවට්ටිකතනා,** මරනු විසින් අවුළුවන ලද බැවින්—තුමා අභිමුඛකොට වටනලද බැවින්—තුමා [9]විසිහිවනලද බැවිනැ යුසේයි. මර කිසෙසින් [10]ආවට්ටන කෙරෙයි යත්—ඇතැම්හු නොලගරහු සෙයින් [11]වෙරළු බුමුසි යෙත්. ඇතැම්හු නොමි සැම [12]අවස්මර සෙයින් විකිරිය කැරළු යෙත්. ඇතැම්හු බිරම් රූ දක්වා සිත් සැති පෙරළා තුමා· ඇවි ඇවියෙහි වත්වා යෙත්. **එකසිකඛඬපි,** එකගෙකතජ් බික—නොහොත් එක් [13]කෙණෙසි පමණකුජ් බික; **යථා ධොතෙන පතෙතන,** යථා දෙව් පයින්—සිස් පයිනැයි සේයි; **වො,** [14]තුප විසින්; **ලභනාකාරං,** ලබන කරුණක්; **අධිමුච්චිත්වා,** බිම්සැ; **චරිත්වා,** සැරු; **සම්පන්න වෙගතරො,** පිරියුණු වේ ඇතියේ; **ගදනතං,** බුමන් ගත්හු; **අත්තනො භොජනසස,** තුමහට යුතු බොජනෙන්—පූරණාර්ථහි සාමිවචන; **පච්චපතිසිතෙන,** පස පිහිටියෙන්; **වෙලා,** බිජියයුතු කල්; **උපකඩා,** [15]ගළවනු

1 පෙළෙව. 2 නිසා. 3 පිළිරෙවා. 4 නොපිරිවැහෙයි. 5 අධිකාරහසාරයි. 6 අධියර. 7 පුණුස්වය් කියා. 8 කණෙරුකා. 9 විසඟි, විසිගි. 10 ආමටට. 11 වෙරු. 12 අවස්මරණ. 13 කෙණෙසි. 14 තොප විසින්. 15 නළවනු වට, තාගලමූවම, නාගළවනුවට.

වට අසන්; නොහොත්—**වෙලා,** නොබිජීයයුතු කල්; **උපසඞ්ඛා,** [1]පැමිණෙනුවට අසන්; **තුම්හෙහි දිට්ඨධම්මස්ස,** තුප විසින් දක්නාලද ලොවුතුරා ධම්හ; **ඉච්ඡිතං,** ඉස්නාලදු; **පත්ථිතං,** පතනාලජ්—ඉස්නා ලද්දුනම් වුව මැනවැයි සිතනාලදු. පතනා ලද්දුනම් වේවයි පතනාලද. **තුය්හං සමිජ්ඣතු,** තට ඉජිවා; **සබ්බේ සඞ්කප්පා [පූරෙන්තු],** හැම [2]මනා කප්හු පිරෙත්වා; **චන්දෙ පන්නරසො යථා,** පන්නුරසි සඳ සෙයින්; [3]**මණිජොතිරසො යථා,** ජොතිරස් නම් ඇති මිණි සෙයින්. 'ජොතිසො රසන්ති විස්සරන්ති එතස්මාති ජොතිරසො'—සම්සෙයින් ජොතිරස්මිණි රස් කලබින් පිරියුණු [ද] එසෙයින්ම පිරෙත්වා සි යුසේසි. **සබ්බකාම දදං,** [4]සව්කම්දු—කැමැති තා දෙනුයෙහි පොහොසත්; **චතුප්පසිබ්බකො,** සම් පිහිවාවන්; **හිරඤ්ඤ සුවණ්ණස්ස**—පූරණාර්ථයෙහි සාමිවචන—**හිරඤ්ඤ** නම් [5]කහවුණු; **සුවණ්ණ** නම් රත්රන. **අනෙන පූර පාලා,** ඇතවුරු රක්නානු—හල දෙර කැමියෝ; **පාතෙසි,** [5]කහවුණු හෙළි; **උච්චිනිත්වා,** හවුලාගෙන; [6]**පපඤ්චානානං**—අනාදරයෙහි සාමිවජන්. **මාගන්දියා නාම,** මාගන්දිය නම් බැමිණි දුවක්; **අභිරූපා,** රුවැති; **දෙවච්ඡර පටිභාගා,** [7]දෙව සරන් හා [8]එකතුලස්; **මය්හං ධීතු,** [9]ම දුවට; **තාපෙත්වා,** රොජා—බැවියැ යූ සේසි; **අනාගාමි ඵලූපනිස්සයං,** අනාගැමි ඵලට හේ; **බහිනිගමෙ,** බිහි නියම්ගම්හි; **අග්ගිපරිචරණට්ඨානං,** අගහොතුරු කරන තැන්; **රූපසම්පත්තා,** රිවුහි කොලපත්. 'ඉමස්ස දස්සාමි' යි යොජනු. **සඞ්ඛුනි,** සිලි—කමත් පිහා [10]එලි පෙලහැර බලනුවට නිකාත් යි සේසි. **පද චෙතියං,** [11]බුමනිය යුතු බැවින් පදමෙ පද චෙතිය නම් වේ; **අධිට්ඨහිත්වා,** පැණේවයි ඉටා; **වෙරම්බවාතා,** වෙරඹුවා—අහස යොජනෙන් මතුයෙහි හමනා වය යෙත්; **සලක්ඛණ මන්තානං [තිණ්ණං වෙදානං],** සලක්ෂණ මන්ත්‍රයන් හා සමඟ තුනු වෙදයන්—**ලක්ෂණ** මන්ත්‍ර නම් මහා පුරුෂ ලක්ෂණ කියූ දෙලොස් දහසක් ග්‍රන්ථය යෙත්. **රත්තස්ස පදං,** රා අධිනු පිය; **උක්කුටිකං භවෙ;** මැදින් උස්වේ—පතුල් මැද [12]වළ වන බැවින් පියවර උස් වේ; **දුට්ඨස්ස පදං,** දෙස් අධිනු පිය; **අනුපීළිතං භවෙ,** සුලාක් පිය ඇගින් [13]හැසි වේ. [14]දෙස් සිරිහු [15]පෙරටවැ පල්වා ඔබා ඇක්මෙන බැවින් පිය [15]පෙරටවැ හැසී පිය ඇගින් එබී පැනෙයි සේසි. **මූළ්හස්ස පදං,**

---

1 පැමිණීනුවට. 2 මනා සකප්හු. 3 මණ්ජොතිරසො නම් ඇති මිණියෙක්. 4 සව්කම්දු. 5 කහවණු. 6 පංඤ්චානා. 7 දෙවසුරන්. 8 එකතුලරස්. 9 මුතදුවට. 10 පලි. 11 තුමනිය. 12 උස්. 13 ගැසි. 14 දෙස්. 15 පෙරටව.

මොහු සිරිහු පිය; **අවකඩ්ඪිතං**, [1]පිය මුලට අදනා ලද්‍ද වේ. **විවත්තච්ඡද්දස්ස ඉදම්දිසං පදං**—**ඉදං** යනු පද පූරණයි නිපා—කෙලෙස් නැහුවක්හු මෙබඳු පියවේ. [2]තිමිත් හුණු සක් ලකුණෙන් සැදී තෙ ධා දිස්නා පිය වෙයි සේයි. ‘උදක පාතිසං කුමසීලෙ’ ‘පසසනසීලා’ යි යොජනු. දිය [3]පැයි කිඹු ලන් දක්නාක්හු ගෙමැද සොරුන් සතප්නා දක්නාක්හු නොම ඇතියක්හු ඇති දක්න සෙයින් පස්කම් ගුණ [4]වලජනු වක්හු පියෙයි දන්හි යන අභිප්‍රායි. **එකං කාරණං**, එක් ලූපක හෙතුවක්—මහාභිනික්මන්හි පටා කුමාරිකා පලො භන [5]අවසන්කොට [6]ඇතිනාවත් තුමන් පස්කම් ගුණ [7]නො වලඳන බවට [8]කපක් කොටැ දැක්වූහු. **කුමාරිකා වණ්ණා දීඝි**—ආදි ගහණින් මජ්ඣිමවණ්ණහා වයොවුඪවණ්ණ ගත්හු. **පයොජිතං පලොභනං**, කරනලද නැළවීම්. **දිස්වාන තණ්හං අරතිං රගඤ්ච**, තණ්හා අරති රාග යන මේ තුනු අප් සරසුන් දැකද; **ජඤ්ඤෙ අපි මෙථුනස්මිං**, මෙවුන් ධම්හි සඳ මතුයෙකිජු; **කිමෙ විදං මුත්තකරීස පූණ්ණං**, දෙතිස් කොට සින් පිරුණු මෙ [9]කිරිසවුළු දැකැ කවර කරුණෙන් මෙවුනෙහි සඳ වේද? අප් කොටැස්හි එසන් මූත් හා [10]පළවි කොටැස්හි එසන් කරීස ගහණින් සෙසු [අ]ප් කොටැස් හා [11]පළවි කොටැස් ගතුවෙත්. **පාදා**, කරණාජීහි පසුවම්. **තං**, කළෙබරං. ‘මාගන්දියා පිබො ආසාතං බන්ධි’ යන සබඳ. **ජාති කුල පදෙස භොගවය සම්පන්නි**—ජාති නම් බමුණු ජැය; **කුල පදෙස** නම් [12]මා [ගන්දි] කුලෙයි [13]පහළ කුල [14]කො මැස්. නොහොත් **කුල** නම් [15]මාගන්දි කුල; **පදෙස** නම් [16]උතුම[න්] උපජන මැඳුම් පියෙස්; **භොග** නම් ඒ කුලෙයි ඇති [17]සැපත්; **වය** නම් පසළොස් [18]හැවිරිජි විය. **තථා රූපං**, ජාති කුල පදෙස භොග වය සපුවයෙන් [19]එසේ බඳු; **ආසාතං**, ‘අනත්ථං මෙ අචරි’ යන අගා; **පච්චජා පෙසවා**, ප්‍රුණුස්වා; **දියඩ්ඩ සහස්ස නාටකිත්ථි පරිවාරා**, යෙළ දහසක් නළුවරන් පිරිවර ඇති; **උපකණ්ඨෙ වස්සූපනායිකාය**, අසන් [20]වසෙළබීමෙහි; **වස්සාරතෙන**—වස්ස ශබ්ද වසන් [කියා]. **රතන ශබ්ද** [21]සෘතු කියා—[22]අකාර [23]වෙළිජි [24]දික්වූ—වසන්

1 මුපිය මුලට. 2 නිම්ස්. 3 පය. 4 වජනුවක්හු. 5 “අවසන්කොට” යන් තෙක් පටන් ‘පයොජිතං පලොභතං’ යන්න දක්වා පාඨය අපට ලැබුණු එක පොතක පමණක් පැනේ. 6 ඇතිනා පත්තුමන්. 7 නොව උදන බවට. 8 මෙය විමසිය යුතුයි 9 කිරියවුළු, කියවුළු, කියඩවුළු. 10 පළම්. 11 පළවීරකොට. 12 මරි කුලෙයි, සිමං කුලෙයි. 13 පැළ. 14 කුටැස්. 15 මැය ගන්දි. 16 උතුමං යසසුන්. 17 සපත්. 18 හැවිරිදි. 19 එසබඳු. 20 වසළෙ බිමෙයි, වසළෙමිවෙහි. 21 භගරු, සෘතු. 22 අවකාර, ආකාර. 23 පාවලිජ, පාවළිජ. 24 මික්වූ.

යු සේයි. **උය්‍යොජෙසුං,** යවූහු; **අඩ්ඪමාසෙ,** හිමත් ගිමන් අම් මස්හි; **අරඤ්ඤායතනෙ,** අරණ ආනෙහි—අරණමෙ තරු ගුල්මාදීනට සංජාති සදෙස වන බැවින් අරඤ්ඤායතන නම් වී. **ඔරමත්තිකා,** [1]අලුප් පමණ ඇතියක්—[2]මඳ අත් හවු ඇතියක් යු සේයි. **මහෙසක්ඛො,** මහානුභාවෙන; **සාධු වතස්ස,** සුන්දරං වතසියා; **සායමාසං,** සවස්හි කෑ යුතු බත්; **පණ්ණොදනං,** නැළියක් සැඩෙලෙහි බත්; **සූපං,** උදු [3]මුගුහු; [4]**බ්‍යඤ්ජනං,** බැජුන්; **එහපායිනොපි දාරකො,** එන පා දරුවනුදු—කිරි බොන දරුවනුජ් යි සේයි. **මුඛං විකඩ්ඪාලෙත්වා,** මියෙහි ලැගි අමිස් පියවනුව වස් මුව විසල්වා; **චතුමධුරං,** සප්පි නවනීත මධු සක්ඛරා; **ද්වත්තිංසාකාරං,** 'අත්ථි ඉමස්මිං කායෙ කෙසා' යන ඈ ද්වත්තිංසාකාර පාළි. 'ඉදානි උපොසථඞ්ගානි අධිට්ඨහන්තා උපඩ්ඪුපොසථ කම්මං ලභිස්සති' යන සබඳ. **උපොසථඞ්ගානි,** උපොසථ නියමෙන සමාදාතබ්බ සීලානි; **උපඩ්ඪුපොසථ කම්මං,** අඩ පෙහෙකම්—'ඉමං ච රත්තිං ඉමං ච දිවසං' යි සමාදන් වියයුතු උපොසථ සීල 'ඉමං ච රත්තිං' යි සමාදන්වූ සිල් බැවින් උපඩ්ඪුපොසථ නම් වෙයි. දිවාභාගයෙන් [5]අඩක් ඇතිසඳ සමාදන් වුව හොත් උපඩ්ඪුපොසථ නම් [6]නොවේ. 'අභුඤ්ජිත්වා මුඛං විකඩ්ඪාලෙත්වා' යු බැවින් විකල්හි [7]වළඳා සිල් සමාදන් වුව හොත් පෙහෙවියා නොවේ—සිල් රැකියා වේ මතුව යෙති—හේ නො යෙජේ. 'උපොසථඞ්ගවසෙන සමාදියිස්සාමි' යි සමාදන්වූ සිල් [8]උපොසථකම් හා ගෙනැ [9]රැවූ බැවින් උපොසථ කම්ම නො දුරුවත් උපොසථ නාමයෙන් ගත් සිලිදු [10]නොරැවන බැවින්. ඔසඳන හා මල් පැළඳ සමාදන්වනුවහට මාලාදී විරති සිබජ් රඟ බී සිට සමාදන් [වනුව] හට සුරාපාන සිබජ් රන් පැළඳ සිට සමාදන් වනුවහට ජාතරූපාදී සිබජ් පොහො[ය]ඟ විසින් රැකෙන සෙයින් විකල් [11]වළඳා සමාදන් වූවාහට විකල් සිබ පොහොයඟ සෙයින් රැකෙයි ගන්නේයි. එසේහොත් 'අභුඤ්ජිත්වා මුඛං විකඩ්ඪාලෙත්වා' යි කුමට කියූ හයත්—චතුමධුර පූතිමුත්ත දෙජෙ එක් මෙ රොවට පිළියම් හොතුජ් චතුමධුර තබා පූතිමුත්තයෙන් පිළියම් කළ [12]මහණහු මෙ වඩා අපිසේ යු බැවින් [13]ධම් දෑයදූ සුත්හිමෙ බුත් ඉතිරි බත් බිජෑ මහණුවම් කළහු වරය් නොබිජෑ මහණුවම්

1 අමුක් පමණ. 2 මඳා ඇත්හැවු. 3 මුග්ගුහු. 4 බ්‍යංජනං රස, විඤ්ජනං බැජුන්. 5 වඩක්, වැඩක්. 6 වේ. 7 වළඳනා. 8 'උපොසථකම් හා ගෙන රැවූ මින බැවින් උපොසථකම්ම නොදුරුවූන බැවින් උපොසථකම්ම නොදුරුවූන්' යි ඇතැම් පොත්වල ආ සාඨයි. 9 රැවූමින, රැව්මින, රැවූන් බැවින්. 10 නොතවන බැවින්. 11 වළඳන. 12 මහණහු මෙ වඩ අපිසේ. 13 ධම් දෑ සුතත් මබූත්,

[1]කොළෙ වැඩිය යුසෙසින් විකල් වළඳය් පෙහෙවුවනු වරා නොවළඳයැ පෙහෙවු මෙ වැඩියයි දක්වනුව වස් කියූවෙන්. **සොත්තං බන්ධිත්වා සොත්ත කොට්ඨිසං ගහෙත්වා පරිවත්තන්ති,** [2]යට පෙළෙ වහල් නැති බැවින් රැහැණක් උඩ බැඳ රැහැණ කෙළෙ ගෙන පිරිවැටේ; **උක්කාසි,** [3]දුඹු වැටින්; **අභිභාසං අඵාසුකං නත්ථි තවං බාධෙන්ති** යනු අඵාසු නැතිව, [4]කැයෙන් පෙහෙඩම් නොබිඳෙතුජ් පෙහෙඩම් උකටකොට රක්නනු පිළිවෙත් දක්වනු පිණිස කීහු. **උපඩ්ඪ කම්මම්පි මෙ විකාලං මා අහොසි** යනු තුමා ශාසන සමය නොදන්නා බැවින් පෙහෙඩම් නොරැකෙයි හැඟැ කියා. **මිලාන මාලා විය කාලං කත්වා** යනු ජීවිතෙන්ද්‍රිය පියූ සිරුරැ වන ගඳ [5]පියු මිලි කසළ මෙ වැනි බැවින් කියූහු. **බුද්ධමාමකො,** බුදුනු මමෙ යන ගහණ ඇතියේයි; **අඤ්ජලිමපග්ගය්හ,** බුදු ගැවුරෙන් ඇජිලි හුවා; **අනෙකෙසු කප්ප සතසහස්සෙසු අස්සුත පුබ්බං** යනු පෙර බුදුන් සස්නෙහි කළ [6]අභිනිහරැ එජයැ තුමනට නොපාළ බැවින් කියත්. **කෙනාසි** යනු හෙතුවහීසි—යම් කරුණෙකින් බුදුහු ලෙවුහි උපන්හ ඒ කරුණෙන යු සේයි. **පරිවච්ඡං කත්වා,** පාථෙය්‍යං සජ්ජං කත්වා—පාථෙය්‍ය පිළිවෙල කොටැ යු සේයි; **ඉද්ධිමය පත්ත චීවර ධරා,** ඉධයෙන් නිවැත් පාසිවුරැ ධැරැවනු. අච්ඡාදන සඳහා දියයුතු වත් [7]වත්ථච්ඡාදන නම්. **සුඤ්ඤාගාරෙ,** විවිත් සෙනස්නෙහි—ඉත්ථි පුරිසාදී සම්බාධ නැති සෙනස් නෙහිය යු සේයි. **අභිරමන්තං,** සුඤ්ඤාගාරහි අභිරමන බවු ජන්නලදි—සුඤ්ඤාගාරහි වසනසේ දැකැ එව් සුඤ්ඤාගාර [8]පිළිසංයුතු ධැම් කියා අසා එව් 'සුඤ්ඤාගාරෙ ඛො තථාගතා අභිරමන්ති' යන වචනයෙන් එව් ජන්නා බැවින් කියත්. **අම්හෙහි පහිත සාසනෙනාගතත්තා වට්ටති** යනු අප වෙහෙර කළ කල එව යන අභිප්‍රායෙන් කියූහු. **පච්ඡා දෙසි,** [9]පිළියෙළ කොළේ; **පරිවෙසනාය,** සපයනුයෙහි; **අනුමොදන කරණත්ථාය,** අනුමෙවුනී බණ කියනු සඳහා—තමා කළ පින් කිරියයෙහි අනුසස් අසා තුස්නේ අනුමොදන නම්. එසට හේ ධම්දෙසුන් අනුමොදන කරණ නම්. සැතපී ගෙහි බණ ඇසියපින් බණ [10]කියනෙයි [11]පා ගහණ කරනු බුදු කැලි වළඳජෙන බැවින් "පත්තං අග්ගහෙසි" යූහු **කිලිට්ඨ කම්මං,** කිලුටුකම්—දූස්මෙනෙය යු සේයි. **එතදග්ගං,** මෝ [12]අගි—එසා අගා. **බහුස්සුතානං,** ආගම බහුසුවන් කෙරෙහි;

---

